

# පට්ඨානුද්දේසදීපනිය

# පට්ඨානුද්දෙසදීපනිය

අග්ගමහාපණ්ඩිත

ලේඩී සෙයාඩෝ

මහතෙරුන් වහන්සේ විසින්

කෘත යි.

බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය

ස්ථවිරයන් වහන්සේ විසින්

සිංහලයට නඟන ලදී.

පට්ඨානප්පකරණයේ

පච්චයුද්දෙස පච්චයනිද්දෙස

සහිත යි.

ප්‍රථම මුද්‍රණය 1962 දෙසැම්බර්.

# හැඳින්වීම

මැතෙක බුරුම රටැ වූ පඬිවරුන් අතුරෙහි **ලෙඩිසි සෙයාඩෝ** නමින් ප්‍රකට තෙරණුවෝ තෙවළා දහම්හි දැනුම අතින් අක් තන්හි සිටියෝ ය. ඔබ රැසැයූ පොත් පත් බොහෝ යැ. බුදු දහමැ ගැඹුරු ම තැන් ලිහිල් කොට විසඳු කීමෙහි මෙ තරම් සමත් කෙනෙක් මැතෙක පහළ නො වූහ. මේ තෙරුන් රැසැයූ පොත් අතුරෙන් **පට්ඨානුද්දෙසදීපනිය** ප්‍රස්ථානප්‍රකරණය උගන්නවුනට එයට ලෙහෙසියෙන් බැසැ ගන්නට විවැරූ දොරක් වැන්නෙකි. පළමුවෙන් එය හදැරා එයට පසු ප්‍රස්ථාන-ප්‍රකරණය කියවතොත් එහි බොහෝ ගැඹුරු තැන් පහසුවෙන් තේරුම් ගත හැකි වෙයි. විජම් හදැරන දුහුනන් ගේ වැඩ තකා එය සිංහලයට නගා මෙසේ පළ කරවම්හ.

විශ්වවිද්‍යාලයාදියෙහි උපරිම පඞ්ක්තිවල දහම් උගන්නා සිසුන් ගේ ප්‍රයෝජනය පිණිස පඨානපපකරණයේ උද්දේස නිද්දෙස දෙක ද මෙයට උපග්‍රන්ථයක් වශයෙන් භාවයක් සහිත ව යා කළම්හ.

මෙයට,

**බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය ස්ථවිර**

ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්ව විද්‍යාලයය,
ගංගොඩවිල,
2505 ඉල් පුර පසොළොස්වක්
කුජ දිනැ දී යැ.

# විෂයානුක්‍රමණිකා


| | | පිට |
|---|---|---|
| | ප්‍රත්‍යය සූවිස්ස | 5 |
| 1. | හේතුප්‍රත්‍යය | 5 |
| 2. | ආලම්බනප්‍රත්‍යය | 10 |
| 3. | අධිපතිප්‍රත්‍යය | 12 |
| 4. | අනන්තරප්‍රත්‍යය | 17 |
| 5. | සමනන්තරප්‍රත්‍යය | 20 |
| 6. | සහජාතප්‍රත්‍යය | 22 |
| 7. | අන්‍යෝන්‍යප්‍රත්‍යය | 24 |
| 8. | නිඃශ්‍රයප්‍රත්‍යය | 25 |
| 9. | උපනිඃශ්‍රයප්‍රත්‍යය | 27 |
| 10. | පුරෝජාතප්‍රත්‍යය | 33 |
| 11. | පශ්චාජ්ජාතප්‍රත්‍යය | 34 |
| 12. | ආසේවනප්‍රත්‍යය | 35 |
| 13. | කර්මප්‍රත්‍යය | 37 |
| 14. | විපාකප්‍රත්‍යය | 39 |
| 15. | ආහාරප්‍රත්‍යය | 41 |
| 16. | ඉන්ද්‍රියප්‍රත්‍යය | 43 |
| 17 | ධ්‍යානප්‍රත්‍යය | 46 |
| 18. | මාර්ගප්‍රත්‍යය | 47 |
| 19. | සම්ප්‍රයුක්තප්‍රත්‍යය | 48 |
| 20. | විප්‍රයුක්තප්‍රත්‍යය | 50 |
| 21. | අස්තිප්‍රත්‍යය | 50 |
| 22. | නාස්තිප්‍රත්‍යය | 51 |
| 23. | විගතප්‍රත්‍යය | 51 |
| 24. | අවිගතප්‍රත්‍යය | 51 |
| | ප්‍රත්‍යයසභාගසංග්‍රහය | 53 |
| | ප්‍රත්‍යයඝටනාව | 56 |
| | පට්ඨාන-ශබ්දාර්ථ | 70 |
| | පට්ඨානප්පකරණ (පච්චයුද්දෙස නිද්දෙසා) | 75 |

# පට්ඨානුද්දෙසදීපනිය

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස**

ඒ භගවත් අර්හත් සම්‍යක් සම්බුඩෝත්තමයන් වහන්සේට නමස්කාර වේ වා!

## ප්‍රත්‍යය සූවිස්ස

හේතුප්‍රත්‍යය, ආලම්බනප්‍රත්‍යය, අධිපතිප්‍රත්‍යය, අනන්තරප්‍රත්‍යය, සමනන්තරප්‍රත්‍යය, සහජාතප්‍රත්‍යය, අන්‍යෝන්‍යප්‍රත්‍යය, නිඃශ්‍රයප්‍රත්‍යය, උපනිඃශ්‍රයප්‍රත්‍යය, පුරෝජාතප්‍රත්‍යය, පශ්චාජ්ජාතප්‍රත්‍යය, ආසේවනප්‍රත්‍යය, කර්‍මප්‍රත්‍යය, විපාකප්‍රත්‍යය, ආහාරප්‍රත්‍යය, ඉන්‍ද්‍රියප්‍රත්‍යය, ධ්‍යානප්‍රත්‍යය, මාර්‍ගප්‍රත්‍යය, සම්ප්‍රයුක්තප්‍රත්‍යය, විප්‍රයුක්ත-ප්‍රත්‍යය, අස්තිප්‍රත්‍යය, නාස්තිප්‍රත්‍යය, විගතප්‍රත්‍යය, අවිගත-ප්‍රත්‍යය යැ යි ප්‍රස්ථානප්‍රකරණයෙහි එන ප්‍රත්‍යයයෝ සූවිසි දෙනෙකි.

## 1. හේතුප්‍රත්‍යය

**හේතුප්‍රත්‍යය නම් කවර යැ?**

ලෝභය, ද්වේෂය, මෝහය, අලෝභය, අද්වේෂය, අමෝහය යන මොහු සදෙන **හේතුප්‍රත්‍යය** නම්හ.

**හේතුප්‍රත්‍යයයා ගේ ප්‍රත්‍යයෝත්පන්න ධර්‍මයෝ (හේතු ප්‍රත්‍යයයෙන් පහළ වූ දෑ) කවුරු ද? යත්**:-

ලෝභසහජාත වූ චිත්තචෛතසිකයෝ ද රූපකලාපයෝ ද, ද්වේෂසහජාත වූ චිත්තචෛතසිකයෝ ද රූපකලාපයෝ ද, අලෝභසහජාත වූ චිත්තචෛතසිකයෝ ද රූපකලාපයෝ ද, අමෝහසහජාත වූ චිත්තචෛතසිකයෝ ද රූපකලාපයෝ ද යන මොහු හැම හේතුප්‍රත්‍යයයෙන් උපන් (හේතුප්‍රත්‍යයෝත්පන්න) ධර්ම නම් වෙති.

මෙහි උඩ දැක්වුණු **සහජාතරූපකලාප** යනු සහේතුක ප්‍රතිසන්ධික්ෂණයෙහි උපන් කර්මජ රූපයෝ ද ප්‍රවෘත්ති කාලයෙහි උපන් සහේතුක චිත්තජ රූපයෝ ද වෙති.

මෙහි **ප්‍රතිසන්ධික්ෂණය** යනු ප්‍රතිසන්ධිචිත්තයේ උත්පත්තික්ෂණය යි.

**ප්‍රවෘත්තිකාලය** යනු ප්‍රතිසන්ධි චිත්තයේ ස්ථිතික්ෂණය පටන් කොට ච්‍යුතික්ෂණය තෙක් වූ මේ සියලු අතර කාලසීමාව යි.

**කවර අරුතෙකින් හේතු නම් වේ ද? කවර අරුතෙකින් ප්‍රත්‍යය නම් වේ ද? යත්**:

මූලාර්ථයෙන් (මූලය යන අර්ථයෙන්) **හේතු** නම් වේ. උපකාරකාර්ථයෙන් (උපකාර කරන්නා ය යන අර්ථයෙන්) **ප්‍රත්‍යය** නම් වේ. ඔවුන් අතුරෙන්, මූල යමකයෙහි දැක්වුණු ලෝභාදි මූලධර්මයන් ගේ මූලභාවය මූලාර්ථ නමි. එය **මූලයමකදීපනියෙහි** අප විසින් වෘක්ෂෝපමාවෙකින් දක්වන ලද්දේ ය. තව උපමාවෙක් මෙහි ද දැක්වේ.

මිනිහෙක් ගැහැනියක කෙරේ පිළිබඳ සිතැත්තේ වේ. ඈය කෙරේ බැඳුණු සිත නො හරින තාක් ම ඈය අරමුණු කොට, ඔහු සතන්හි ලෝභසහජාත කායවාඞ්මනඃ කර්මයෝ ද, ලෝභසහගත සිතින් උපදනා චිත්තජ රූපයෝ ද බොහෝ කලක් පහළ වෙති. ඒ සියලු චිත්තචෛතසිකයෝ ඒ

සත්‍රිය කෙරේ ඇලීම වූ ලෝභය මුල් කොට ඇත්තෝ වෙති. ඒ ලෝභය ඔවුනට මුල් වූ බැවින් හේතු ද වේ. ඔවුන්ගේ පහළ වීමට උපකාරී වූ බැවින් ප්‍රත්‍යය ද වේ. මෙසේ ලෝභය හේතුප්‍රත්‍යයෙකි. (හේතු වූත් ප්‍රත්‍යය වූත් ධර්මයෙකි.) සිත ඇදෙන අන් දෑ අරමුණු කොට ද ඒවා කෙරෙහි ඇලීම් වශයෙන් උපදනා ලෝභයන් ගේ ද හේතු-ප්‍රත්‍යයභාවය උඩ කී නයින් ම දත යුතු.

අප්‍රිය දෑ අරමුණු කොට ඒ අරමුණෙහි රිදීම් කිපීම් නොරිස්සුම් වශයෙන් උපදනා ද්වෙෂයන් ගේ ද, මුළාවට කරුණු වූ අරමුණෙහි මුළා වීම් වශයෙන් උපදනා මෝහයන් ගේ ද හේතුප්‍රත්‍යයභාවය ලෝභයට කී නයින් ම දත යුතු.

රුකේ මුල්හු තුමූ පොළොවෙහි මොනොවට පිහිටා සිට පෘථිවිරසය ද ආපෝරසය ද ගෙන රුක අග දක්වා ම එළවත්. එයින් රුක බොහෝ කල් වැඩෙමින් සිටී. එ පරිද්දෙන් ම ලෝභය ද ඒ ඒ අරමුණෙහි ඇලීම් විසින් මොනොවට පිහිටා සිට ඒ අරමුණෙහි ප්‍රියරූපතාරසය ද (ප්‍රිය බව ද) සාතරූපතාරසය ද (මිහිරි බව ද) ගෙන සම්ප්‍රයුක්ත ධර්මයෙහි කායවාග්ව්‍යතික්‍රමය තෙක් ම එළවයි. කායව්‍යතික්‍රමයට හෝ වාග්ව්‍යතික්‍රමයට පමුණුවයි.

ද්වෙෂය ද අරමුණෙහි රළු ලෙස ගැටීම් වශයෙන් (රිදීම් කිපීම් විසින්) අප්‍රියරූපතාරසය ද අසාතරූපතාරසය ද ගෙන සම්ප්‍රයුක්ත ධර්මයෙහි කායික හෝ වාචසික ව්‍යති-ක්‍රමය තෙක් ම එළවයි. මෝහය ද මුළාවීම් විසින් නානාවිධ අරමුණුවලැ නිරර්ථක චින්තාචාරරසය වඩා, සම්ප්‍රයුක්ත ධර්මයෙහි කායික වාචසික ව්‍යතික්‍රමය තෙක් එළවයි.

මෙසේ ලෝභාදි ධර්ම තුන සිත් ඇලීම් ආදියට කාරණ වූ ප්‍රියරූපාදි වස්තූන්හි සම්ප්‍රයුක්ත චිත්ත-චෛතසිකයන් ප්‍රමුදිතයන් බඳු කෙරෙමින් බොහෝ කල්

පවත්වත්. සම්ප්‍රයුක්ත ධර්මයෝ ද එසේම ඒ අරමුණුවලැ එල්බැ පවතිත්. සම්ප්‍රයුක්ත ධර්ම පවත්නා කල්හි සහජාත රූපකලාපයෝ ද එසේ පවතිත් ම ය.

මෙ උඩ දැක්වුණු විස්තරයෙහි **'සම්ප්‍රයුක්තධර්මයෙහි එළවයි'** යනු ප්‍රියරූපතා සාතරූපතා රස දෙක සම්ප්‍රයුක්ත ධර්මයන් වෙතට පමුණුවයි' යන්න හැඟැවීමට කියන ලදී.

කුශලපක්ෂයෙහි - ඒ මිනිස් තෙම යම් විටෙක කාමයන්හි දෙස් දක්නේ ද, එ විට යථෝක්ත ස්ත්‍රිය කෙරෙහි පිළිබඳ සිත දුරු ලයි. ඇය කෙරෙහි නොඇලෙන බව ඔහු සතන්හි පහළ වෙයි. පෙර යම් විටෙක ඇය අරමුණු කොට ලෝභමූලක වූ අශුභ කායවාඞ්මනඃකර්මයෝ පහළ වූහු නම්, දැන් ඇය අරමුණු කරන වේලෙහි අලෝභමූලක ශුභ කායවාඞ්මනඃ කර්මයෝ පහළ වෙත්. පැවිදි-සිල් හෝ ධ්‍යානපරිකර්ම හෝ අභිඥාධ්‍යාන හෝ පවත්නාහ. ඒ කුශලධර්මයනට අලෝභය මුල් වෙයි. ඒ කරුණින් එය හේතු ද වේ, උපකාරී බැවින් ප්‍රත්‍යය ද වේ. මෙසේ මෙහි ලා අලෝභය හේතුප්‍රත්‍යයධර්මයෙක් වෙයි. සෙසු අවස්ථාවල ද ලෝභයට සතුරු වැ පහළ වන අලෝභයන්හි ද, ද්වේෂයට සතුරු වූ අද්වේෂයන්හි ද, මෝහයට සතුරු වූ අමෝහයන්හි ද හේතුප්‍රත්‍යයභාවය මේ නය අනුව දත යුතු.

මෙහි අලෝභය රුක් මුල් මෙනි. ලෝභනීය වස්තූන් කෙරෙහි ලෝභය දුරු ලා, ලෝභවිවේකසුඛරසය වඩා, ඒ සුවයෙන් සම්ප්‍රයුක්ත ධර්මයන් මුදිතප්‍රමුදිතයන් මෙන් කෙරෙමින් ධ්‍යානසමාපත්තිසුඛය තෙක් හෝ මාර්ගඵල-සුඛය තෙක් හෝ එය (ඒ සුව රසය) වඩාලයි. එසේ ම අද්වේෂය ද ද්වේෂයට කරුණු වන වස්තූන්හි ද්වේෂවිවේක-සුඛරසය වඩා, අමෝහය ද මෝහනීය වස්තූන්හි මෝහ-විවේකසුඛරසය වඩා, එයින් සම්ප්‍රයුක්ත ධර්මයන් මුදිත-ප්‍රමුදිතයන් මෙන් කෙරෙමින් එය ධ්‍යානසමාපත්ති සුඛය

හෝ මාගීඵල සුවය තෙක් ද වඩාලයි. මෙසේ ඒ අලෝභාදී තුන් ධර්මයෝ සම්ප්‍රයුක්ත චිත්තචෛතසිකයන්, කුසල් දහම්හි මුදිතප්‍රමුදිතයන් මෙන් කෙරෙමින්, බොහෝ කලක් නුමුදු පවත්වත්. සම්ප්‍රයුක්ත ධර්මයෝ ද එසේ ම පවතිත්. ඔවුන් එසේ පවත්නා කල්හි සහජාත රූපකලාපයෝ ද ඔවුන් අනුව පහළ වෙමින් පවත්නාහු ම ය.

මේ උඩ කී විස්තරයෙහි **'ලෝභවිවේකසුඛරසය'** යන්නෙක් සඳහන් වැ ඇත. එහි **විවේක** යනු වෙන්-වීම ය, පහ වීම ය. ලෝභය පහ වීම **ලෝභවිවේක** නමි. ලෝභය පහ වීමේ දී සිතැ ඇති වන සුවය ලෝභවිවේක-සුඛ නමි. එය ම රසය වූයේ **ලෝභවිවේකසුඛරස** නමි. ද්වෙෂවිවේකසුඛරස **මෝහ විවේක සුඛරස** යන දෙනැත අර්ථ ද මේ නය අනුව සලකා ගත යුතු. මේ දැක්වුණේ අභිධර්මපිටකයෙහි ආ **ප්‍රස්ථානනයක්‍රමය** යි.

**දැන් සූත්‍රාන්ත නය අනුව විස්තරය කියනු ලැබේ.** අවිද්‍යා යැ යි කියන ලද මෝහය ද, තෘෂ්ණා යැ යි කියන ලද ලෝභය ද යන දෙදෙන සියලු සසර දුක්හි මුල් වෙති. ද්වෙෂය වනාහි ලෝභය නිසා, ලෝභප්‍රත්‍යයයෙන් ඇති වන පව් මුලෙකි. විද්‍යා සංඛ්‍යාත අමෝහය ද, නෛෂ්ක්‍රාම්‍ය ධාතු (නිෂ්කාමභාව) සංඛ්‍යාත අලෝභය ද යන මේ දහම් දෙක විවර්ත ධර්මයන් ගේ මුල් ය අද්වෙෂය වනාහි අලෝභය නිසා අලෝභප්‍රත්‍යයයෙන් ඇති වන කුසල් මුලෙකි.

මෙසේ මේ මුල් සය සහජාත වූ ද සහජාත නො වූ ද නාමරූප ධර්මයනට ප්‍රත්‍යය වේ. මේ සූත්‍ර පිටකයෙහි ආ නය ක්‍රමය යි

**හේතුප්‍රත්‍යයදීපනිය යි.**

# 2. ආලම්බනප්‍රත්‍යය

**ආලම්බනප්‍රත්‍යය නම් කවර යැ?**

සියලු චිත්තචෛතසික ධර්ම ද සියලු රූප ද නිවන ද සියලු ප්‍රඥප්තිහු ද යන මොහු හැම ආලම්බනප්‍රත්‍යය නම් හ. චිත්තචෛතසිකයනට අරමුණු නො වන කිසි ද දහමෙක් නැත. සැකෙවින්, රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය ධර්ම යැ යි අරමුණු සයෙකි. ආලම්බනප්‍රත්‍යයයා ගේ ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ කවුරු ද? යත්: සියලු චිත්තචෛතසිකයෝ ආලම්බන ප්‍රත්‍යයයාගේ ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ය. භූත හෝ අභූත යම් කිසිවක් සිතෙහි අරමුණ වෙයි. ඒ දෙකින් ම තොර වැ, අරමුණක් නැති වැ පවත්නා සිතෙක් නම් නැත.

එහි වර්තමාන රූපාලම්බනය දෙවදෑරුම් චක්ඛුවිඤ්ඤාණයට ආලම්බනප්‍රත්‍යය වේ (සිත එල්බෙන දැය වීමෙන් එයට උපකාරී වේ). වර්තමාන ශබ්දාලම්බනය දෙවැදෑරුම් සෝතවිඤ්ඤාණයට ද, වර්තමාන ගන්ධාලම්බනය දෙවැදෑරුම් ඝාණවිඤ්ඤාණයට ද, වර්තමාන රසාලම්බනය දෙවැදෑරුම් ජිව්හාවිඤ්ඤාණයට ද, වර්තමාන ස්ප්‍රෂ්ටව්‍යාලම්බනය දෙවැදෑරුම් කායවිඥානයට ද, වර්තමාන වූ ඒ සියලු පස් අරමුණු ත්‍රිවිධ මනෝධාතුවට ද ආලම්බනප්‍රත්‍යය වේ. වර්තමාන වූ ඒ සියලු පස් අරමුණු ත්‍රිවිධ මනෝධාතුවට ද ආලම්බන-ප්‍රත්‍යය වේ. අතීතානාගතවර්තමාන වූ ඒ සියලු පස් අරමුණු හෝ ත්‍රෛකාලික වූත් කාලවිමුක්ත වූත් ධර්මාලම්බනයයෝ හෝ සසැත්තෑවැදෑරුම් මනෝවිඥානයට සුදුසු පරිදි ආලම්බනප්‍රත්‍යය වෙත්.

**කුමන අරුතින් ආලම්බන නම් වේ ද? කුමන අරුතින් ප්‍රත්‍යය නම් වේ ද? යත්:**

චිත්තචෛතසිකයන් විසින් **එල්බිය යුත්තේ ය** යන අරුතින් ආලම්බන නම් වේ. 'උපකාර **කරන්නා**' යන

අරුතින් ප්‍රත්‍යය නම් වේ. **එල්බියැ යුතු** යන මෙහි එල්බීම නම් චිත්තචෛතසිකයන් අයත් අරමුණු ගැනීම නැමැති ක්‍රියාව ය.

ලොවෙහි අයස්කාන්ත (කාන්දම්) නම් ලෝහධාතු-විශෙෂයෙක් ඇත. ‘යකඩ කැමැත්තෝ’ යැ යන අරුතින් එය ඒ නම ලබයි. එය යකඩක් ළඟ තබන ලද්දේ ඒ යකඩට අභිමුඛ ව එය අතට සැලෙයි, එය දෙසට ඇදුම් කයි. ඒ යකඩ හෝ තමා දෙසට ඇදගනී කාන්දම් කැබැල්ලේ මේ ඇදීම, එල්බීම, ආලම්බනක්‍රියා නම් වේ. මෙසේ ම චිත්තචෛතසිකයන් ගේ ද අරමුණෙහි එල්බීම දත යුතු. චිත්තචෛතසිකයෝ අරමුණෙහි එල්බෙත්තාහු එයින් නො නවතිති. ඔහු එසේ සත්ත්ව-සන්තානයෙහි උපදනාහු සදෙරෙහි අරමුණු ආපාතගත වීමෙහිදී ක්‍ෂණයක් පාසා උපදින්නෝ ද, ඉපිද ක්‍ෂණයක් පාසා නිරුද්ධ වන්නෝ ද වෙති.

බෙර මුහුනෙහි බෙරහඬ නැගෙනුයේ ඒ ඒ තැන අතින් පහර වැදෙන කල්හි ම ය. එය සැනෙන් සැනේ උපදී. ඉපිද නිරුද්ධ වෙයි. වීණානාදය නැගෙනුයේ වීණාවේ තත්වලැ ඒ ඒ තැන වීණාදණ්ඩකය වැදෙන කල්හි ම ය. එය ක්‍ෂණයෙන් උපදී එසේම ක්‍ෂණක්‍ෂණ-යෙහි නිරුද්ධ වේ. පෙර අත්බව්හි මරණාසන්න කාලයෙහි සදෙරෙහි හමු වැ වැටුණු කර්ම-කර්මනිමිත්ත-ගතිනිමිත්ත යන මෙයින් එකක් ම භවාංග සිතට ආලම්බන ප්‍රත්‍යය වේ.

**ආලම්බනප්‍රත්‍යයදීපනිය යි.**

# 3. අධිපතිප්‍රත්‍යය

ආලම්බනාධිපතිප්‍රත්‍යය සහජාතාධිපතිප්‍රත්‍යය යි අධිපති-ප්‍රත්‍යය දෙවැදෑරුම් වේ. එහි ආලම්බනාධිපතිප්‍රත්‍යය නම් කවර යැ? යටැ ආලම්බනප්‍රත්‍යයවිස්තරයෙහි කියන ලද අරමුණු අතුරෙන් යම් අරමුණු කෙනෙක් අතිඉෂ්ට ද අතිකාන්ත ද, අතිමනාප ද, ගරු ලෙස සලකනු ලැබෙත් ද ඒ අරමුණු ම ආලම්බනාධිපතිභාවයෙන් ප්‍රත්‍යය වන ධර්මයෝ ය (හෙවත් ආලම්බනාධිපති ප්‍රත්‍යයයෝ ය). එහි ප්‍රකෘතියෙන් ඉෂ්ට වුවත් අනිෂ්ට වුවත්, ඒ ඒ පුද්ගලා විසින් අතිශයයෙන් රුචි කරන ලද අරමුණ ම **අතිඉෂ්ටාලම්බන** නම් වේ.

ධර්ම වශයෙන් (ප්‍රභෙද වශයෙන්) ද්වෙෂමූලක සිත් දෙකත් මෝමූහ සිත් දෙකත් දුඃඛසහගත කායවිඥානයත්, හැර, සෙසු හැම කාමාවචර සිත් හා තත්සම්ප්‍රයුක්ත චෛතසික ද, රූපාවචර අරූපාවචර ලෝකෝත්තර සිත් හා තත්සම්ප්‍රයුක්ත චෛතසික ද, සියලු අතිඉෂ්ට රූප අරමුණු ද යන මොහු අධිපතිප්‍රත්‍යය (අධිපති භාවයෙන් ප්‍රත්‍යය වන) ධර්මයෝ වෙති.

ඔවුන් අතුරෙන් කාමාලම්බනයෝ, ඒවා ගරු කොට සලකනු ලබන කෙණෙහි පමණක් ආලම්බනාධිපති ප්‍රත්‍යය වෙත්. ඒවා ගරු වශයෙන් නො සැලැකෙන කල්හි ආලම්බනාධිපති නො වෙත්. තමන් ලබා ඇති මහද්ගත-ධ්‍යානය ගරු කොට නො සලකන ධ්‍යාන ලාභියෙක් හෝ තමන් ලත් ලෝකෝත්තර ධර්ම ගරු කොට නො සලකන ආර්‍ය්‍යපුද්ගලයෙක් හෝ නැත.

අධිපතිප්‍රත්‍යයයාගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ කවුරු ද? යත්:- ලෝභමූලක සිත් අට ද, කාමාවචර කුසල්සිත් අට ද, කාමාවචර ඥානසම්ප්‍රයුක්ත ක්‍රියා සිත් සතර ද, ලෝකෝත්තර සිත් අට ද යන මොහු අධිපතිප්‍රත්‍යයයාගේ ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ය. එහි රූපශබ්දාදි ලෞකික

අරමුණු සය ලෝභමූලක චිත්තයනට ප්‍රත්‍යය වෙයි. සතලොස් ලෞකික කුසල් සිත්හු ඥානවිප්‍රයුක්ත කුසල් සිත් සතරට ප්‍රත්‍යය වෙති. ඒ කුසල්හු ද රහත්මඟින් යට මාර්‍ගඵලයෝ ද නිවන ද ඥානසම්ප්‍රයුක්ත කාමාවචර කුසල්සිත් සතරට ප්‍රත්‍යය වෙති. රහත්මඟපලත් නිවනත් ඥානසම්ප්‍රයුක්ත කාමාවචර ක්‍රියා සිත් සතරට ද, නිවන ලෝකෝත්තර සිත් අටට ද අධිපතිභාවයෙන් ප්‍රත්‍යය වෙත්. කවර අරුතෙකින් ආලම්බන (ආරම්මණ) නම් වේ ද? යත්: ආලම්බිතව්‍යාර්‍ථයෙන් (එල්බිය යුතු දෑ ය යන අරුතින්) ආලම්බන (ආරම්මණ) නම් වේ. ආධිපත්‍යාර්‍ථයෙන් අධිපති නම් වේ.

**ආධිපත්‍යාර්‍ථය** නම් කිමෙක් ද? තමා ගරු කොට පවත්නා චිත්තචෛතසිකයන් කෙරෙහි තමා ගේ ඊශ්වරභාවය ආධිපත්‍යාර්‍ථ නමි. ලොවෙහි මිනිසුන් අතර ස්වාමිපක්‍ෂය මෙන් ආලම්බනාධිපතිප්‍රත්‍යයධර්‍මයෝ දත යුත්තාහ.

**සුතසෝම**ජාතකයෙහි **පෝරිසාද** රජ මිනිස්මස් ගරු කරනුයේ, එය හේතු කොට ගෙන රජය හැර ගොස් වෙනෙහි හැසුරුණේ ය. එහි මිනිස්මසෙහි ගඳ ද රස ද ඔහු සිතට ආලම්බනාධිපතිප්‍රත්‍යය විය. පෝරිසාදයා ගේ ලෝභමූල සිත ප්‍රත්‍යයෝත්පන්න ධර්‍මය විය. සුතසෝම රජ සත්‍යවාදිතාධර්‍මය ගරු කොට, සත්‍යවචනය රැක්ම හේතු කොට ගෙන රජසැපතත් නෑ සමූහයාත් සිය ජීවිතයත් හැර දමා නැවත පෝරිසාදයා ගේ අතට පැමිණියේ ය. එහි සත්‍යවාදිතාගුණය ආලම්බනාධිපතිප්‍රත්‍යය විය. සුතසෝම රජු ගේ කුසල්සිත ප්‍රත්‍යයෝත්පන්න ධර්‍මය විය. සියලු ගුරුකෘත (ගරු කොට සලකන ලද) ආලම්බනයන්හි මේ නය යි.

**සහජාතාධිපතිප්‍රත්‍යය** කවර යැ? අධිපති බවට පැමිණි ඡන්ද චිත්ත විරිය වීමංසා යන සතර ධර්‍මයෝ සහජාතාධිපති ප්‍රත්‍යයෝ ය. ඔවුන් ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ නම් ඒ අධිපතිධර්‍ම හා එක් වැ යෙදුණු චිත්තචෛතසිකයෝත්

ඔවුන්ගෙන් පහළ වූ චිත්තජරූපයෝත් ය. කවර අරුතෙ-කින් ඔහු සහජාත නම් වේත් ද? කවර අරුතෙකින් අධිපති නම් වේත් ද? යත්: සහෝත්පාදනාර්ථයෙන් සහජාත නම් වේත්. අභිභවනාර්ථයෙන් අධිපති නම් වේත්.

එහි **'සහෝත්පාදනාර්ථ'** යනු කවරේ ද? යම් දහමෙක් තෙමේ උපදනේ, හුදෙකලා වැ නො ඉපැද සම්ප්‍රයුක්ත ධර්මයනුත් තමා හා සමග ම උපදවා ද, මෙය සහෝත්-පාදන නමි.

**'අභිභවනාර්ථ'** යනු මැඩ පැවැත්වීම යි, යට පත් කිරීම යි. සක්විති රජ තමා ගේ පුණ්‍යර්ධියෙන් සියලු දිපවල වසන්නන් ම අබිබවනුයේ, මැඩ ලනුයේ තමා වශයෙහි පවත්වයි. සියලු දිවිහි වැසියෝ ද ඔහු යටතෙහි ම පවතිත්.

එපරිද්දෙන් ම අධිපති ස්ථානයට පැමිණි ඡන්දාදි සතර ධර්මයෝ තම තමනට විෂය වූ සහජාත ධර්මයන් මැඩැ ලන්නාහු තමන් වශයෙහි පවත්වත් සහජාත ධර්මයෝ ද ඔවුන් වශයෙහි පවතිත්. යම් සේ ගල්ටැඹෙක පෘථිවි-ධාතුවත් දියකඳෙක ආපෝ ධාතුවත් ගිනිකඳෙක තේජෝ-ධාතුවත් වාතස්කන්ධයෙක වායුධාතුවත් යන මොහු තමන් හා සහජාත අන් තුන් ධාතූන් සිය වශයෙහි පවත් වන්නෝ ස්වකීය ගතිය යවත් ද (තමතම අනුකූල කොට ඔවුන් පවත්වත් ද), ඔහුත් (සහජාත ධාතුහුත්) අධිපති ධාතුව අනුව තමන් ගේ ගමන යෙත් ද (තමන් ගේ ස්වභාවය පවත්වත් ද), එ පරිද්දෙන්ම ඡන්දාදි සතර ධර්මයෝ අධිපති වූවාහු ස්වකීය ශක්තියෙන් සහජාත ධර්මයන් ලවා ඔවුන් ගේ ගමන කරවත්. සහජාත ධර්මයෝ ද ඔවුනට යටත් වැ සිය ගමන කෙරෙත්. අධිපති-ධර්මයන් ගේ සහජාතයන් අභිභවනය (මැඩලීම) මේ කී පරිදි දත යුතු.

ඉදින් සහජාත ධර් මැඩ ලන අරුතින් අධිපති නම් වනොත්, එසේ ඇති කල්හි ඡන්දය නොව ලෝභය ම

අධිපති වන්නේ නො වේ දෑ? යි මෙසේ ලෝභය ඡන්දය-ටත් වඩා බලවත් වැ සහජාත ධර්‍මයන් මඩිමින් පවතී යැයි කිය යුතු නො වේ දෑ? යි ප්‍රශ්න කළ හැකි ය. මෙහි යථාර්‍ථය කියනු ලැබේ.

බාල පෘථග්ජනයන් කෙරෙහි ම ලෝභය ඡන්දයට වඩා බල පවත්වයි. පණ්ඩිතයන් කෙරෙහි වනාහි ඡන්දය ම ලෝභයට වඩා බලවත් වැ සහජාත ධර්‍ම සිය වශයෙහි පවත්වයි. ලෝභය ම ඡන්දයට වඩා බලවත් වතොත් ලෝභයට වශග වූ මේ සත්ත්වයෝ කෙසේ නම් භවභෝග සම්පත් හැරැ දමා නෛෂ්කාම්‍යධර්‍ම පුරා සසර දුකින් මිදියැ හැකි වන්නෝ ද? යම් හෙයෙකින් ඡන්දය ම ලෝභ-යට වඩා බලවත් වේ ද, එ හෙයින් ම මේ සත්හු, තුමූ ලෝභයට හසු වැ සිටින්නෝ නුමුදු, භවභෝග සම්පත් හැරැ දමා නෛෂ්කාම්‍යධර්‍ම පුරා සසරින් මිදෙත්. එබැවින් ඡන්දය ම ලෝභයට වඩා බලවත් වෙයි. ඡන්දය ම අධිපති වෙයි ලෝභය අධිපති නො වේ. වෙෂාදීන් අධිපති නො වන අයුරු ද මේ නයින් ම දතයුතු.

ලොවැ දුෂ්කර වූ මහත් පුරුෂකාර්‍යයන් එළැඹි කල්හි මේ ඡන්දාදි සතර දහම්හු කර්‍මසිද්ධිය පිණිස පවත්නාහ. ඒ කෙසේ ද? හීන වූ ඡන්දය ඇති බොහෝ ජනයෝ ඉතා දුෂ්කර වූ මහත් පුරුෂකාර්‍ය දෑක පසු බා ගිය ඡන්දය ඇත්තෝ වෙති. එය කරන්නට කැමැති නො වෙති. 'මේය අපට අවිෂය වේ' යැ යි අපේක්‍ෂා-රහිත වැ එය නො කොට හරිත්. අධික ඡන්දය ඇත්තෝ වනාහි එ බඳු පුරුෂකාර්‍යය දෑක තැගී සිටි ඡන්දය ඇත්තේ වෙයි. එය කරනුයෙහි කැමැති ම වෙයි. මෙය මා වැන්නවුනට ම විෂය එකෙකැ යි අධිෂ්ඨානයට යෙයි. හේ ඡන්දයෙන් මෙහෙයන ලද්දේ කර්‍මසිද්ධිය වන තාක් ම තැත් කෙරෙයි, අතරැ අත හරින්නට කැමැති නො වෙයි මෙසේ ඉතා මහත් වූ ද ඒ කර්‍මය එක් කලෙක සිඩ වන්නේ ය.

හීන වීර්‍ය ඇතියෝ එබඳු කර්මයක් දැක පසු බට වැර ඇත්තෝ වෙති. 'මෙය කරන මට හිතට කයට බොහෝ වෙහෙස ඇති වේනැ' යි පසු බසිත්. වීර්‍යාධිකයා වූකලී එබඳු කාර්‍ය දැක නැඟී සිටි වීර්‍ය ඇත්තේ වෙයි. එ වේලේ ම ඉදිරිපත් වැ එය කරන්නට කැමැති වෙයි. බොහෝ කලක් එහි යෙදුණේ, හිතට කයට බොහෝ වෙහෙස ඇති වූයේ ද, උත්සාහ නො හරියි. එහි නො කලකිරෙයි. ඒ කාර්‍යයෙහි වැර නො වඩා ඉන්නට නො හැකි වෙයි. එහි වැර වඩනුයේ රෑ දවල් දෙක්හි ම වුව ද එහි යෙදුණේ සිත් සුව විඳී. මෙසේ ඇති කලැ ඉතා මහත් වූ ද කාර්‍යය කලෙක දී සිඩියට පැමිණෙයි.

හීන සිත් ඇති බොහෝ දෙනා එබඳු කාර්‍යය දැක පසු බා ගිය සිතැත්තෝ වෙති. නැවැත එය අරමුණු ද නො කරත්. අධික චිත්තය ඇති තැනැත්තේ වනාහි එබඳු කාර්‍යයෙහි නැඟී සිටි සිතැත්තේ වෙයි. සිත දුරු ලන්නට ද නො හැකි වෙයි. නිරතුරු ම එහි බැඳුණු සිතැති වෙයි. හේ චිත්තවශග වැ බොහෝ කලක් නමුදු ඒ කාර්‍යය කරනුයේ, බොහෝ වෙහෙස විඳුනේ ද එහි නො කලකිරෙයි. එය කරනුයෙහි රිසි ම වෙයි. මෙය මට විෂය එකෙකැ' යි එහි යෙදෙයි. අධික වැ නැඟි චිත්තයෙන් මෙහෙයන ලද්දේ කර්මසිඩිය දක්වා ම ක්‍රියා කෙරෙයි.

මඳ නුවණ ඇති බොහෝ දෙනා ද එබඳු කාර්‍යයක් දැක පසු බා ගිය ප්‍රඥ ඇත්තෝ වෙති. කාර්‍යයන් ගේ මුල ද කෙළවර ද නො දකිත්. අඳුරෙහි ගෙයකට පිවිසෙන්නවුන් බඳු වෙති. ඒ කාර්‍යය කිරීමෙහි ඔහු සිත් ද නො නැමෙයි. ප්‍රඥධිකයා වනාහි එබඳු කර්ම දැක නැඟී සිටි ප්‍රඥ ඇත්තේ වෙයි. කාර්‍යයාගේ ආදිය ද අන්තය ද දකී. එහි ඵලය ද දකී අනුසස් ද දකී පහසු සේ කාර්‍ය-සිඩිය වනු පිණිස යෙදිය යුතු නානා උපායමාර්ග ද දකී. හේ බොහෝ කලක් ඒ කාර්‍යය කරන්නේ සිත් සුව විඳී. ඉතා මහත් වූ ද කාර්‍යය සිඩියට පමුණුවයි.

මෙසේ දුෂ්කර වූ පුරුෂකාර්‍ය්‍යයන් එළඹැ සිටි කල්හි ඡන්‍දාදි සතර දහම්හු කර්‍මසිද්ධිය පිණිස පවත්නාහ. මේ සතර අධිපති ධර්‍මයන් ඇති බැවින් ම ලොවැ විශිෂ්ට පුරුෂයෝ ඇති වන්නාහ. සර්‍වඥ බුදුවරු ද, සර්‍වඥබෝධිය පතන බෝසත්වරු ද, පසේබුදුවරු ද, පසේබෝසත්-වරු ද, අගසව්වෝ ද, මහසව්වෝ ද, ශ්‍රාවක බෝධිසත්ත්ව වරු ද දක්නා ලැබෙත්. මෙ බඳු පුද්ගල විශෙෂයන් ගේ වශයෙන් සත්ලොවට හිත වැඩ සුව පිණිස ප්‍රඥශිල්ප-විශේෂයෝ ද, පරිභෝගවස්තු විශේෂයෝ ද ඇති වෙත්.

**අධිපතිප්‍රත්‍යයදීපනිය යි.**

---

# 4. අනන්තරප්‍රත්‍යය

**අනන්තරප්‍රත්‍යය** කවර යැ? අනන්තර ක්‍ෂණයෙහි නිරුද්ධ වූ චිත්ත චෛතසික ධර්‍ම සමූහ තෙම අනන්තර-ප්‍රත්‍යය නම්. අනන්තරප්‍රත්‍යයයා ගේ ප්‍රත්‍යයෝත්පන්න ධර්‍මයෝ කවරහු ද? යත්:- පශ්චිම අනන්තර ක්‍ෂණයෙහි උපන් චිත්තචෛතසික ධර්‍මසමූහය ඒ ප්‍රත්‍යයයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

එක් භවයෙක ප්‍රතිසන්‍ධි සිත පළමු භවාංග සිතට අනන්තර ප්‍රත්‍යය වේ. පළමු භවාංග සිත දෙවෙනි භවාංග සිතට ද යන ආදීන් ප්‍රත්‍යය වන බව කිය යුතු.

"යම් කලෙක ශුද්ධාවාසයනට දෙවෙනි අකුසල් සිත පවත්නා කල්හි"යි ධර්‍ම යමකයෙහි කී නයින්, සත්ත්වයා ගේ අළුත් අත්බව ඇරැබැ "මෙය මගේ ය, මේ මම් ය, මේ මගේ ආත්මයැ"යි පැවැති භවනිකාන්තිතෘෂ්ණාසහගත සිත උපදී ද, එ කලැ පළමු කොටැ දෙවරක් භවාංගචලනය වැ ඉන් පසු මනෝද්වාරාවර්‍ජනය උපදී. ඉන් පසු භවනිකාන්ති ජවන සතෙක් උපදී. ඉන් පසු භවාංගවාරය වේ.

තව ද, ඒ සත්වයා යම් කලෙක ප්‍රත්‍යුත්පන්න භවයෙහි කිසිත් නො දනී ද, පෙර භවයෙහි තමා විඳි අරමුණු සිහි කෙරෙමින් හිඳී ද, වාස්තුව ඉතා දුර්වල බැවින් ඒ අරමුණත් අපරිව්‍යක්ත ම වෙයි. එය අරමුණු කොට උද්ධච්චසහගත සිත ම බහුල ව පවතී. යම් විටෙක ගබ මඳක් වැඩෙනුයේ දෙමස ඉක්මැ ගියේ වේ ද, ඇස් ආදි ඉඳුරෝ පරිපූර්ණ වෙත් ද, එසේ ඇති කල්හි පවා මවු කුසෙහි ආලෝකාදි ප්‍රත්‍යයයන් නැති බැවින් චක්ෂුර්විඥානාදි සතර විඥානයෝ නො පහළ වෙත්. කායවිඥාන මනෝවිඥාන දෙක ම උපදී. ඒ සත්ව තෙම මවුගේ ඉරියවු පෙරළීම් ආදියෙහි දී බොහෝ දුක් දොම්නස් විඳී, මවු කුසින් බිහි වන කල්හි මහත් ම දුක් වේදනා විඳී. ප්‍රසූතියෙන් පසු ද වාස්තුරූපයෝ යම්තාක් කල් මෘදු වැ පවතිත් ද, මිහිකිරිමට නො පැමිණෙත් ද, ඒ තාක් ම හේ ඉතා මන්දසවභාවය ඇත්තේ උඩුකුරු වැ හෝනේ වෙයි. කිසි වත්මන් අරමුණකුත් නො සලකයි හේ බෙහෙවින් එයින් පළමු භවය අනුව යන්නේ ම වෙයි. ඉදින් හේ නිරයෙන් ආයේ වී නම් ඇඹුම් ආදි විසින් විරූප මුහුන බහුල කොට ඇති වේ. පළමු සිටි නිරය අරමුණු කොට කෙණෙහි කෙණෙහි විරූප මුහුන පායි. ඉදින් දෙව්ලොවින් ආයේ වී නම් දෙව් අරමුණු ඇරබැ ප්‍රසන්න මුහුන බෙහෙවින් ඇති වේ කෙණෙහි කෙණෙහි ඔහු ගේ සිනා මුසු මුහුන දක්නට ලැබේ.

යම් කලෙක වනාහි වාස්තුරූපයෝ තියුණු වැ මුහුකුරා යෙත් ද, ඔහු ගේ චිත්තසන්තානයත් සුවිසද වැ පවතින කලැ, හේ නො මඳ වැ කෙළනේ තුටු පහටු වැ හිඳී. ප්‍රත්‍යුත්පන්න අරමුණු ද සලකයි. මවු ගේ බසට ද කන් දෙයි. ඔහු සිත බෙහෙවින් මෙ ලොව අනුව යමින් පවතී. පළමු භවයේ දෑ අමතක කෙරෙයි.

හැම සතෙක් ම මෙහි දී පළමු අත්බව සිහි කෙරේ ද? යත්: හැම සතෙක් ම මෙහි දී පෙර අත්බව අමතක නො කරයි. කිසිවෙක් ඉතා දැඩි ලෙස ගර්භාවාස දුකින් පෙළෙණේ කුසේ දී ම අතීත අත්බව අමතක වන බවට

පැමිණේ. කිසිවෙක් මවු කුසින් බිහි වන වේලෙහි ද, කිසිවෙක් බිහි වූ පසු ද, අතීතය අමතක වන බවට පැමිණේ. කිසිවෙක් එයින් පසු ද ළදරු වියෙහි දී අතීතය සිහි කෙරෙයි. වැඩුණු කල්හි ම පෙරත්බව සිහි නො කෙරෙයි. කිසිවෙක් දිවි ඇති තාක් ම අතීත අත්බව සිහි කෙරෙයි. අතීත අත්බව් දෙක තුනක් සිහි කරන්නෝ ද කලාතුරෙකින් වෙති. ඔහු ජාතිස්මරණය ඇත්තෝ නම් වෙති.

මවු කුසින් බිහි වන වේලේ පටන් කොට ෂාඩ්වාරික වීථි සිත් පවතී. ප්‍රත්‍යුත්පන්න අරමුණු සැලකීමේ පටන් ෂාඩ්වාරික වීථි සිත් පරිපූර්ණ වැ පවත්නේ ය. හැම තැන ම පළමු පළමු අනන්තර නිරුද්ධ චිත්තය පසු පස අනන්තරෝත්පත්න සිතට අනන්තර භාවයෙන් ප්‍රත්‍යය වේ. මේ අනන්තරප්‍රත්‍යය ද අක්මුල් නැති සසර එක් සත්කුට එක් ප්‍රබන්ධයෙක් ම වේ (දිගට ම එකකට අනතුරු වැ තවෙකක් බැගින් බැඳී පවත්නේ වේ). යම් විටෙක සත්ව තෙම රහත් වැ ස්කන්ධපරිනිර්වාණයට පැමිණේ නම්, එ කල්හි ම ඒ ප්‍රබන්ධය සිඳේ.

කවර අරුතෙකින් **අනන්තර** නම් වේ ද? කවර අරුතෙකින් ප්‍රත්‍යය නම් වේ ද? යත්: තමාට අනතුරු වැ **තමාට සමාන අන්‍ය ධර්මයක් උපදවන අරුතින්** අනන්තර නම් වේ. උපකාරකාර්යයෙන් ප්‍රත්‍යය නම් වේ.

**එහි තමාට සමාන** යනු 'අරමුණු සහිත' බැවින් තමාට සමාන බව හඟවනුවට කියන ලදී.

**'අරමුණු සහිත බව'** යනු හැම චිත්තචෛතසික ධර්ම ම අරමුණක් ඇති වැ ම පවත්නා බව යි.

**අන්‍ය ධර්මයක් උපදවන අරුතින්** යන්නෙහි අර්ථය නම්: පළමු සිත නිරුද්ධ වූ කල්හිදු එහි චින්තනක්‍රියාවගේ වේගය නො සංසිඳෙයි. ඊ ළඟ සිත උපදවා ම එය සංසිඳෙයි. මෙසේ හෙයින් එයට පසු ව 'අන්‍ය (චිත්තෝත්පාද) ධර්මයක් උපදවන අරුතින්' යනු කියන ලදී.

එහි පළමු පළමු මවු පරපුර මෙන් අනන්තර ප්‍රත්‍යය-පරම්පරාව දත යුතු. පසු පසු ඇති වන දූපරපුර මෙන් අනන්තරප්‍රත්‍යයයාගේ ප්‍රත්‍යයෝත්පන්නපරම්පරාව දත යුතු. මෙසේ ඇති කල්හි රහතුන්ගේ ජීවිතයේ කෙළවරැ ඇති වන පිරිනිවෙන සිත නැවැත ප්‍රතිසන්ධිචිත්ත සංඛ්‍යාත ධර්මාන්තරයක් උපදවන්නේ ද? යත්:- නො උපදවන්නේ ය. කවර හෙයින? යත්: එ කලැ කර්මක්ලේශවේගයෙන් සර්ව ප්‍රකාරයෙන් ම නිවීගිය බැවින් රහතුන්ගේ පිරිනිවෙන සිත අත්‍යන්තයෙන් ම සංසිඳුණු බැවිනි.

**අනන්තරප්‍රත්‍යයදීපනිය සි.**

## 5. සමනන්තරප්‍රත්‍යය

මෙහි ප්‍රත්‍යයධර්මයන්ගේත් ප්‍රත්‍යයෝත්පන්න ධර්ම-යන්ගේත් විභාගය මෙයින් පෙරැ අනන්තර ප්‍රත්‍යයයට කී නයින් ම දන්නේ ය. කවර අරුතින් **සමනන්තර** නම් වේ ද? යත්: අතිශයින් ම අනන්තර වූ බැවින් (ඉතා ම ළං වූ බැවින්) **සමනන්තර** නම් වේ. ගල්ටැම් ආදියේ රූපකලාප එකට බැඳී ඇතත් රූපධර්ම බැවින්, රූප සටහන් ඇති දෑ බැවින්, අතරෙහි පරිච්ඡේද (ආකාශ) රූප ඇත්තේ ම වේ. රූප කලාප දෙකක් මැද අතරෙක් විවරයෙක් ඇත් ම ය. පුරිම පශ්චිම චිත්ත චෛතසික කලාපයන් අතරෙහි එසේ නො වේ. ඔහු අරූප ධර්මයෝ ය. එබැවින් සටහන් නැත්තෝ ය. එහෙයින් ඔවුන් මැදූ පරිච්ඡේද ධර්ම නම් වූ කිසි ද ආකාශ විවරයෙක් නැත. ඔහු මෙසේ හැම පරිද්දෙන් ම අතරක් නැත්තෝ ම ය. නාමධර්මලෝක කලාප දෙකෙක අතරෙක් නම් නො පෙනේ. එ හෙයින් මේ සත්ත්වයෝ සිත නිත්‍ය යැ යි, ධ්‍රැව යැ යි, සථාවර යැ යි, නො පෙරළෙන සුලු යැ යි සිත පිළිබඳ වැ නිත්‍යසංඥා ඇතියෝ වෙත්. මෙ පරිද්දෙන් නාමධර්ම එකකට අනෙකක් අතිශයින් ම අනන්තර වැ

උපදනෝ ය යන අරුතින් **සමනන්තර** නම් වේ මෙහි අනන්තරාර්‍ථ යනු ද තමහට අනතුරු වැ තමහට සමාන අන් දහමක්හු උපදවන අරුතින් යැ යි යටැ අනන්තරප්‍රත්‍යයදීපනියෙහි කියන ලදී.

මෙසේ ඇති කල්හි නිරෝධසමාපත්තිකාලයෙහි පූරිම චිත්තය නම් නෙවසඤ්ඤානාසඤ්ඤායතන සිත ය. පශ්චිම චිත්තය නම් ආශීඵල සිත ය. ඒ දෙ සිත් අතර එක් රැදෑවලකුදු දෙ රැදෑවලකුදු සත් රැදෑවලකුදු අචිත්තක වෙයි.

අසංඥසත්ව භූමියෙහිදු පූරිම කාමභවයෙහි චුති-චිත්තය පූරිම චිත්ත නම් වේ. පශ්චිම කාමභවයෙහි ප්‍රතිසන්ධි චිත්තය පශ්චිම චිත්ත නම් වේ. දෙසිත් අතරැ අසංඥභවයෙහි කප් පන්සියක් ම පුද්ගල තෙම අචිත්තක වැ සිටී. එහි පූරිම සිත්හු තමනට අනන්තර-යෙහි තමන් බඳු ධර්‍මාන්තරයක්හු උපදවන ශක්තියක් නැත්තෝ ද? යත්: නැත්තෝ නො වෙත්. මහද්භාවනා-ප්‍රණිධිබලය විසින් ප්‍රතිබාහිත බැවින් පූරිම චිත්තයෝ ද නිරුඬ වන්නාහු අනන්තරයෙහි ධර්‍මාන්තරයක්හු (අන් ධර්‍මයක්හු) උපදවන ශක්තිය සහිත ව ම නිරුඬ වෙති. පැසිම් සිත්හු ද උපදනාහු එ කෙණෙහි ම ඒකාබඬ වැ උපදිනු නො හැක්කෝ, යටැ කී කාලපරිච්ඡේදයා ගේ ඇවෑමෙන් ම උපදිත්. මෙ පමණෙකින් පූරිම චිත්තයනට අනතුරු වැ ධර්‍මාන්තරයක්හු උපදවන ශක්තියක් නම් නැතැ යි හෝ ඔහු අනන්තරප්‍රත්‍යයධර්‍මයෝ නො වෙති යි හෝ කිය නො හැක්ක. ඉදින් රජෙක් සිය යෝධයනට කිසි විටෙක "දැන් තෙපි යුද නො කරවු. යුදට මේ කල් නො වේ. අසෝ කල්හි ම යුද කරවු"යි කියන්නේ නම්, ඔහුත් එ කලැ යුද නො කරන්නාහු ඒ ඒ තැන යෙත් නම් මෙසේ ඇති කල්හි ඔවුන්ගේ යුද කරන ශක්තියෙක් නැතැ යි හෝ ඔහු යෝධයෝ නො ෙේති යි හෝ කිය නො හැක්ක.

මේ ප්‍රත්‍යයෙහි චිත්තචෛතසිකයන් අරූපධර්ම බැවින් ද එ හෙයින් ම රූපසටහන් නැති බැවින් ද, අතර පරිච්ඡෙදධර්ම නම් වූ කිසිවක් නැතිබැවින් ද, හැම ලෙසින් ම අතරක් නැත්තන් බව කියන ලද යි සලකනු විය හැක්ක.

මෙසේ ඇති කල්හි යටැ ආලම්බනප්‍රත්‍යයවිභාගයෙහි සඳහන් වූ භේරිශබ්දෝපමා වීණාශබ්දෝපමා දෙකින් චිත්තයන්ගේ ක්ෂණික උත්පත්තියත් ක්ෂණිකනිරෝධයත් කියන ලද නම්, එය අප විසින් කෙසේ හැඳූනියැ යුතු ද? යි ප්‍රශ්න කළ හැක්ක. අන්‍යෝන්‍යවිරුද්ධ වූ නානා-චිත්තයන්ගේ ක්ෂණමාත්‍රයෙහි පවා පූර්වාපර පරිවර්තනය (පරම්පරා වශයෙන් පෙරළෙන බව) පැණෙන බැවින් එය හැඳූනිය හැක්ක. මේ අර්ථය පෙර **චිත්තයමක-දීපනියෙහි** විස්තර වශයෙන් කියා ඇත.

**සමනන්තරප්‍රත්‍යයදීපනිය යි.***

---

## 6. සහජාතප්‍රත්‍යය

සහජාතප්‍රත්‍යයයාගේ ප්‍රත්‍යයවිභාගයත් ප්‍රත්‍යයෝත්-පන්නවිභාගයත් දක්වනු ලැබේ.

එකට උපන් සියලු චිත්ත චෛතසිකධර්මයෝ උනුනට සහජාතප්‍රත්‍යයයෝ ද සහජාතප්‍රත්‍යයෝත්පන්නයෝ ද වෙති. ප්‍රතිසන්ධිනාමස්කන්ධයෝත් ප්‍රතිසන්ධිසහජාත-හෘදයවාස්තුවත් උනුනට සහජාතප්‍රත්‍යයයෝ ද සහජාත ප්‍රත්‍යයෝත්පන්නයෝ ද වෙති. සියලු ම මහාභූතයෝ

*තස්මා ධම්මතො අවිසෙසෙ'පි තථා තථා බුජ්ඣිතබ්බානං වෙනෙය්‍යානං වසෙන උපසග්ගස්සාවිසෙසමත්තෙනෙ'ව භෙදො පච්චෙතබ්බො' යනු පට්ඨාන අටුවා පාඨ යි. මේ අනන්තර ප්‍රත්‍යය සමනන්තර-ප්‍රත්‍යය දෙක්හි ධර්ම වශයෙන් වෙනසක් නැතත් ඒ ඒ සැටියෙන් නිවන් ප්‍රත්‍යක්ෂ කරන විනේයජනන්ගේ අදහසට සරිලන සේ 'සං' යන උපසර්ග මාත්‍රයෙන් ම වෙනසක් දක්වුණා විනා අර්ථ වශයෙන් මේ ප්‍රත්‍යය දෙක එකක් ම යැ යනු එහි අදහස යි.

උනුනට සහජාතප්‍රත්‍යයයෝත් සහජාතප්‍රත්‍යයෝත්-පන්නයෝත් වෙති. ප්‍රතිසන්ධිචිත්තයාගේ උත්පාදක්ෂණයෙහි සියලු කර්මජරූපයෝත්, ප්‍රවෘත්තිකාලයෙහි ඒ ඒ සිතින් උපන් සියලු චිත්තජරූපයෝත් සහජාත චිත්තයාගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ නම් වෙති. සියලු උපාදාරූපයෝ සහජාත මහාභූතයන්ගේ ප්‍රත්‍යයෝත්-පන්නයෝ වෙති.

කවර අරුතෙකින් සහජාත නම් වේ ද? කවර අරුතෙකින් ප්‍රත්‍යය නම් වේ ද?

එක් වැ උපදනා අරුතින් සහජාත නම් වේ උපකාරක ය යන අරුතින් ප්‍රත්‍යය නම් වේ.

මෙහි **'එක් වැ උපදනා අරුතින්'** යනු යම් දහමෙක් උපදිනුයේ, තමාගේ ප්‍රත්‍යයෝත්පන්න ධර්‍ම සමග ම තෙමේත් උපදී ද, තමාගේ ප්‍රත්‍යයෝත්පන්න ධර්‍මත් තමා හා ම උපදවා ද ඔහුගේ ඒ අර්‍ථය සහජනනාර්‍ථ නම් වේ

හිරු පායනුයේ අව්වත් එළියත් තමා හා ම පහළ කෙරෙමින් උද, වනුයේ යම් සේ ද, පහන් දැල්ල ඇවිලෙනුයේ උණුහුමත් එළියත් තමා හා ම උපදවමින් යම් සේ ඇවිළේ ද, එසේ ම මේ ප්‍රත්‍යයධර්‍ම තෙම උපදනේ තමාගේ ප්‍රත්‍ය-යෝත්පන්නධර්‍මයන් තමා හා ම උපදවයි. මේ උවමෙහි හිරුමෙන් එකි එකි නාමධර්‍ම දත යුතු. අව්ව මෙන් තත්-සම්ප්‍රයුක්ත ධර්‍ම දත යුතු. හිරුඑළිය මෙන් සහජාත රූපධර්‍ම දත යුතු. තව ද හිරු මෙන් එක් එක් මහාභූත රූපධර්‍මය දත යුතු. අව්ව මෙන් සහජාත මහභූත රූප දත යුතු. හිරුඑළිය මෙන් සහජාත උපාදාරූපයෝ දත යුතු වෙත්. ප්‍රදීපෝපමාවේ ද උපමාඋපමේය-විභාගය මේ නය අනුව ම දත යුතු

**සහජාතප්‍රත්‍යයදීපනිය යි.**

# 7. අන්‍යෝන්‍යප්‍රත්‍යය (අඤ්ඤමඤ්ඤපච්චය)

යට සහජාතප්‍රත්‍යයයෙහි බෙද දක්වන ලද ධර්‍ම අතුරෙන් යමෙක් යමෙක් ප්‍රත්‍යයධර්‍ම යැ යි කියන ලද ද, ඒ ඒ ද ම මෙහි ප්‍රත්‍යයධර්‍ම ද ප්‍රත්‍යයෝත්පන්නධර්‍ම ද වෙයි. සියලු ම චිත්තචෛතසිකධර්‍මයෝ එකෙක් අන් හැමට ප්‍රත්‍යය වෙත්, උනුන්ගේ ප්‍රත්‍යයෝත්පන්න ධර්‍මයෝ ද වෙත්. සහජාත වූ සතර මහාභූතයෝ උනුනට ප්‍රත්‍යය-ධර්‍ම ද, උනුන්ගේ ප්‍රත්‍යයෝත්පන්න ධර්‍ම ද වෙත්. ප්‍රතිසන්ධි-නාමස්කන්ධයෝ ද ප්‍රතිසන්ධිසහජාත හෘදයවාස්තුරූපය ද උනුනට ප්‍රත්‍යයධර්‍ම ද උනුන්ගේ ප්‍රත්‍යයෝත්පන්න ධර්‍ම ද වෙත්. මෙහි අදහස සුගම ය. යම්සේ උනුන් නිසා ඔසොවන ලද (එකක් අන් දෙකට හේත්තු වී සිටින ලෙසට තඟා තබන ලද) ලී තුනෙක් උනුනට නිඃශ්‍රයයෝත් උනුන්ගේ නිඃශ්‍රිතයෝත් වෙත් ද, ඔවුන් හැම එකක් ම තඟා තබන ලද කල්හි සියල්ලෝ ම නැඟී සිටියාහු වෙත් ද, එකක් වැටෙන කලැ සියල්ලෝ ම වැටෙත් ද, එපරිද්දෙන් ම අන්‍යෝන්‍යප්‍රත්‍යයයෝ දත යුත්තාහ.

මෙහි සියලු චෛතසිකධර්‍මයෝ චිත්තප්‍රත්‍යය නො ලබන්නාහු උපදනට නො හැක්කාහ යි කියන්නෝ වෙති. එසේ කියනු යුතු ය. කවර හෙයින? යත්: ස්පර්‍ශාදි ආදි චෛතසිකකෘත්‍යයෝ විජානනකෘත්‍යය පූර්‍වඞ්ගම කොටැත්තාහ. එ බැවින් **මනොපුබ්බඞ්ගම** (මනස පූර්‍වඞ්ගම කොටැත්තෝ) යි ම කියන ලදහ. සිත වනාහි චෛතසික ප්‍රත්‍යය නො ලබන්නේ උපදින්නට නොහැක්කේ ය යනු නො යෙදේ ද? යත්: එය විස්තර කරනු ලැබේ.

චෛතසිකධර්‍මයෝ නම් චිත්තයාගේ සහායාඞ්ගයෝ වෙත්. එහෙයින් ඔවුන්ගෙන් වෙන් ව ම සිත ද උපදිනු නො හැක්කේ ම ය. චතුර්‍මහාභූතච්ඡයෙහි ද මේ නය ම ය. උපාදාරූපයෝ වනාහි මහාභූතයන්ගේ නිඃෂ්‍යන්දරූපමාත්‍ර (භූතරූප නිසා උපදනා රූප ම) වන බැවින් සහායාඞ්ගයෝ

නො වෙත් ද? යත්: ආහාරරූපයත් ජීවිතරූපයත් ප්‍රත්‍යයවිශේෂයත් බැවින් සහායාඞ්ග නො වේ ද? යත්: එය පැහැදිලි කරනු ලැබේ. ඒ ධර්මයෝ ස්ථිතියෙහි ම සහායාඞ්ග වෙත්. උත්පාදයෙහි සහායාඞ්ග නො වෙත්. මෙහි වූ කලී උත්පාදයෙහි ම සහායාඞ්ගය අදහස් කරන ලද්දේ ය.

**අන්‍යෝන්‍යප්‍රත්‍යයදීපනිය යි.**

---

## 8. නිඃශ්‍රයප්‍රත්‍යය (නිස්සයපච්චය)

සහජාතනිඃශ්‍රයය, වාස්තුපුරෝජාතනිඃශ්‍රයය, වාස්ත්වාලම්බනපුරෝජාතනිඃශ්‍රය යි නිඃශ්‍රයප්‍රත්‍යයය ත්‍රිවිධ වේ.

එහි සහජාතනිඃශ්‍රයය කවර යැ? සියලු සහජාතප්‍රත්‍යයය සහජාතනිඃශ්‍රය ය. එහෙයින් එහි ප්‍රත්‍යයවිභාගය ද ප්‍රත්‍යයෝත්පන්නවිභාගය ද සහජාතප්‍රත්‍යයයෙහි කී නයින් දතයුතු.

වාස්තුපුරෝජාතනිඃශ්‍රයය කවර යැ? චක්ෂුර්වාස්තු - ශ්‍රෝත්‍රවාස්තු - ඝ්‍රාණවාස්තු - ජිව්හාවාස්තු - කායවාස්තු - හෘදයවාස්තු යැ යි වාස්තුහු සදෙනෙකි. මේ ෂඩ් වාස්තුහු ප්‍රවෘත්තිකාලයෙහි සප්ත විඥානධාතූනට වාස්තුපුරෝජාතනිඃශ්‍රයය වෙති.

වාස්තුරූපය ම පුරෝජාත ව නිඃශ්‍රය වූයේ වාස්තුපුරෝජාතනිඃශ්‍රය නම් වේ. එහි චිත්තචෛතසිකයනට නිඃශ්‍රයස්ථානය යන අරුතින් **වාස්තු** (වත්ථු) නම් වේ. **පුරෝජාත** යනු තම තමා අයත් ප්‍රත්‍යයෝත්පන්න ධර්මයා ගේ උත්පත්තික්ෂණයෙන් පළමු ක්ෂණයෙහි පහළ වූයේ යැ. එහි ප්‍රතිසන්ධිචිත්තය එ කල්හි පුරෝජාත වූ වාස්තුරූපයක්හු ගේ අභාවයෙන් තමා හා උපන්නා වූ ම හෘදයවාස්තුරූපය නිසා ම උපදී. පළමු භවාඞ්ග සිත වනාහි ප්‍රතිසන්ධිචිත්තය හා පහළ වූ හෘදයවාස්තුරූපය නිසා උපදී.

දෙවෙනි භවාඞ්ගචිත්තය පළමු භවාඞ්ග සිත හා උපන් හෘදයවාස්තුරූපය නිසා උපදී. මෙසේ තෙවෙනි භවාඞ්ග සිත දෙවෙනි භවාඞ්ග සිත හා උපන් හදවත් රූපය නිසා ද යි මේ ඈ විසින් මරණාසන්න කාලය තෙක් මනෝධාතු මනෝවිඥානධාතු දෙදෙනාගේ වාස්තුපුරෝජාත-නිඃශ්‍රයය දතයුතු.

යම්සේ වීණානාදය නම් වීණාවේ තත් වීණාදණ්ඩ හා ගටන වේගයෙන් ම උපදී ද, අන් පරිදි නො උපදී ද, එසේ ම පංචවිඥානයෝ නම් පංචවාස්තු සංඛ්‍යාත පංචවාරයන්හි පංචාලම්බනයන් ගේ ආපාතාගමනවේගයෙන් ම පහළ වෙත්. අන් පරිද්දෙකින් නො පහළ වෙත්. ආපාතාගමනය ද ඒ වාරාලම්බනයන් ගේ සම්ප්‍රාප්ත කාලයෙහි ම වෙයි. ආපාතාගමනප්‍රත්‍යයෙන් ද දෙවරක් භවාඞ්ගය සැලෙයි. භවාඞ්ගචලනප්‍රත්‍යයෙන් ද ආවර්ජනය උපදී. ආවර්ජනප්‍රත්‍යයෙන් ද ඒ පංචවිඥානයෝ උපදිත්. එ හෙයින් චක්ෂුරාදි පංච වාස්තුහු පළමු අතීත භවාඞ්ග-චිත්තයා ගේ උත්පාදක්ෂණයෙහි උපන්නාහු ම පංච-විඥානධාතූනට වාස්තුපුරෝජාත ප්‍රත්‍යයෝ වෙත්.

මරණාසන්න කාලයෙහි වනාහි සියලු ම ෂඩ්වාස්තුහු චුති සිතින් පළමු සතොළොස්වන භවාඞ්ගචිත්තයා ගේ උත්පාදක්ෂණයෙහි ම උපදිත්. එයින් පසු නො උපදිත්. එහෙයින් මරණාසන්න කාලයෙහි භවාඞ්ගචිත්තයෝ ද සියලු ෂාඩ්වාරික චිත්තයෝ ද ච්‍යුතිචිත්තය ද වඩා පළමු උපන් ඒ තමතමන්ගේ වාස්තූන් ම ඇසුරු කොට උපදිත්. මේ වාස්තුපුරෝජාතනිඃශ්‍රය නම්.

වාස්ත්වාලම්බනපුරෝජාතනිඃශ්‍රයය කවර යැ? යම් කලෙක තමාගේ අධ්‍යාත්මවාස්තුරූපය අරමුණු කොට, යම් රූපයක් නිසා, මනෝවිඥානය පවත්නේ නම් ‘මෙය මගේ ය, මේ මම ය, මේ මගේ ආත්මය යැ’ යි මෙසේ තෘෂ්ණාමානදෘෂ්ටීන් ගෙන් ගැනුම් විසින් හෝ ‘මෙය අනිත්‍ය ය, මෙය දුක් ය, මෙය අනාත්ම යැ’ යි මෙසේ

සම්මශ්ගීතවශයෙන් හෝ ආවජ්ජනාදි වූ මනෝද්වාරික වීථිචිත්තයෝ පවතිත් ද, එ කල්හි ඒ ඒ වාස්තු රූපය වෙත වෙත ම ඔවුන් ගේ නිඃශ්‍රයවාස්තුව ද, ඔවුන් ගේ අරමුණ ද වේ. එ හෙයින් ඒ ඒ හෘදයරූපය ඒ ඒ චිත්තෝත්පාදයට වාස්ත්‍වාලම්බනපුරෝජාතප්‍රත්‍යයය වෙයි. මේ වාස්ත්‍වා-ලම්බනපුරෝජාතනිඃශ්‍රය යි. මෙසේ උක්ත පරිදි නිඃශ්‍රය-ප්‍රත්‍යයය ත්‍රිවිධ වේ.

මෙහි දී සූත්‍රාන්ත නයින් ද නිඃශ්‍රයය කියැ යුතු වේ. මේ මිනිස්සු හෝ තිරිසත්තු හෝ වෘක්ෂාදිහු හෝ මහ පොළො-වෙහි පිහිටියෝ ය. පෘථිවිය ජලය ආධාර කොටැති ව ද, ජලය වායුව ආධාර කොටැති ව ද, වායුව ආකාශය ආධාර කොටැති ව ද පිහිටියේ ය. මිනිස්සු ගෙවල්හි ද, මහණහු වෙහෙරෙහි ද, දෙවියෝ දෙව්විමන්හි ද යි මේ ආදීන් සියලු ලෝකප්‍රවෘත්තිය දූත නිඃශ්‍රයප්‍රත්‍යයය දත යුතු යි.

**නිඃශ්‍රයප්‍රත්‍යයදීපනිය යි.**

---

## 9. උපනිඃශ්‍රයප්‍රත්‍යයය (උපනිස්සයපච්චය)

ආලම්බනෝපනිඃශ්‍රය (ආරම්මණූපනිස්සය), අනන්ත-රෝපනිඃශ්‍රය (අනන්තරූපනිස්සය), ප්‍රකෘත්‍යූපනිඃශ්‍රය (පකතූපනිස්සය) යි උපනිඃශ්‍රයප්‍රත්‍යයය තුන්වැදෑරුම්. ඔවුන් අතුරෙන් ආලම්බනෝපනිඃශ්‍රයය ආලම්බනාධිපති-ප්‍රත්‍යයය බඳු ය. අනන්තරෝපනිඃශ්‍රයය අනන්තර ප්‍රත්‍යයය බඳු ය.

ප්‍රකෘත්‍යූපනිඃශ්‍රය කවර යැ? අතීතානාගත ප්‍රත්‍යුත්පන්න වූ ආධ්‍යාත්මික බාහ්‍ය වූ සියලු ම චිත්ත චෛතසික-රූපයෝ ද නිර්වාණ ද ප්‍රඥප්ති ද සියලු ප්‍රත්‍යුත්පන්න චිත්තචෛතසිකධර්මයනට සුදුසු පරිදි ප්‍රකෘත්‍යූපනිඃශ්‍රය වෙති.

එහි අතීත වූ පිරිනිවි අප බුදුරජු ද ධර්‍මය ද ආර්‍ය්‍ය-ශ්‍රාවක සඞ්ඝයා ද, සම්මතිසංඝපරම්පරාව ද පශ්චිම ජනතාවට කුසල් ඉපැත්මට ප්‍රකෘතූපනිඃශ්‍රයප්‍රත්‍යය වේ. එසේ ම ලොවැ අතීත වූ කළුරිය කළ මාපියෝ ද ඇදුරෝ ද පණ්ඩිත මහණබමුණෝ ද, ප්‍රකට වූ නානා තීර්‍ත්‍ථකාචාර්‍ය්‍යයෝද මහර්ඝ ඇති මහානුභාව ඇති පුරාතන රජුහු ද පසු කලැ වූවනට කුසල් ඉපැත්මට හෝ අකුසල් ඉපැත්මට හෝ සුවදුක් ඉපැත්මට හෝ ප්‍රකෘතූපනිඃශ්‍රය වෙත්. ඒ එසේ මැ යි. ඔහු පශ්චිම ජනයන් සඳහා නානාවිධ සද්ධර්‍මප්‍රඥප්තීන් හෝ නානා අසද්ධර්‍මප්‍රඥප්තීන් හෝ නානාවිධ ලෝකෝපකරණ හෝ කලින් ම පිහිටුවූහ. පශ්චිම ජනයෝ ද ඔවුන් විසින් පිහිටුවන ලද දානශීලාදි ධර්‍මයන්හි හෝ ලෝකචාරිත්‍ර කුලගෝත්‍රචාරිත්‍රධර්‍මයන්හි හෝ නානා දෘෂ්ටිවාදයන්හි හෝ නානා කර්‍මායතන-ශිල්පායතන-විද්‍යා ස්ථානයන්හි හෝ ඒ ඒ පිහිටුවා ඇති යම් යම් ගම් නියම්ගම් නුවර කෙත්වත් වැව් පොකුණු ආදීන්හි හෝ ගේ රිය ගැල් නැව් ඔරු හම්බන් ආදීන්හි හෝ රන් රිදී මිණි මුතු ආදීන්හි හෝ දෘශ්‍යාදෘශ්‍ය පිණිස පිළිපදනාහු ලොවැ වැඩෙත්.

අනාගතයෙහි පහළ වන **මෛත්‍රෙය** නම් බුදුරජුහු ද ඔබ දහම ද ඔබ සඟන ද මෙ කලැ බොහෝ දෙනාට පැරුම්පින් පැවැත්මට ප්‍රකෘතූපනිඃශ්‍රයප්‍රත්‍යය වෙත්. අනාගත භවයෙහි ද විඳුනා භවසම්පත් භෝගසම්පත්හු ද මාර්‍ග ඵලනිර්‍වාණසම්පත්හු ද දූන් මේ ප්‍රත්‍යුත්පන්න භවයෙහි සිටින්නවුනට දානශීලාදි පුණ්‍යක්‍රියාවන් ගේ ඉපැත්මට ප්‍රකෘතූපනිඃශ්‍රයප්‍රත්‍යය වෙත්. නිදසුනක් මෙසේ ය: ලොවැ ‘හිමත් සමයෙහි අස්වැන්න ලබන්නමු’යි සිතා වැසි සමයෙහි සීසෑම් වැපිරීම් අරඹත්. ‘වැඩේ නිමි කල්හි ඒ ඒ මුදල් ලබන්නමු’ යි ඒ ඒ වීර්‍ය්‍යයෙන් හෝ නුවණින් කරන කර්‍ම අරඹත් එහි අස්වැන්න ලැබීම ද ඒ ඒ ධන ලැබීම ද ඒ ඒ කර්‍ම පටන්ගැම්මට අනාගත ප්‍රකෘතූපනිඃශ්‍රයප්‍රත්‍යය වේ. ඒ ඒ කර්‍ම ඇරැඹීමත්

අස්වැන්න ලැබීමට ද ඒ ඒ ධන ලැබීමට ද අතීත ප්‍රකෘත්‍යූපනිඃශ්‍රයප්‍රත්‍යය වේ. මෙසේ ම පශ්චිම අනාගත කාලයෙහි නානා කර්මඵල බලාපොරොත්තු වන්නාවූ ජනයෝ පළමු ප්‍රත්‍යුත්පන්න කාලයෙහි නානා පින්කම් අරඹිත්. එහි පුණ්‍යඵලයෝ පුණ්‍යකර්මයනට අනාගත ප්‍රකෘත්‍යූපනිඃශ්‍රයප්‍රත්‍යය වෙත්. පුණ්‍යකර්මයෝ පුණ්‍ය-ඵලයනට අතීත ප්‍රකෘත්‍යූපනිඃශ්‍රයප්‍රත්‍යය වෙත්. එහෙයින් අනාගත ප්‍රකෘත්‍යූපනිඃශ්‍රයය ද අතීත ප්‍රකෘත්‍යූපනිඃශ්‍රයය මෙන් ඉතා මහත් ප්‍රත්‍යයධර්මයෙක් වේ.

ප්‍රත්‍යුත්පන්න බුද්ධාදි ප්‍රත්‍යයයෝ ප්‍රත්‍යුත්පන්න වූ මිනිස්-දෙව්-බඹුනට ද, ප්‍රත්‍යුත්පන්න මා පියෝ ප්‍රත්‍යුත්පන්න පුත්‍රදුහිතෘනට ද ප්‍රත්‍යුත්පන්න ප්‍රකෘත්‍යූපනිඃශ්‍රය නම් වෙත්. එය සුප්‍රකට ම ය.

ආධ්‍යාත්මික ප්‍රකෘත්‍යූපනිඃශ්‍රයධර්මයෝ නම් බුද්ධාදි සර්වඥතක සන්තානයන්හි උපන් ප්‍රත්‍යයධර්මයෝ ය. බාහිර වූ ප්‍රකෘත්‍යූපනිඃශ්‍රය ධර්මයෝ නම් පෘථිවිපර්වත නදී සමුද්‍රාදිහු ද ඒ ඒ වන්නට බොහෝ උපකාරි වූ අරණ්‍ය වන වෘක්ෂ තෘණ පූර්වාන්ත අපරාන්ත ආදිහු ද, චන්ද්‍රසූර්‍ය-ග්‍රහනක්ෂත්‍රාදිහු ද වැසිදිය ගිනි සුළං සිසිල උණුසුම යන ආදිහු දැ යි මේ සියල්ලෝ සත්නට කුසල් ඉපැත්මට හෝ අකුසල් ඉපැත්මට හෝ සුව ඉපැත්මට හෝ දුක් ඉපැත්මට හෝ බලවත් ප්‍රත්‍යයයෝ වෙත්.

මේ ජනයෝ 'මෙ අත්බව්හි දී ම පිරිනිවෙත්නමු' යි බෝධිපාක්ෂික ධර්ම හෝ වඩත් ද 'මතු පහළ වන බුදු කෙනෙකුන් ගේ කාලයෙහි පිරිනිවෙත්නමු' යි පතා පැරුම් දහම් හෝ පුරත් ද, එහි ඒ දහමුන් ගේ ඉපැත්මට නිවන බලවත් ප්‍රත්‍යය වේ.

ලොවැ නානාව්‍යවහාර වූ නාමප්‍රඥප්තිහු ද බුදුසස්නෙහි තෙවළා බණදහම් වූ නාමප්‍රඥප්තිහු ද, ඒ ඒ දෑ දැන ගැන්මට බලවත් ප්‍රත්‍යයයෝ වෙත්.

එහි සංසකෘත ධර්මයෝ වනාහි ප්‍රත්‍යයයක් ඇති කල්හි ම උපදිත්. නැති කල්හි නො උපදිත්. ඉපිද ද, ප්‍රත්‍යයය ඇති කල්හි ම සිටිත්. නැති කල්හි නො සිටිත්. එ හෙයින් ඔවුන් ගේ ඉපැත්මට හෝ සිටීමට හෝ ප්‍රත්‍යය වූ ද කැමැති විය යුතු ම ය. නිවන ද ප්‍රඥප්ති ද අසංසකෘත ධර්මත් අජාත ධර්මත් අනුත්පාද ධර්මත් නිත්‍ය ධර්මත් ධ්‍රැව ධර්මත් වෙති. එහෙයින් ඔවුන්ගේ ඉපැත්මට හෝ සිටීමට හෝ ප්‍රත්‍යයයෙක් නම් නැත් ම ය.

කුශලය කුශලයට උපනිඃශ්‍රය වේ. 'ශ්‍රද්ධාව නිසා දන් දෙයි, සිල් ගනී' යන ආදීන් එය මොනොවට පැහැදිලි ය. එසේ ම 'රාගය නිසා පණිවා කෙරෙයි, අයිනාදන් කෙරෙයි' යන ආදියෙන් ද, 'සත්ප්‍රාය ඍතුව සත්ප්‍රාය භෝජනය නිසා කායික සුව විඳී' යන ආදියෙන් ද, අකුශලය අකුශලයටත් අව්‍යාකෘතය අව්‍යාකෘතයටත් උපනිඃශ්‍රය වීම මොනොවට පැහැදිලි ය.

කුශලය වනාහි අකුශලයටත් බලවත් උපනිඃශ්‍රයය වේ. ඒ මෙසේ ය: දන් දී ඒ දතින් තමා හුවා තබයි, මෙරමා හෙලා බෙණෙයි. එසේ ම සිල්වත් ව සමාධි සම්පන්න ව ප්‍රඥා සම්පන්න ව තමන් උස් තන්හි තබයි, අනුන් හෙලා දකී.

කුශලය අව්‍යාකෘතයට ද බලවත් උපනිඃශ්‍රය වේ. සියලු සිවු බිමට අයත් කුශල කර්මයෝ හෝ ඒ කර්මයනට පිරිවර වූ (සම්බන්ධ වූ) කුසල් හෝ කාලාන්තරයෙහි සිවු බිමට අයත් විපාක අව්‍යාකෘතයනට බලවත් උපනිඃශ්‍රය වෙත්. දානපාරමිතාව එසේ ම ශීලපාරමිතාව නෛෂ්කාම්‍ය-පාරමිතාව ප්‍රඥාපාරමිතාව වීර්‍යපාරමිතාව ක්‍ෂාන්තිපාරමිතාව සත්‍ය පාරමිතාව අධිෂ්ඨාන පාරමිතාව මෛත්‍රී පාරමිතාව උපේක්‍ෂා පාරමිතාව යන මොවුන් පුරන කල්හි එය පුරන නැනැත්තෝ බොහෝ කායික දුක් විඳිත්. ධ්‍යාන-භාවනා-මාර්ගභාවනාහි ද මේ නය ම ය.

අකුශලය කුශලයටත් බලවත් උපනිඃශ්‍රය වේ. මෙසේ ය: මෙහි එක්තරා එකෙක් පව් කොට පසු ව විපිළිසර ඇති ව පාපයේ ප්‍රහාණය පිණිස දාන-ශීල-ධ්‍යාන-මාර්‍ග-කුශලයන් සපයයි. ඒ පාපය එකී කුසලුනට බලවත් උපනිඃශ්‍රය වේ.

අකුශලය අව්‍යාකෘතයට ද බලවත් උපනිඃශ්‍රය වේ. මෙහි බොහෝ දෙනා දුසිරිත් කොට සිවු අපා හි වැටී අපාදුක් විඳිත්. මෙ අත්බව්හි ද ඇතැම්හු තමන් ගේ හෝ අනුන් ගේ හෝ දුශ්චරිතකර්‍මප්‍රත්‍යයෙන් බොහෝ දුක් විඳිත්. කිසි කෙනෙක් දුශ්චරිත කර්‍මයෙන් ධන උපයා සුව විඳිත්. බොහෝ දෙනා රාගමූලක වූ ද ද්වෙෂමූලක වූ ද මෝහමූලක වූ ද දෘෂ්ටිමූලක වූ ද මානමූලක වූ ද බොහෝ දුක් විඳිත්.

අව්‍යාකෘතය කුශලයට ද බලවත් උපනිඃශ්‍රය වේ. ඒ මෙසේ ය: ධනසම්පත්තියෙන් දන් දෙයි, සිල් පුරයි, ප්‍රඥ වඩයි. භාවනාවට සත්ප්‍රාය වූ ආවාසයක් හෝ ලෙණක් හෝ ගුහාවක් හෝ රුකක් හෝ අරණ්‍යයක් හෝ පර්‍වතයක් හෝ ගොදුරු ගමක් හෝ ඍතුසත්ප්‍රාය හෝ ආහාර සත්ප්‍රාය හෝ ලැබ ඒ ඒ භාවනාවක් වඩයි.

අව්‍යාකෘතය අකුශලයට ද බලවත් උපනිඃශ්‍රය වේ. ලොවැ ඇස නිසා ද දූක්ම මුල් කොටැති බොහෝ අකුසල් උපදී. කන් නාසාදිය නිසා ද ඇසීම් ආඝ්‍රාණ කිරීම් ආදිය මුල් කොටැති බොහෝ අකුසල් උපදී. එසේ ම අත් නිසා ද පා නිසා ද ශාස්ත්‍රසම්පත නිසා ද ආයුධසම්පත්-ආදිය නිසා ද බොහෝ අකුසල් උපදී යැ සි කියැ යුතු.

මෙසේ **උපනිඃශ්‍රය ප්‍රත්‍යයය** තුන්වැදෑරුම් ය.

මෙ තන්හි සූත්‍රාන්තයෙහි එන උපනිඃශ්‍රයප්‍රත්‍යයය ද කියැ යුතු. එය හොඳ මිතුරන් නිසා නරක මිතුරන් නිසා ගම නිසා වනය නිසා ද යි මේ ආදීන් බොහෝ සූත්‍රයන්හි ආයේ ය. තව ද නියාම ධර්‍ම පස් දෙනා සත්‍වලෝක

සංඝකාරලෝක අවකාශලෝක යැ යි කියන ලද තුන් ලොවේ අතර නො සිඳී දිගට ම පැවැත්ම පිණිස බලවත් ප්‍රත්‍යයයෝ වෙත්. මෙ කරුණ අප ගේ නියාමදීපනියෙහි අප විසින් විස්තරයෙන් දක්වන ලද්දේ වෙයි.

කවර අරුතින් ආලම්බනෝපනිඃශ්‍රය නම් වේ ද? යත්: පූර්ව අනන්තර චිත්තය ම පශ්චිම අනන්තර චිත්තයා ගේ ඉපැත්ම පිණිස බලවත්නිඃශ්‍රය වන කරුණින් අනන්තරෝප-නිඃශ්‍රය නම් වේ. පූර්ව අනන්තරචිත්තය මව බඳු ය. පශ්චිම අනන්තරචිත්තය පුත්‍රයා බඳු ය මව නමාට අනන්තර වූ පුතු ගේ ඉපැත්ම පිණිස බලවත් උපනිඃශ්‍රය වේ ද එසේ ම පළමු සිතේ පැසීම් සිත ඉපැත්මට උපනිඃශ්‍රය වේ

කවර අරුතින් ප්‍රකෘත්‍යූපනිඃශ්‍රය නම් වේ ද? යත්: ප්‍රකෘතියෙන් ම ලොවැ නුවණැතියනට හෙළි වූ උපනිඃශ්‍රයය ප්‍රකෘත්‍යූපනිඃශ්‍රය (පකතූපනිස්සය) නම් වේ.

මෙහි ද අනන්තරෝපනිඃශ්‍රයයා ගේ අනුභාවය අනතුරු සිතෙහි ම පැතිරු ගනී. ප්‍රකෘත්‍යූපනිඃශ්‍රයානුභාවය වනාහි ඈතට ද පැතිරු යේ ම ය. ඒ එසේ මැ යි. මේ භවයෙහි පළමු දවස්හි හෝ පළමු මාසවලැ හෝ පළමු හවුරුදුවලැ හෝ දුටු, ඇසූ, ආඝ්‍රාණ කළ, රස බැලූ, ස්පර්ශ කළ, සිතූ අරමුණු පසු වනාවෙක එබඳු ප්‍රත්‍යයයක් ඇති කල්හි, හවුරුදු සියයකට පසු නුමුදු මනෝද්වාරයෙහි ආපාතයට එයි. 'මෙ නම් දෑ පෙරු මා විසින් දක්නා ලදී' යි 'අසන ලදූ යි' යන ආදීන් සත්වයෝ එය සිහි කෙරෙත්. උපපාදුක (ඕපපාතික) සත්වයෝ වනාහි පළමු භවය ද සිහි කෙරෙත් එසේ ම මිනිසුන් අතුරෙහි ද ඇතැම් කෙනෙක් ජාතිස්මරණ ඥානය ඇත්තෝ වෙත්. එසේ පෙරු නොයෙක් සිය දහස් ගණන් දැකීම් ඇසීම් ආදි වශයෙන් අරමුණු කළ වස්තූන් අතුරෙන් එක් වස්තුවක් පසු කලෙක දුටු හෝ ඇසූ කෙණෙහි ම නෝවිඥානසන්තානයෙහි පැතිර පවතී.

**උපනිඃශ්‍රයප්‍රත්‍යය(උපනිස්සයපච්චය)දීපනිය යි.**

---

# 10. පුරෝජාතප්‍රත්‍යය (පුරෙජාතපච්චය)

වාස්තුපුරෝජාතප්‍රත්‍යය, ආලම්බනපුරෝජාතප්‍රත්‍යය, වාස්ත්වාලම්බනපුරෝජාතප්‍රත්‍යය යි පුරෝජාතප්‍රත්‍යයය ත්‍රිවිධ ය. ඔවුන් අතුරෙන් වාස්තුපුරෝජාතය ද වාස්ත්වාලම්බනපුරෝජාතය ද ඉහත නිඃශ්‍රයප්‍රත්‍යයයෙහි නිඃශ්‍රය නාමයෙන් කියන ලද්දාහු ම ය.

**ආලම්බනපුරෝජාත** යනු ප්‍රත්‍යුත්පන්න වූ අටොළොස් නිෂ්පන්න රූපයෝ ම ය. ඔවුන් අතුරෙන් ද ප්‍රත්‍යුත්පන්න වූ රූපශබ්දාදි පංචාලම්බනයෝ පංචවිඥාන වීථි සිත් පසට නියමයෙන් ම ආලම්බනපුරෝජාතප්‍රත්‍යයයෝ වෙත්. යම් සේ වීණාශබ්දයෝ වීණාවේ තත්වලැ වීණාදණ්ඩකය ගැටීමෙන් ම උපදිත් ද, එසේ ඇති කලැ ඒ ශබ්දයෝ පුරෝජාත වූ (කලින් ඇති වැ තුබූණු) වෙණෙහි තතුත් වෙණදංඩත් නැති වැ උපදනට නො හැකි වෙත් ද, එසේ ම පංචවිඥානවීථිචිත්තයෝත් වාස්තුද්වාර පසෙහි ආලම්බන පසේ ආපාතාගමනප්‍රත්‍යයයෙන් ම උපදිත්. ආපාතාගමනය ද ඒ වාස්තු ආලම්බන දෙ දෙනා ගේ සම්ප්‍රාප්ත කාලයෙහි ම වෙයි. ඒ කල්හි ඒ ආලම්බන පස ඒ පස් වාස්තූන්හි ම පමණක් නො ව භවාංගමනෝද්වාරයෙහි ද ආපාතයට ඒ ම ය. එහි ආපාතයට පැමිණෙන බැවින් ම ඒ භවාඞ්ගය ද දෙ වරක් සැලී නිරුද්ධ වෙයි. භවාඞ්ගෝපච්ඡේදයෙහි ම ඒ වීථි සිත් උපදී මෙසේ ඇති කල්හි ද ඒ වීථිචිත්තයෝ පුරෝජාත වූ වාස්තුද්වාරාලම්බනයන් ගෙන් තොර ව උපදින්නට නො හැකි වෙති. ඒ සියලු ම අටොළොස් නිෂ්පන්නරූපයෝ නිරුද්ධ ව ඉක්මැ ගියෝ ද වෙත්. නූපන්නෝ ව අනාගතයෝ ද (තව ම නො පැමිණියෝ ද) වෙත් උපන්නෝ ව ප්‍රත්‍යුත්පන්න ද වෙත්. සියල්ලෝ ම මනෝවිඥාන වීථිචිත්තයනට අරමුණු වෙත්. ඔවුන් අතුරෙන් ප්‍රත්‍යුත්පන්නයෝ ම ඔවුනට ආලම්බනපුරෝජාත ප්‍රත්‍යයයෝ වෙත්. යම් විටෙක දුරු හෝ මුවාවෙක හෝ සිටි ඒ ඒ ආලම්බනවස්තුවක් සිතින් ම අරමුණු කෙරේ ද, එ කල්හි ඒ ඒ වස්තුව් ඉදින් ඒ ඒ තැන විද්‍යමාන වේ නම්, ප්‍රත්‍යුත්පන්න නම් වේ.

# 11. පශ්චාජ්ජාතප්‍රත්‍යය (පච්ඡාජාතපච්චය)

පශ්චිම පශ්චිම ප්‍රත්‍යුත්පන්න චිත්තය පුරෝජාත ප්‍රත්‍යුත්පන්න චතුස්සමුත්ථානක රූපශරීරයේ වැඩීමට නැගීමට පශ්චාජ්ජාත ප්‍රත්‍යය වේ. පසු හවුරුදුවලැ වසක් පාසා වස්නා වැසිදිය පළමුවස්හි උපන් පැළැටිවල වැඩීමට නැගීමට පශ්චාජ්ජාතප්‍රත්‍යය වන්නාක් මෙනි.

එහි **පශ්චිම පශ්චිම** චිත්තය යනුයෙන් පළමු භවාඞ්ගය පටන් කොට චුති සිත තෙක් සියලු සිත් කියනු ලැබේ. **පුරෝජාත** යන්නෙන් ප්‍රතිසන්ධිචිත්තය සමග එකට උපන් කර්මජරූපශරීරය ආදි කොට අධ්‍යාත්මසන්තාන-යට ඇතුළත් සියලු චතුස්සමුත්ථානක රූප කය කියනු ලැබේ.

ප්‍රතිසන්ධි සිත හා එකට උපන් කර්මජ රූපශරීරයට ප්‍රථමභවාඞ්ගාදි පසොළොස් භවාඞ්ග චිත්තයෝ පශ්චාජ්ජාත-ප්‍රත්‍යය වෙත්. ප්‍රතිසන්ධි සිත වනාහි ඒ කය හා එකට උපන් බැවින් පශ්චාජ්ජාත නො වෙයි. සොළොස් වන භවාඞ්ග සිත ද ඒ සිරුරේ බිඳෙන ක්‍ෂෙත්‍රයෙහි උපන් බැවින් ප්‍රත්‍යය නො වෙයි. එ හෙයින් පසොළොස් භවාංග චිත්තයෝ යි කියන ලදි.

ප්‍රතිසන්ධිචිත්තයා ගේ ස්ථිතික්‍ෂණයෙහි වනාහි කර්මජ රූපකායය ද ඍතුජ රූපකායය ද යි රූපකාය දෙකෙක් පහළ වේ. භවාඞ්ගක්‍ෂණයෙහි ද එසේ ම ය. ප්‍රථමභවාඞ්ග-යාගේ උත්පාදක්‍ෂණයෙහි වනාහි කර්මජරූපකායය ද ඍතුජ රූපකායය ද චිත්තජරූපකායය ද යි රූපකායයෝ තිදෙනෙක් උපදිත්. යම් විටෙක බාහිරාහාරස්ඵරණය ලැබ අධ්‍යාත්මාහාරය ආහාරජ රූපකායය උපදවා ද, එ තැන් පටන් කොට චතුස්සමුත්ථානක රූපකායයෝ සතර දෙන පහන් දැල්ලමෙන් පවතිත්. ඔහු උත්පාද-ක්‍ෂණය ඉක්මැ ස්ථිතිභාවයෙන් යම්තාක් පවතිත් ද, ඒතාක් පසොළොස් චිත්තයෝ ඒ කායයනට පශ්චාජ්ජාත ප්‍රත්‍යයයෝ වෙත් ම ය.

**වැඩීමට නැඟීමට** යනු චතුසසමුට්ඨානක රූපසන්තතිය ගේ මතුමත්තෙහි වැඩීමටත් නැඟීමටත් ය. ඒ එසේ ම ය. පළමු පළමු සතර රූපකායයෝ පශ්චාජ්ජාත ප්‍රත්‍යයය ඉදිරින් නැවැත නැවැත ලබත් නම්, මෙසේ ඇති කල්හි ඔහු නිරුඩ වන්නාහු ද පසු වැ රූපසන්තති පරම්පරාවන් ගේ වැඩීමටත් නැඟීමටත් මහත්බවටත් ප්‍රත්‍යයයෝ වැ නිරුඩ වෙත්.

**පුරෝජාතප්‍රත්‍යයදීපනිය** යි.

---

## 12. ආසේවනප්‍රත්‍යය

දෙළොස් අකුසල් සිත් ද සතොළොස් ලොවී කුසල් සිත් ද ආවජ්ජන දෙක හැර අටොළොස් ක්‍රියා සිත් ද යන සත්සාළිස් ලෞකික ජවන සිත් ආසේවනප්‍රත්‍යය නමි. ඔවුන් අතුරෙන් නිරතුරු පැවැති ජවනසන්තතියට පැමිණි පළමු පළමු ජවන සිත ආසේවනප්‍රත්‍යය වේ. සතර මඟසිතින් පැසිම් පැසිම් සිත ආසේවනප්‍රත්‍යයෝත්පන්න යි.

**කවර අරුතින් ආසේවන නම් වේ ද? යත්: මතු මත්තෙහි ප්‍රගුණභාවය වඩනු පිණිස ද සථාමබල වඩනු පිණිස ද පරිවාස ගන්වන අරුතින් ආසේවන නම් වේ.**

එහි **ප්‍රගුණභාවය** යනු නැවැත නැවැත හදාළ පාළිපාඨය පහසුවෙන් අමතක නො වී පවත්නාක් මෙන් ජවන සථාන ජවන කෘත්‍ය සංඛ්‍යාත විශේෂ සථාන විශේෂ කෘත්‍යයෙහි පශ්චිම පශ්චිම චිත්තයා ගේ පහසුයෙන් පැවැත්ම යි.

**පරිවාස** යනු කොසෙය්‍ය වසත්‍රයකට නැවැත නැවැත සුවඳ කවන්නාක් මෙන් සිත් සතන්හි නැවැත නැවැත ඇලීම් දූෂිත වීම් ආදි වශයෙන් හෝ නො ඇලීම් දූෂිත නොවීම් ආදි වශයෙන් හෝ වැද ගෙන පැවැත්ම යි.

පළමු ජවන සිත නිරුඬ කල්හි ද එහි ජවනවේගය නිරුඬ නො වෙයි පශ්චිම චිත්තසන්තානය පුරා පැතිර පවතී ම ය. ඒ හෙයින් පැසිම් පැසිම් ජවන සිත උපදිනුයේ ඒ වේගයෙන් ඔසොවන ලදු ව වඩා බලවත් ව උපදී. මෙසේ පළමු සිත තමා ගේ පරිවාසය පැසිම් සිතට ගන්වයි. පැසිම් සිත ද පළමු සිතේ පරිවාසය ගෙන පවතී. මෙසේ ඇති කල්හි ද ඒ ආසේවනවේගය ප්‍රකෘතියෙන් චිත්තවාර සතෙකින් ක්‍ෂයට පැමිණේ. එයින් පසු තදාලම්බන විපාක සිතෙක් හෝ උපදී. භවාඞ්ග චිත්තවාරය හෝ පවතී.

මෙහි සූත්‍රාන්තයෙහි දක්වෙන ආසේවනප්‍රත්‍යයය ද කියැ යුතු. "සතිපට්ඨානය බවයි. සති සම්බොජ්ඣඞ්ගය බවයි. ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය බවයි. සම්මාදිට්ඨිය බවයි. සම්මා සංකප්පය බවයි" යන ආදීන් බොහෝ තන්හි කියන ලදි. එහි 'බවයි' යනු එක් දවසකුත් වඩයි, සත්දවසකුත් වඩයි, එක් මසකුත් වඩයි, සත්මසකුත් වඩයි, එක්හවුරුද්දකුත් වඩයි, හත්හවුරුද්දකුත් වඩයි යන අර්‍ථ යි.

පළමු පළමු භවයන්හි ආසේවිත වූ භාවිත වූ බහුලීකෘත වූ කුසල් හෝ අකුසල් හෝ පසු පසු භවයන්හි වඩ වඩා බලවත් කුසල්වල හෝ අකුසල්වල උත්පත්තියට ආසේවනප්‍රත්‍යය වේ.

අන් කලෙක්හි හෝ අන් භවයෙක්හි එබඳු කුශලාකුශලයන් ගේ ඉපැත්මට ප්‍රත්‍යය උපනිඃශ්‍රයප්‍රත්‍යය නම් වේ. ඔවුන් ගේ ම වඩා බලවත් බව පිණිස වන ප්‍රත්‍යය ආසේවනප්‍රත්‍යය නම් වේ.

ලොවෙහි ද මහත් චිත්තභාවනාකර්මයන්හි වාග්භාවනාකර්මයන්හි කායභාවනාකර්මයන්හි අංගප්‍රත්‍යඞ්ගභාවනාකර්මයන්හි - කර්මායතන - ශිල්පායතන විද්‍යාස්ථානයන්හිත් ආසේවන - භාවන - බහුලීකර්මයන් ගේ නිස්සන්ද ගුණයෝ නම් දක්නාලැබෙත් ම ය. සියලු ක්‍ෂණික ධර්මයන්

මැද මෙ බඳු ආසේවනප්‍රත්‍යයයක්හු විද්‍යමාන බැවින් පුරුෂබල පුරුෂස්ථාමයන් ගේ මතුමත්තෙහි වැඩීම් වශයෙන් බොහෝ කලක් පැවැති පුරුෂකර්මයෝ නිෂ්පත්තියට පැමිණෙත්, සර්‍වඥබුද්ධභාවයට ද යෙත්.

**ආසේවනප්‍රත්‍යයදීපනිය යි.**

---

## 13. කර්‍මප්‍රත්‍යය (කම්මපච්චය).

සහජාතකර්මප්‍රත්‍යය නානාක්‍ෂණිකකර්මප්‍රත්‍යය යි කර්‍ම ප්‍රත්‍යයය දෙ වැදෑරුම්.

එහි ක්‍ෂණත්‍රයයෙන් යුත් සියලු ම කුශල අකුශල අව්‍යාකෘත චේතනාවෝ සහජාතකර්මප්‍රත්‍යය නම්හ. චේතනා සම්ප්‍රයුක්ත සියලු ම චිත්තචෛතසිකධර්මයෝ ද ප්‍රතිසන්ධි සිත හා සමග උපන් කර්මජරූපධර්මයෝ ද ප්‍රවෘත්තිකාලයෙහි සියලු ම චිත්තජ රූපධර්මයෝ ද ඒ ප්‍රත්‍යයයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

අතීත කුශලාකුශල චේතනාවෝ නානාක්‍ෂණික කර්ම-ප්‍රත්‍යය වෙත්. දෙතිස්වැදෑරුම් ලෞකිකවිපාක චිත්ත-චෛතසිකධර්මයෝත් සියලු කර්මජරූපධර්මයෝත් ඒ ප්‍රත්‍යයයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය. කවර අර්ථයෙන් කර්ම නම් වේ ද? යත්: විශේෂ ක්‍රියාව යන අර්ථයෙන් කර්ම නම් වේ චේතනාව වනාහි සියලු කර්මයන්හි දෙටු බැවින් විශේෂක්‍රියාවෙක් වෙයි. එය සියලු කාය වාඞ් මනඃ කර්මයන් එළැඹ සිටි කල්හි ඒ ඒ කර්මයක්හු ගේ ඉපැත්ම පිණිස සම්ප්‍රයුක්ත ධර්මයන් (චෙතෙති) සදයි, සංවිධාන කෙරෙයි, එකට තනා සිටුවයි. එ හෙයින් සියලු කර්මයන්හි දෙටු වෙයි. මෙසේ ක්‍රියාවිශේෂය (විශේෂ ක්‍රියාය) යන අර්ථයෙන් කර්ම නම්. මේ කරණ කොට ගෙන කෙරෙත් නු යි හෝ කර්ම නම්. කුමක් කෙරෙත් ද? කායිකක්‍රියා ද කෙරෙත්, වාචසිකක්‍රියා ද කෙරෙත්,

මානසිකක්‍රියා ද කෙරෙත්. ඔවුන් අතුරෙන් කායිකක්‍රියා යනු ගමන් සිටුම් හිඳුම් යන ආදිහු ද, ඉදිරියට යැම් පෙරළා ඊම් යන ආදිහු ද වෙත්. යටත් පිරිසෙයින් ඇසි පිය නැගීම් හෙළීම් පවා කායිකක්‍රියා ය. වාචසිකක්‍රියා නම් වචන නිකුත් කිරීම ය. මානසිකක්‍රියා නම් මනා සිතීම් නොමනා සිතීම් ය. යටත් පිරිසෙයින් පංච විඤ්ඤාණයන් ගේ දර්ශනකෘත්‍ය - ශ්‍රවණකෘත්‍යාදි හු ද මානසික ක්‍රියා ය. සත්ත්වයෝ මේ සියලු ක්‍රියාවන් චේතනාව කරණ කොට ගෙන සිදු කෙරෙත්, සංවිධාන කෙරෙත්, එහෙයින් ඒ චේතනාව කර්‍ම නම් වේ.

තමා ගේ ප්‍රත්‍යයෝත්පන්නයා හා පහළ වේ නු යි සහජාත නම් වේ. සහජාත වූ කර්මය සහජාතකර්ම නමි. සහජාතකර්ම වැ ප්‍රත්‍යය වූයේ සහජාතකර්මප්‍රත්‍යය යි. සහජාතකර්මභාවයෙන් ප්‍රත්‍යය වූ ධර්මයැ යි සේ යි.

කර්මයා ගේ උත්පත්තික්ෂණය එකෙක. විපාකයා ගේ උත්පත්තික්ෂණය අනෙකෙකැ යි මෙ සේ වෙන් වෙන් උත්පත්තික්ෂණ ඇත්තේ මොහුට නු යි **නානාක්ෂණික** නමි. නානාක්ෂණික වූ කර්මය නානාක්ෂණිකකර්ම යි. නානාක්ෂණිකකර්ම වැ ප්‍රත්‍යයය වූයේ නානාක්ෂණිකකර්ම ප්‍රත්‍යය යි. නානාක්ෂණිකකර්මභාවයෙන් ප්‍රත්‍යය (උපකාර වූ ධර්මය) නානාක්ෂණිකකර්මප්‍රත්‍යය යි කියන ලද්දේ වෙයි. ආසීමාගීසම්ප්‍රයුක්ත චේතනාව තමා ගේ නිරුද්ධියට අනතුරැ ව ම ආසීඑලවිපාකය උපදවයි. ඒ ද නානාක්ෂණික ම වෙයි.

මෙහි ද එක් දනකුශලචේතනාවක් තමා ගේ සහජාත චිත්තචෛතසිකයන් ගේ ද කායික වාචසික ක්‍රියා වූ චිත්තජ රූපයන් ගේ ද සහජාත කර්මප්‍රත්‍යයය වේ. ඒ චේතනාවෙන් මතු අන් කලෙක උපදනා විපාක ස්කන්ධයා ගේ ද කර්මජ රූපස්කන්ධයා ගේ ද නානාක්ෂණිකකර්ම-ප්‍රත්‍යයය වේ. මෙසේ කර්මපථ බවට පැමිණි එක් සුචරිත-

චේතනාව හෝ දුශ්චරිත චේතනාව කාල දෙක්හි ප්‍රත්‍ය-යෝත්පන්න ධර්ම දෙකකට ප්‍රත්‍යශක්ති දෙකෙකින් ප්‍රත්‍යය වේ.

මෙහි ද නානාක්‍ෂණිකකර්මප්‍රත්‍යය යන්නෙහි 'කර්ම' යනු ක්‍රියා විශෙෂය යි (විශේෂ ක්‍රියා යි). එය චනාහි චේතනාව නිරුඬ කල්හි ද තමා නිරුඬ නො වී ඒ චිත්ත-සන්තානය ඔස්සේ යේ ම ය. යම් විටෙක පැසෙන්නට (විපාක දෙන්නට) ඉඩ ලබා ද, එ කලැ ක්‍රියාවිශේෂය ච්‍යුතියට අනතුරු වැ එක් අත්බවෙක් වැ පැසෙයි, පහළ වෙයි. එහෙත් ඉඩක් නො ලබනුයේ භව සියයක් භව දහසක් භව සියදහසක් නුමුදු ඒ සන්තානය අනුව යේ ම ය. මහද්ගත කර්මය චනාහි ඉඩක් ලද කල්හි දෙවෙනි භවයෙහි බඹලොවැ එක් බඹ අත්බවෙක් වැ පහළ වෙයි. මොනොවට මූ කළ කර්ම ඇති බැවින් චනාහි දෙවෙනි භවයෙහි ම ක්‍ෂීණ වෙයි. එ තැනින් එහාට අනුව නො යෙයි.

**කර්‍මප්‍රත්‍යයදීපනිය යි.**

---

# 14. විපාකප්‍රත්‍යය

සතිස්වැදෑරුම් විපාක වූ සහජාත චිත්තචෛතසික ධර්මයෝ විපාකප්‍රත්‍යය වෙත්. ඔහු ම ඔවුනොවුන් ගේ ද ප්‍රතිසන්ධික්‍ෂණයෙහි කර්මජරූපයෝ ද ප්‍රවෘත්තික්‍ෂණයෙහි විපාක සිතින් උපන් චිත්තජරූපයෝ ද විපාක-ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

කවර අරුතින් විපාක නම් වේ ද? යත්: වෙසෙසින් පැසෙන මුහුකුරන අරුතින් විපාක නම් වේ. **'වෙසෙසින් පැසීම'** යනු මෘදු තරුණ භාවය ඉක්මැ විපක්වභාවයට (වෙසෙසින් පැසුණු මුහු කළ බවට) පැමිණීම යි. කවර නම් ධර්මයක්හු ගේ මෘදු තරුණභාවය ද? කවරක්හු ගේ

වෙසෙසින් පැසුණු බව ද? යත්: නානාක්ෂණිකකර්ම-ප්‍රත්‍යයසංඛ්‍යාත අතීත කර්මයාගේ මෘදු තරුණ භාවය යි, ඒ කර්මයාගේ ම වෙසෙසින් පැසුණු බව යි.

එහි චේතනාඅවස්ථා කර්මාවස්ථා නිමිත්තාවස්ථා විපාකාවස්ථා යැ යි එක් කර්මයක්හු ගේ සතර අවස්ථා කෙනෙක් වෙත්.

එයින් ඒ චේතනාව නිරුඩ කල්හි දු එය අයත් ක්‍රියාවිශේෂය නිරුඩ නො වේ. ඒ සිත් අනුව යේ ම ය මේ **කර්මාවස්ථා** නම් වේ.

**නිමිත්තාවස්ථා** යනු ඒ කර්මය යම් කලෙක පැසෙන්නට ඉඩ ලබා ද, එ කලැ මරණාසන්න කාලයෙහි ඒ පුද්ගලයා ගේ ඒ කර්මය ම හෝ එළැඹැ සිටී. ඒ පුද්ගල තෙම එ කලැ දන් දෙන්නක්හු මෙන් සිල් රකින්නක්හු මෙන් පණිවා හෝ කරන්නක්හු මෙන් වෙයි. කර්මනිමිත්ත හෝ එළැඹ සිටියි. දානවස්තු (දෙන දෑ) ආදි වූ හෝ ආයුධ ආදි වූ හෝ එයින් අන්‍ය වූ හෝ පූර්වයෙහි ඒ කර්මයට උපකරණ වූ අරමුණක් එකල්හි ඒ පුද්ගලයා ගේ අතට පැමිණියාක් මෙන් වෙයි. ගති නිමිති හෝ එළැඹැ සිටී. දෙව්විමන් ආදි වූ හෝ නිරයේ ගිනිජල් ආදි වූ හෝ මතු උපදනා භවයෙහි ලැබියැ යුතු හෝ වින්ද යුතු හෝ අරමුණක් එ කල්හි දෘශ්‍යමාන වෙයි (සිතට පෙනෙයි). මේ **නිමිත්තාවස්ථා** නම් වේ

**විපාකාවස්ථා** යනු ඉදින් ඒ පුද්ගල තෙම එසේ එළැඹැ සිටි ඒ කර්මය හෝ කර්මනිමිත්තය හෝ ගති-නිමිත්තය හෝ මේ යම් එක් අරමුණක් නොමුදනුයේ (සිතින් ඉවත නො ලන්නේ සිතින් ගන්නේ) ම මැරේ ද, එ කල්හි ඒ කර්මය ඒ භවයෙහි විපාක දෙයි. ඒ කර්මය ඒ භවයෙහි එක් අත්බවෙක් ව පහළ වෙයි. එහි පළමු තුන් අවස්ථාහි ඒ කර්මය මෘදු තරුණ වූයේ වෙයි. එහෙත් පශ්චිම විපාකාවස්ථාවට පැමිණ වෙසෙසින්

පැසුණේ මුහු කළේ වෙයි. එ හෙයින් **'වෙසෙසින් පැසීම (විපච්චනය) නම් මාදු තරුණ භාව ඉක්මැ විපක්ව භාවයට පැමිණීම යැ'** යි කියන ලදි. මෙසේ වෙසෙසින් පැසුණු බවට පැමිණි චිත්තචෛතසික ධර්මසමූහය **විපාක** නම් වේ.

යම් සේ අඹපල යම් කලෙක වෙසෙසින් පැසුණු බවට පැමිණේ ද, එකලැ හැම අයුරින් සිනිඳු ස්වභාවය ඇතියේ වෙයි ද, එ පරිද්දෙන් ම විපාකධර්මයෝ නම් උත්සාහ නැත්තෝ ව ව්‍යාපාර නැත්තෝ ව සම්ප්‍රකාර-යෙන් ශාන්ත ස්වභාවය ඇත්තෝ වෙත්. ඔවුන් ශාන්ත ස්වභාවය ඇති බැවින් ම භවාංගචිත්තයන් ගේ අරමුණ ඔවුනට අප්‍රකට වෙයි. භවාංගයෙන් නැඟී සිටින කල්හි ඒ අරමුණ නො දනී. ඒ එසේ මැ යි රැ නිදන්නහුට පළමු භවයෙහි මරණාසන්න කාලයේ සිතින් ගත්නා ලද යම් එක් කර්මාදි අරමුණෙක එල්බැ භවාංගශ්‍රෝතස පවත්නේ නමුදු, ඒ භවාංගශ්‍රෝතස ගේ ඒ අරමුණ ඇරැබැ 'මගේ මෙයට පෙර අත්බැවෙහි මෙ නම් අරමුණෙක් මා විසින් දක්නා ලදැ' යි දන්නා කිසි ම චිත්තවීථියක උත්පත්තියට ප්‍රත්‍යය නො වෙයි. ඒ පුද්ගල තෙම නිදන කල්හි දු නැඟී සිටුනා කල්හි දු පළමු භවයෙහි සිදු වූ ඒ නිමිත්ත නො දනී. මෙසේ උත්සාහ-රහිත ව්‍යාපාරරහිත ශාන්තරූපභාවයෙන් උපකාරක වන බව **විපාකප්‍රත්‍යය භාවය** නමි.

**විපාකප්‍රත්‍යයදීපනිය** යි.

---

## 15. ආහාර ප්‍රත්‍යය

රූපාහාරප්‍රත්‍යය අරූපාහාරප්‍රත්‍යය යැ යි ආහාර-ප්‍රත්‍යය දෙවැදෑරුමි.

ඔවුන් අතුරෙන් රූපාහාරප්‍රත්‍යය නම් කබලීකාරාහාර නම් වූ ඕජෝරූපය යි. එය ද ආධ්‍යාත්මාහාර බාහ්‍යාහාර යැ යි දෙවැදෑරුමි. කබලීකාරාහාරය වළඳන සත්වයන් ගේ

සියලු ම චතුසසමුට්ඨානික රූපධර්මයෝ ඒ දෙවැදෑරුම් රූපාහාරයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය. (ඒ ආහාර ප්‍රත්‍යයයෙන් පහළ වූවෝ ය)

අරූපාහාරය වනාහි ස්පර්ශාහාර මනසඤ්චේතනාහාර විඥානාහාර යැ යි ත්‍රිවිධ යි. මේ තුන් ආහාරයෝ ම සහජාත වූ නාමරූප ධර්මයනට ආහාරප්‍රත්‍යයයෝ වෙත්. සහජාත වූ නාමරූප ධර්මයෝ ද ඔවුන් ගේ ප්‍රත්‍යයෝත්-පන්නයෝ ය.

කවර අරුතින් ආහාර නම් වේ ද? යත්: බොහෝ සේ හරන (ගෙන යන) අරුතින් ආහාර නම් වේ 'බොහෝ සේ හරන (ගෙන යන)' යනු ද දැඩි ලෙස පවත්වන යන අර්‍ථ යි. බොහෝ කලක් සිටීමට, වැඩීමට, නැඟීමට, විපුල බවට රුකුල් දෙන අරුතින් ය යනු එයින් කියන ලදි. ජනන කෘත්‍යයෙන් යුක්ත වූ ද ආහාරය උපස්තම්භන කෘත්‍යය ප්‍රධාන කොට ඇත්තේ වෙයි.

එහි දෙවැදෑරුම් රූපාහාර තෙමේ අධ්‍යාත්ම සන්තානයෙහි චතුසසමුට්ඨානික රූපකායය වඩාලනුයේ බොහෝ සෙයින් ගෙන යා නු යි, දැඩි ලෙස පවත්වානු යි, බොහෝ කලක් යවානු යි ඒ ඒ ආයුෂකාලපයේ අවසානයට පමුණුවා නු යි **ආහාර** නම්.

ස්පර්ශාහාරය අරමුණු කෙරෙහි ඉෂ්ටානිෂ්ට රසය නික්මවනුයේ සම්ප්‍රයුක්ත ධර්මයන් බොහෝ සේ (දැඩි ලෙස) පවත්ව යි. මනස්සඤ්චේතනාහාරය කායවාඞ්මනඃ කර්මයන්හි උත්සාහය උපදවනුයේ, සම්ප්‍රයුක්තධර්මයන් බොහෝ සෙයින් පවත්වයි. විඥානාහාර තෙම ආලම්බන විජානනාර්ථයෙන් (අරමුණු දන්නේ ය යන අරුතින්) පූර්වඞ්ගමකෘත්‍යය උසුලනුයේ, සම්ප්‍රයුක්ත ධර්මයන් බෙහෙවින් ගෙන යා නු යි, දැඩිකොට පවත්වානු යි, දීර්‍ඝ කාලයක් යවා නු යි ආහාර නම්. සම්ප්‍රයුක්ත ධර්මයන් බොහෝ සේ ගෙන යන්නේ සහජාතරූප ධර්මයන් ද බොහෝ සේ ගෙන යේ ම ය.

මෙහි සූත්‍රාන්තනයයස ද කියැ යුතු. කුරුල්ලෝ වනාහි යම්සේ ඇස්වලින් දිශානුදිශාවන් පැහැදිලි කොට ගෙන, පියාපත්වලින් රුකින් රුකට වනයෙන් වනයට අහසින් ගොස්, මුවතුඩින් ඵලාඵලයනට ඇන වළඳන්නාහු දිවිහිම් කොට යැපෙත් ද, එසේ ම මේ සත්හු ද විඥාන සයින් අරමුණු පෙහෙළි කොට ගෙන මනස්සඤ්චෙතනාහාර සයින් ආලම්බන වස්තූන් ලබනු පිණිස උත්සාහ කොට ස්පර්ශාහාර සයින් ආලම්බනයන්හි රසය පහළ වන්නක් කොට සුවදුක් විඳිත්. විඥානවලින් හෝ අරමුණු දැන නාමරූපසම්පත්තිය සිදු කෙරෙත්. ස්පර්ශවලින් ආලම්බනයන්හි රසය පහළ වන්නක් කොට, අරමුණු රස විඳිනා වේදනාව සම්පාදනය කොට, තෘෂ්ණාව ගේ විපුල බවට පැමිණෙත්. චේතනාවලින් තෘෂ්ණාමූලක වූ නානා කර්ම රැස් කොට භවයෙන් භවයට යෙත්. මෙසේ ආහාරධර්මයන් ගේ මහත් වූ ආහාරකෘත්‍යය දත යුතු.

**ආහාරප්‍රත්‍යයදීපනිය** යි.

---

## 16. ඉන්ද්‍රියප්‍රත්‍යය

සහජාතේන්ද්‍රියප්‍රත්‍යය, පුරෝජාතේන්ද්‍රියප්‍රත්‍යය, රූපජීවිතේන්ද්‍රියප්‍රත්‍යය යි ඉන්ද්‍රියප්‍රත්‍යයය ත්‍රිවිධ ය.

එහි ජීවිතින්ද්‍රිය මනින්ද්‍රිය සුඛින්ද්‍රිය දුක්ඛින්ද්‍රිය සෝමනස්සින්ද්‍රිය දෞමනස්සින්ද්‍රිය උපෙක්ඛින්ද්‍රිය සද්ධින්ද්‍රිය විරියින්ද්‍රිය සතින්ද්‍රිය සමාධින්ද්‍රිය පඤ්ඤින්ද්‍රිය අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය අඤ්ඤින්ද්‍රිය අඤ්ඤාතාවින්ද්‍රිය යන පසළොස් ඉන්ද්‍රියධර්මයෝ සහජාතේන්ද්‍රියප්‍රත්‍යය නම්හ. ඔවුන් හා එක්ව උපන් චිත්තචෛතසිකධර්මයෝ ද රූපධර්මයෝ ද ඒ ප්‍රත්‍යයයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

චක්ඛුන්ද්‍රිය සෝතින්ද්‍රිය ඝාණින්ද්‍රිය ජිව්හින්ද්‍රිය කායින්ද්‍රිය යන පංචේන්ද්‍රියරූපයෝ පුරෝජාතේන්ද්‍රියප්‍රත්‍යය වෙති. පංචවිඥානචිත්තචෛතසිකධර්මයෝ ඒ පුරෝජාතේන්ද්‍රියප්‍රත්‍යයයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ යි.

එක් රූපජීවිතේන්ද්‍රියය රූපජීවිතේන්ද්‍රියප්‍රත්‍යය යි. ජීවිතරූපය හැර ඉතිරි සියලු කර්මජරූපයෝ ඒ රූපජීවිතේන්ද්‍රියප්‍රත්‍යයයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

කවර අරුතින් ඉන්ද්‍රිය නම් වේ ද? යත්: ඊශ්වර බව (ඉසුරු බව) යන අරුතින් ඉන්ද්‍රිය නම් වේ. එහි කිමෙක ඊශ්වරභාවයෙක් ද? කවර කවර කෘත්‍යයෙක්හි ඊශ්වර භාවයෙක් ද? යත්: තම තමා ගේ කෘත්‍යයෙහි ඊශ්වර භාවය යි. නාමජීවිතේන්ද්‍රිය යනු සම්ප්‍රයුක්තධර්මයන් ගේ ජීවනකෘත්‍යයෙහි ඊශ්වර බව ය. ජීවනකෘත්‍යය යනු ආයුෂ්මදීනකෘත්‍යය යි. සන්තතිය ගේ සිටීම, චිරකාලසිටීම කෘත්‍යය යි යනු අර් යි. මනඉන්ද්‍රියය යනු අරමුණු ගැනුම් කිසෙහි සම්ප්‍රයුක්තධර්මයනට ඊශ්වර භාවය යි. සෙසු ඉන්ද්‍රියාර් මෙයින් පෙර ඉන්ද්‍රියයමක දීපනීයෙහි කියන ලදුයේ ම ය.

ඉත්ථින්ද්‍රිය පුරිසින්ද්‍රිය යන ඉන්ද්‍රිය වූ ම ධර්ම දෙක ඉන්ද්‍රියප්‍රත්‍යයයෙහි කවර හෙයින් වෙන ම නො ගන්නා ලද දැ? යි ප්‍රශ්න කළ හැක්ක. ඔවුන් දෙදෙනා ගේ ප්‍රත්‍යයකෘත්‍යයක් නැති බැවින් එසේ නොගන්නාලදූ යි කිය යුතු. ජනන (උපදවන) කෘත්‍යය ද උපස්ථම්භන (රුකුල් දෙන) කෘත්‍යය ද අනුපාලනකෘත්‍යය දූ යි ප්‍රත්‍යයකෘත්‍යය ත්‍රිවිධ ය. එහි යම් ප්‍රත්‍යයෙක් ප්‍රත්‍යයෝත්පන්නධර්මයා ගේ ඉපැත්ම පිණිස ප්‍රත්‍යය වේ ද, යමක් නැති කල්හි ප්‍රත්‍යයෝත්පන්නධර්මය නො උපදී ද, ඔහුගේ ප්‍රත්‍යයකෘත්‍යය ජනනකෘත්‍ය නම්. අනන්තරප්‍රත්‍යය එයට නිදසුනි. යම් ප්‍රත්‍යයෙක් ප්‍රත්‍යයෝත්පන්නධර්මයා ගේ සිටීමට ද වැඩීමට ද නැගීමට ද ප්‍රත්‍යය වේ ද යමක් නැති කල්හි ප්‍රත්‍යයෝත්පන්නධර්මය නො සිටී ද, නො වැඩේ ද, නො නැගේ ද, ඔහු ගේ ප්‍රත්‍යයකෘත්‍යය **උපස්ථම්භනකෘත්‍ය** (රුකුල් දීම) නම්. පශ්චාත්ජාතප්‍රත්‍යයය මෙයට නිදසුනි. යම් ප්‍රත්‍යයෙක් ප්‍රත්‍යයෝත්පන්නධර්මයා ගේ පැවැත්මට ප්‍රත්‍යය වේ ද, යමක් නැති ව

ප්‍රත්‍යයෝත්පන්නධර්මය බොහෝ කලක් නො පවතී ද, සන්තති ගමන සිදේ ද, ඔහුගේ ප්‍රත්‍යයකෘත්‍යය අනුපාලනකෘත්‍ය නම්. රූපජීවිතේන්ද්‍රියප්‍රත්‍යය එයට නිදසුනි. මේ ඉන්ද්‍රියධර්ම දෙක වනාහි ඒ තුන් ප්‍රත්‍යයකෘත්‍යයන් අතුරෙන් එක් කෘත්‍යයකුදු නො කෙරෙත්. එහෙයින් මේ ඉත්ථින්ද්‍රිය පුරිසින්ද්‍රිය දෙක ඉන්ද්‍රියප්‍රත්‍යයෙහි වෙන ම නො ගන්නා ලදී.

මෙසේ ඇති කල්හි මේ ධර්මයෝ දෙදෙන ඉන්ද්‍රියයෝ යි නො කියැ යුතු ද? යත්: නො කියැ යුතු නො වෙත්. කවර හෙයින්? ඉන්ද්‍රියකෘත්‍යය විද්‍යමාන බැවිනි. මොවුන් දෙදෙනා ගේ ඉන්ද්‍රියකෘත්‍යය යනු කිමෙක් ද? යත්: ලිඞ්ග-නිමිත්ත-කුත්ත-ආකල්පයන්හි ඊශ්වර බව ඉන්ද්‍රියකෘත්‍යය යි. ඒ එසේ ම ය. යම් පුහුලක්හු ගේ ප්‍රතිසන්ධික්ෂණයෙහි ස්ත්‍රීන්ද්‍රියරූපය උපදී නම්, ඔහු ගේ සන්තානයෙහි කර්මාදි සතර ප්‍රත්‍යයයන් ගෙන් උපන් පංචස්කන්ධධර්මයෝ ස්ත්‍රී බව පිණිස මුහුකුරත්. ඒ අත්බව ඒකාන්තයෙන් ස්ත්‍රීලිංග-ස්ත්‍රීනිමිත්ත-ස්ත්‍රීකුත්ත-ස්ත්‍ර්‍යාකල්පයන් ගෙන් යුක්ත වෙයි. අන් සැටියෙකින් නො වෙයි ස්ත්‍රීන්ද්‍රියරූපය ද ඒ පංචස්කන්ධයන් නො උපදවයි. එයට උපස්තම්භ ද නො දෙයි. අනුපාලනය ද නො කෙරෙයි. වැලි ඒ ධර්මයෝ තමතමන් ගේ ප්‍රත්‍යයන් ගෙන් උපදනාහු 'මෙසේ මේසේත් උපදිත් ව' යි අණ කරන්නවුන් මෙන් ඔවුන් කෙරෙහි තමන් ගේ ආනුභාව පවත්වත්. ඒ ධර්මයෝත් එ පරිද්දෙන් ම උපදිත්. අන් සැටියෙකින් නො උපදිත්. මේ ස්ත්‍රීන්ද්‍රියරූපයා ගේ ස්ත්‍රීලිඞ්ගාදීන්හි ඊශ්වරබව ය. පුරුෂේන්ද්‍රියරූපයා ගේ පුරුෂලිඞ්ගාදීන්හි ඊශ්වරභාවයෙහි ද මේ නය ම ය. මෙසේ මේ ධර්මයෝ දෙදෙන ලිඞ්ගාදීන්හි ඉන්ද්‍රියකෘත්‍යය ඇති බැවින් ඉන්ද්‍රිය නම්වෙත්.

හෘදයවාස්තුරූපය වනාහි විඥානධාතු දෙකට නිඃශ්‍රයවාස්තුකෘත්‍යය සිදු කරනුයේ නුමුදු ඔවුන් කෙරෙහි ඉන්ද්‍රිය-

කෘත්‍යයක් සිදු නො කෙරෙයි. භාවනායෙන් වැඩූ සිතැති පුගුලාට හෘදයවාස්තුරූපය පහන් වූ කල්හි ද නො පහන් වූ කල්හි ද මනෝවිඥනධාතුහු එය අනුව පවත්නාහු වෙති.

**ඉන්ද්‍රියප්‍රත්‍යයදීපනිය යි.**

## 17. ධ්‍යානප්‍රත්‍යය

විතර්ක විචාර ප්‍රීති සොම්නස් දොම්නස් උපේක්ෂා ඒකාග්‍රතා යන සත් ධ්‍යානාඞගයෝ ධ්‍යානප්‍රත්‍යය නම් වෙති. පංචවිඥන හැර ඒ ධ්‍යානාංග හා උපන් චිත්ත-චෛතසිකධර්මයෝ ද රූපධර්මයෝ ද ඒ ප්‍රත්‍යයයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

කවර අරුතින් ධ්‍යාන නම් වේ ද? උපනිධ්‍යායනාර්ථ-යෙන් ධ්‍යාන නම් වේ. උපනිධ්‍යායන යනු සිතින් අරමුණට ළං වැ බැලීම යි. යම් සේ දුනුවායෙක් දුර සිට කුඩා ඉලක්ක මඩලෙහි ඊය පිවිස්වන්නේ අත්වලින් ඊය සෘජුත් නිශ්චලත් කොට ලක්මඩල ද ප්‍රකට කොට ගෙන ඇසින් එය ළං ව බලනුයේ පිවිස්වා ද, ඒ පරිද්දෙන් ම මේ යටකී අඞගවලින් සිත සෘජුත් නිශ්චලත් කොට අරමුණ ද ප්‍රකට කොට ළං වැ බලන පුද්ගල තෙමේ **උපනිධ්‍යායනය කෙරේ** යැ යි කියනු ලැබේ. මෙසේ ළං වැ බලා යම් කිසි කායකර්මයක් හෝ වාක්කර්මයක් හෝ මනඃකර්මයක් හෝ කරනුයේ නො වරදවා ම කෙරෙයි.

එහි **කායකර්ම** යන්නෙන් ඉදිරියට යැම් පෙරළා ඊම් ආදිය කියනු ලැබේ. **වාක්කර්ම** යන්නෙන් අක්ෂර-වර්ණයන් ගෙන් පරිපූර්ණ වාග්භේද කිරීම කියනු ලැබේ. **මනඃකර්ම** යන්නෙන් සිතින් යම් කිසි අරමුණු මතු කොට ගැන්මෙක් කියනු ලැබේ. දන්දීම හෝ පණිවා කිරීම හෝ එසට අවශ්‍ය ධ්‍යානාඞගවලින් තොරව දුර්වල සිතින් කරන්නට නො හැකි වෙයි. සෙසු කුශලාකුශල කර්ම-යන්හි ද මේ ක්‍රමය යි.

මේ අරුත ද විතර්කාදි ධ්‍යානාඞ්ගධර්මයන් ගේ වෙන් වෙන් සවභාවලක්‍ෂණවලින් දැක්විය යුතු. **විතර්කය** සම්ප්‍රයුක්තධර්මයෙහි අරමුණ නංවන සවභාවය ඇත්තේ ය. එය සිත අරමුණෙහි දැඩි කොට යොදා ලයි. **විචාරය** අරමුණ පිරිමදිත සවභාවය ඇත්තේ ය. එය සිත අරමුණෙහි දැඩි කොට සංයුක්ත කෙරෙයි (එක් කොට යොදයි). **ප්‍රීතිය** අරමුණ ප්‍රිය කරන සවභාවය ඇත්තේ ය. එය සිත අරමුණෙහි පරිතුෂ්ට කෙරෙයි. තුන් **වේදනාවෝ** ම අරමුණු රස විඳුනා සවභාවය ඇත්තෝ ය. ඔහු ද සිත අරමුණෙහි ඉටු අනිටු මැදහත් රස විඳුනා කෘත්‍යයෙන් දැඩි ලෙස එයට බැඳුණක්හු කෙරෙත්. **ඒකාග්‍රතාව** සමාධානලක්‍ෂණ ය (අරමුණෙහි පිහිටා සිටීම) ඇතියේ ය. එය ද සිත අරමුණෙහි නිශ්චල කොට තබයි.

**ධ්‍යානප්‍රත්‍යයදීපනිය යි.**

---

## 18. මාර්ගප්‍රත්‍යය

දෙළොස් මාර්ගාඞ්ගයෝ මාර්ගප්‍රත්‍යය යි. ඒ මාර්ගාඞ්ගයෝ නම් සම්‍යග්දෘෂ්ටි සම්‍යක්සඞ්කල්ප සම්‍යග්වචන සම්‍යක්-කර්මාන්ත සම්‍යගාජීව සම්‍යග්ව්‍යායාම සම්‍යක්සමෘති සම්‍යක්සමාධි මිථ්‍යාදෘෂ්ටි මිථ්‍යාසඞ්කල්ප මිථ්‍යාව්‍යායාම මිථ්‍යාසමාධි යන දෙළොස ය. සෙසු **මිථ්‍යාවචන මිථ්‍යාකර්මාන්ත මිථ්‍යාආජීව** යන තුන විශේෂ චෛත-සිකධර්ම කෙනෙක් නො වෙත්. මෘෂාවාදාදි වශයෙන් පැවැති සතර අකුශලධර්මයනට ව්‍යවහාර වූ නම් ය. එ හෙයින් ඔහු මාර්ගප්‍රත්‍යයෙහි වෙත ම නො ගන්නා ලදහ. සියලු සහේතුක චිත්තචෛතසික ධර්මයෝ ද සහේතුක-චිත්තසහජාත (සහේතුක සිත් හා උපන්) රූපධර්මයෝ ද මාර්ගප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ යි.

කවර අරුතෙකින් **මාර්ග** නම් වේද? යත්: සුගතිය අතට ද දුගතිය අතට ද නිවන අතට ද පමුණුවන අරුතින්

මාර්ගී නම් වේ. සම්‍යග්දෘෂ්ටි ආදි සම්‍යක්මාර්ගාංග අට සුගතිය අතට ද නිවන අතට ද පැමිණීම පිණිස පවත්නාහ. සතර මිථ්‍යාමාර්ගාඞ්ගයෝ දුගති අතට පැමිණීම පිණිස පවත්නාහ.

එහි ධ්‍යානප්‍රත්‍යයය අරමුණෙහි සිත් සෘජු කෙරෙයි, ස්ථිර කෙරෙයි, අර්පණාප්‍රාප්ත කෙරෙයි. **අර්පණාප්‍රාප්ත** යනු ගැඹුරු දියෙහි බහා ලන ලද මත්ස්‍යයකු මෙන් කිසුණුනිමිති ආදි නිමිත්තාලම්බනයෙහි අනුප්‍රවිෂ්ට වූ සිත යි. මාර්ගප්‍රත්‍යය තෙම සසරමගෙහි චේතනාකර්මය ද නිවන්මගෙහි භාවනාකර්මය ද සෘජු කෙරෙයි, තහවුරු කෙරෙයි, කර්මපථප්‍රාප්ත කෙරෙයි, වැඩීම නැඟීම මහත් බව කෙරෙයි අන්‍යභූමියකට පැමිණියක් කෙරෙයි. මේ මෙකී ප්‍රත්‍යය දෙක අතර වෙනස යි.

එහි **කර්මපථප්‍රාප්ත** යනු ප්‍රාණඝාතාදි කුශලාකුශල කර්මයන් අඞ්ගසම්පූර්ණ වීමෙන් ප්‍රතිසන්ධිය දීමෙහි සමර්ථ බවයැ යි කියන ලද කර්මගතියට පැමිණි චේතනා කර්මය යි. **අන්‍යභූමියකට පැමිණියක්** (භූමන්තරපත්ත) යනු භාවනා පිළිවෙළින් කාමභූමිය පටන් කොට ලෝකෝත්තරභූමිය තෙක් එක් ඉරියව්වෙහි දු මතු මතු බිමට පැමිණි භාවනාකර්මය යි. මේ අර්ථය ද ධ්‍යාන-ප්‍රත්‍යයෙහි කී නයින් සම්‍යග්දෘෂ්ටිආදි වූ මාර්ගාඞ්ගධර්මයන් ගේ වෙන වෙන ස්වභාවලක්ෂණවලින් දැක්වියැ යුතු.

**මාර්ගප්‍රත්‍යයදීපනිය යි.**

---

## 19. සම්ප්‍රයුක්තප්‍රත්‍යය (සම්පයුත්තපච්චය).

සම්ප්‍රයුක්තප්‍රත්‍යය විප්‍රයුක්තප්‍රත්‍යය යනු එක් විකයෙකි. අස්තිප්‍රත්‍යය නාස්තිප්‍රත්‍යය යනු තවත් විකයෙකි. විගතප්‍රත්‍යය අවිගතප්‍රත්‍යය යනු අන් විකයෙකි. මේ තුන් ප්‍රත්‍යයවිකයෝ වෙන් වූ විශේෂ ප්‍රත්‍යය කෙනෙක් නො වෙත්. පළමු ආ ප්‍රත්‍යයන් අතුරෙන් ඇතැම්

ප්‍රත්‍යය කෙනෙක් තමන් ගේ ප්‍රත්‍යයෝත්පන්නයන් හා එක් වැ යෙදුණෝ වැ ප්‍රත්‍යය බවට යෙත්. ඇතැම්හු විප්‍රයුක්ත ව ද, ඇතැම්හු විද්‍යමාන ව ද, ඇතැම්හු අවිද්‍ය-මාන ව ද, ඇතැම්හු විගත ව (පහ ව) ද, ඇතැම්හු අවිගත ව (නොපහ ව) ද, ප්‍රත්‍යය බවට යෙත් යැ යි දක්වනු පිණිස මේ යථෝක්ත ප්‍රත්‍යයවිකයෝ කියන ලදහ.

මෙහි ද **"ඝාත්‍යායනය, ඇත යන මෙය එක් අන්තයෙක. ඝාත්‍යායනය, නැත යන මෙය දෙවෙනි අන්තය යැ."** යන මෙ බඳු තන්හි **'ඇත'** (අත්ථි) **'නැත'** (**නත්ථි**) යන ශබ්දයෝ ශාශ්වත උච්ඡේදයන්හි වැටෙත්. එ හෙයින් මෙ බඳු අර්ථ වළක්වනු පිණිස නැවත **විගතවිකය** කියන ලදී.

සියලු ම සහජාත චිත්තචෛතසික ධර්මයෝ එකෙක් අනෙකක්හු ගේ ප්‍රත්‍යය ද ප්‍රත්‍යයෝත්පන්න ද වෙත්.

කවර අරුතෙකින් **සම්ප්‍රයුක්ත** නම් වේ ද? යත්: එකට උපදනා බව, එකට නැසෙන බව, එක ම වාස්තුවක් ඇති බව, එක ම ආරම්මණක් ඇති බව යන මේ සතර සම්ප්‍රයෝගයන් ගෙන් සමන්විත ව සංයුක්ත ව **ඒකී භාවයට පැමිණියේ** සම්ප්‍රයුක්ත නමි.

එහි **ඒකී භාවයට පැමිණියේ** යන්නෙහි අර්ථය මෙසේ යි: චක්ෂුර්විඥානය ස්පර්ශාදි චෛතසික සත හා එක් වීමට ගියේ දර්ශන (දැකීම) යැ යි එක් ව්‍යවහාරයට යෙයි. මේ අෂ්ට ධර්මයෝ වෙන් වෙන් ව ව්‍යවහාරයට නො යෙත්. වෙන් වෙන් කොට (ලිහා) දැන ගනු හැකි නො වේ. සෙසු සියලු චිත්තෝත්පාදයන්හි ද මේ නය ම ය.

**සම්ප්‍රයුක්තප්‍රත්‍යයදීපනිය යි.**

---

## 20. විප්‍රයුක්තප්‍රත්‍යය

සහජාතවිප්‍රයුක්ත ය, වාස්තුපුරෝජාතවිප්‍රයුක්ත ය. වාස්ත්වාලම්බනපුරෝජාතවිප්‍රයුක්ත ය පශ්චාජ්ජාතවිප්‍රයුක්ත යැ යි විප්‍රයුක්තප්‍රත්‍යය ය චතුර්විධ ය.

එහි සහජාතවිප්‍රයුක්ත නම් සහජාතප්‍රත්‍යය ද එහි ප්‍රත්‍යයෝත්පන්න ද වූ නාමරූප අතුරෙන් **නාමය** හෝ **රූපයට, රූපය** හෝ **නාමයට** විප්‍රයුක්ත ව ප්‍රත්‍යය වේ. එහි **නාමය** යනු ප්‍රවෘත්තිකාලයෙහි වූ සතර නාමස්කන්ධයට අයත් ධර්ම යි. **රූපයට** යනු චිත්තජරූපයට ය. **රූපය** යනු ප්‍රතිසන්ධික්ෂණයෙහි හෘදයවාස්තුරූපය යි. **නාමයට** යනු පිළිසිඳ ගන්නා කෙණෙහි මූලින් ම ඇති වන නාමස්කන්ධ සතරට අයත් නාමධර්මයනට ය සෙසු විප්‍රයුක්ත ප්‍රත්‍යයයෝ තිදෙන ම ඉහත දී බෙදා, දක්වන ලද්දාහු ම ය.

**විප්‍රයුක්තප්‍රත්‍යයදීපනිය** යි.

---

## 21. අස්තිප්‍රත්‍යය

සහජාතාස්තිප්‍රත්‍යය. වාස්තුපුරෝජාතාස්තිප්‍රත්‍යය. ආලම්බනපුරෝජාතාස්තිප්‍රත්‍යය, වාස්ත්වාලම්බනපුරෝජාතාස්තිප්‍රත්‍යය, පශ්චාජ්ජාතාස්තිප්‍රත්‍යය, රූපාහාරාස්තිප්‍රත්‍යය රූපජීවිතේන්ද්‍රියාස්තිප්‍රත්‍යය යි අස්තිප්‍රත්‍යය සත් වැදෑරුම්.

ඔවුන් අතුරෙන් සහජාතප්‍රත්‍යයය ම සහජාතාස්තිප්‍රත්‍යය නම. සෙසු සයෙහි ද මේ නය ම ය. ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්නවිභාගය ද යට ඒ ඒ තැන කියන ලද්දේ ම ය.

කවර අරුතෙකින් **අස්තිප්‍රත්‍යය** නම් වේ ද? යත්: තමා ක්ෂණිකප්‍රත්‍යුත්පන්නසඞ්ඛ්‍යාත අස්තිභාවයෙන් ප්‍රත්‍යුත්පන්න වූ ධර්මයා ගේ ප්‍රත්‍යය අස්තිප්‍රත්‍යය නම් වේ.

**අස්තිප්‍රත්‍යය දීපනිය යි.**

## 22. නාස්තිප්‍රත්‍යය, 23. විගතප්‍රත්‍යය, 24. අවිගතප්‍රත්‍යය,

සියලු අනන්තරප්‍රත්‍යයය නාස්තිප්‍රත්‍යය නම විගත-ප්‍රත්‍යය ද එසේ ම ය. අවිගතප්‍රත්‍යය ද අස්තිප්‍රත්‍යය හා හැම සැටියෙන් ම සමාන ය. **අස්ති** යනු ද **අවිගත** යනු ද අර්ථ වශයෙන් එකෙක් ම ය. එසේ ම **නාස්ති** යනු ද **විගත** යනු ද එකෙක් ම ය

**නාස්තිප්‍රත්‍යය-විගතප්‍රත්‍යය-අවිගතප්‍රත්‍යය දීපනිය සි.**

**ප්‍රත්‍යයදීපනිය නිමියේ ය.**



# ප්‍රත්‍යයසභාගසංග්‍රහය

ප්‍රත්‍යයසභාගය (ප්‍රත්‍යයයන්ගේ සංයෝගය) කියනු ලැබේ. සහජාතජාතිකයෝ (එකට උපදනා ස්වභාව ඇතියෝ) පසොළොස් දෙනෙකි. මහාසහජාත සතර ය, මධ්‍යසහජාත සතර ය, කුඩා සහජාත සත ය යනු ඒ පසොළොස් දෙනා ය. ඔවුන් අතුරෙන් මහාසහජාතයෝ නම්: සහජාතය, සහජාතනිස්සය ය, සහජාතත්ථි ය, සහජාතාවිගතය යන සතර දෙනා ය. මධ්‍යම සහජාතයෝ නම් අඤ්ඤමඤ්ඤ ය, විපාක ය, සම්පයුත්ත ය, සහජාත-විප්පයුත්ත ය යන සතර දෙනා ය. කුඩා සහජාතයෝ නම් හේතු සහජාතාධිපති සහජාතකම්ම සහජාතාහාර සහජාතින්ද්‍රිය ධ්‍යාන මාගී යන සත් දෙනා ය.

රූපාහාර ය, රූපාහාරත්ථි ය, රූපාහාරඅවිගත ය යන තුන් දෙනා රූපාහාර නම් වෙත්. රූපජීවිතීන්ද්‍රිය රූප-ජීවිතින්ද්‍රියත්ථිය රූපජීවිතින්ද්‍රියාවිගතයෑ යි රූපජීවිතින්ද්‍රියයෝ තිදෙනෙකි.

වත්ථුපුරේජාත සය ය, ආරම්මණපුරේජාත සය ය, වත්ථාරම්මණපුරේජාත පස ය යන පුරේජාතජාතිකයෝ සතොළොස් දෙනෙකි.

එහි වත්ථුපුරේජාතයෝ නම්: වත්ථුපුරේජාත ය, වත්ථු-පුරේජාතනිස්සය ය, වත්ථුපුරේජාතින්ද්‍රිය ය, වත්ථුපුරේජාත-විප්පයුත්ත ය, වත්ථුපුරේජාතත්ථි ය, වත්ථුපුරේජාතඅවිගත ය යන සදෙන ය.

ආරම්මණපුරේජාතයෝ නම්: ආරම්මණපුරේජාත ය, ආරම්මණ වූ කිසිවෙක් ය, ආරම්මණාධිපති වූ කිසිවෙක් ය, ආරම්මණූපනිස්සය වූ කිසිවෙක් ය, ආරම්මණපුරේජාතත්ථි ය ආරම්මණපුරේජාත අවිගත ය යන ස දෙන ය.

(ආරම්මණ වූ කිසිවෙක යන ආදි තන්හි "කිසි" යන්නෙන් ප්‍රත්‍යුත්පන්න නිෂ්පන්නරූපය ගැනේ.)

වත්ථාරම්මණ පුරේජාතයෝ නම් වත්ථාරම්මණ පුරේ-ජාත ය, වත්ථාරම්මණපුරේජාතනිස්සය ය, වත්ථාරම්මණ-පුරේජාත විප්පයුත්ත ය, වත්ථාරම්මණපුරේජාතත්ථි ය, වත්ථාරම්මණපුරේජාත අවිගත ය යන පස් දෙනා ය.

පච්ඡාජාත ය, පච්ඡාජාතවිප්පයුත්ත ය, පච්ඡාජාතත්ථිය, පච්ඡාජාතඅවිගත ය යන සතර දෙන පච්ඡාජාත-ජාතිකයෝ ය.

අනන්තර ය, සමනන්තර ය, අනන්තරූපනිස්සය ය, ආසේවන ය, අනන්තරකර්ම ය, නත්ථි ය, විගත ය යන මොහු සත් අනන්තරයෝ නම් වෙති. මෙහි අනන්තරකර්ම යනු ආර්‍ය්‍යමාර්ග චේතනාව යි. එය තමාට අනතුරුව ආර්‍ය්‍යඵලය උපදවයි

මේ දැක්වුණු ප්‍රත්‍යයගණයනට නොඇතුළත් වෙන් වූ ප්‍රත්‍යයෝ පස් දෙනෙක් වෙත්. අවශේෂ අරමුණු, අවශේෂ ආරම්මණාධිපති, අවශේෂ ආරම්මණූපනිස්සය ය, සියලු ප්‍රකෘතූපනිස්සය සියලු නානාක්ෂණිකකර්ම යන මොහු ය. මෙසේ විස්තර වශයෙන් ප්‍රස්ථානප්‍රත්‍යයෝ ප්‍රභෙද සූපනසක් ඇත්තෝ වෙත්.

ඔවුන් අතුරෙහි සියලු සහජාතජාතිකයෝ ද, සියලු පුරේජාතජාතිකයෝ ද, සියලු පච්ඡාජාතජාතිකයෝ ද, රූපාහාරය ද, රූපජීවිතින්ද්‍රිය ද යන මොහු ප්‍රත්‍යුත්පන්න ප්‍රත්‍යයෝ නම් වෙත්. සියලු අනන්තරජාතිකයෝ ද, සියලු නානාක්ෂණිකකර්මය ද යන මොහු අතීත ප්‍රත්‍යයෝ

නම් වෙති. ආලම්බන පකතූපනිස්සය යන මොහු ත්‍රෛකාලිකයෝ වෙති. නිර්වාණ ප්‍රඥප්ති යන දෙක කාලවිමුක්තයෝ ය.

නිර්වාණයත් ප්‍රඥප්තියත් යන මේ ධර්ම දෙක අප්පච්චය ද අසංඛත ද නම් වෙති. කවර හෙයින? අජාතික (අනුපපන්නික) බැවිනි. යම් කෙනෙක්නට ඉපැත්මෙක් ඇද්ද ඔහු සංඛත (සංස්කෘත) ද සප්‍රත්‍යය ද ප්‍රතීත්‍යසමුත්පන්න ද නම් වෙති. මේ නිර්වාණ ප්‍රඥප්ති දෙදෙන වනාහි ජාතිරහිත බැවින්, උත්පාදරහිත බැවින්, ජාතිප්‍රත්‍යය රහිත බැවින් අප්‍රත්‍යය නම් හ, අසංස්කෘත නම් හ.

සප්‍රත්‍යය (ප්‍රත්‍යය සහිත) වූ සංස්කෘත (සංඛත) ධර්ම අතුරෙහි ද නිත්‍ය වූ ධ්‍රැව (ස්ථිර) වූ ශාශ්වත වූ නොපෙරළෙන සුලු වූ එක ද ධර්මයෙක් නැත. එතකුදු වුවත් ඒ සියලු ධර්මයෝ ක්ෂයාර්ථයෙන් (ක්ෂීණ වන බැවින්) අනිත්‍ය ම වෙත්. කවර හෙයින? තමන් ප්‍රත්‍යයයනට අයත් පැවැතුම් ඇති බැවිනුත් ප්‍රත්‍යයයන් ද අනිත්‍ය ස්වභාවය ඇති බැවිනුත් ය.

නිවනත් ප්‍රඥප්තියත් ප්‍රත්‍යයයෝ නො වෙත් ද? ඔහු නිත්‍යත් ධ්‍රැවත් නො වෙත් ද? සැබැව හුදෙකලා නිර්වාණ ප්‍රත්‍යයයෙන් හෝ හුදෙකලා ප්‍රඥප්තිප්‍රත්‍යයයෙන් හෝ පහළ වූයෙක් නම් නැත. සියලු ප්‍රත්‍යයෝත්පන්නයෝ බොහෝ ප්‍රත්‍යයයන් ගෙන් ම පහළ වූවෝ ය. ඒ ප්‍රත්‍යය-යෝත් අනිත්‍ය ම අධ්‍රැව ම වෙත්.

යම් ධර්ම කෙනෙක් අනිත්‍ය වෙත් ද, ඔහු හැම විට ම සත්වයනට තුන්වැදෑරුම් දුක්දඬුවමින් පීඩා කෙරෙත්, සම්බාධ කෙරෙත්. එ හෙයින් ඒ ධර්මයෝ භයාර්ථයෙන් (උපද්‍රවාර්ථයෙන්) දුක් ම වෙත්. එහි තුන් වැදෑරුම් දුක්දඬුවම යනු දුඃඛදුඃඛතාව, සංස්කාරදුඃඛතාව, විපරිණාමදුඃඛතාව යන තුන ය.

යම් කෙනෙක් අනිත්‍ය ම වෙත් නම්, එක ම ඉරියව්වෙහි දු පුනපුනා බිඳෙත් නම්, ඔහු දිරි ඇති තාක් කෙසේ නම් නිත්‍ය සේ හඳුනන ලද සත්ත්වපුද්ගලයන්ගේ ආත්ම නම් වන්නාහු ද? සාරයෝ නම් වන්නාහු ද? නොවන්නාහු ම ය. යම් ධර්ම කෙනෙක් දුක් ම වෙත් නම්, ඔහු කෙසේ නම් දුකට පිළිකුල් කරන, සුව පතන සත්වයන් ගේ ආත්ම නම් වන්නාහු ද? සාරයෝ නම් වන්නාහු ද? නො වන්නාහු ම ය. එ හෙයින් ඒ ධර්මයෝ සාරයක් නැත්තෝ ය යන අරුතින් අනාත්ම ම වෙත්.

තව ද යම් හෙයෙකින් මේ සූවිසි ප්‍රත්‍යයයන් දෙසීමෙහි "සියලු සංසකෘත ධර්මයෝ ම ප්‍රත්‍යයනට අයත් පැවැතුම් ඇත්තෝ ම වෙත්. සත්වයන් ගේ කැමැත්තට අයත් ව පවත්තෝ නො වෙති. ප්‍රත්‍යයනට අයත් ව පවත්නා වූ ද ඔවුන් අතුරෙහි එකෙකුත් එක ධර්මයෙකුත් අල්පප්‍රත්‍යයෙකින් නො උපදී. වැලි බොහෝ වූ ම ප්‍රත්‍යයන් ගෙන් උපදී" යන මේ අර්ථය දක්වා ද එහෙයින් මේ දෙසුම ධර්මයන් ගේ අනාත්මලක්ෂණය දක්වීමෙහි මුදුන් පැමිණියේ වෙයි

## ප්‍රත්‍යයඝටනාව (ප්‍රත්‍යයන් එකට ගැළැපීම)

ප්‍රත්‍යයඝටනා-නයය කියනු ලැබේ.

එක් එක් ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෙක්හි බොහෝ ප්‍රත්‍යයන්ගේ සමවධානය (එකතු වීම) ප්‍රත්‍යයඝටනා නම්. සප්‍රත්‍යය වූ සංස්කෘත වූ ප්‍රතීත්‍යසමුත්පන්න වූ සියලු දෑ ම ඉපැත්මෙහිත් සිටීමෙහිත් (උත්පාදස්ථිති දෙක්හි ම) මේ සූවිසිවැදෑරුම් ප්‍රත්‍යයන්ගෙන් සහිත බැවින් සප්‍රත්‍යය නම. එහෙයින් ම සංස්කෘත (සංඛත) නම. සංස්කෘත බැවින් ම ප්‍රතීත්‍යසමුත්පන්න නම. ඒ දෑ නම් කවුරු යැ? සිත් එක්සියඑක්විස්සත් දෙපනස් චෛතසිකත් අටවිසි රූපත් ය.

ඔවුන් අතුරෙන් සිත් එක්සිය එක්විස්ස චක්ඛුවිඤ්ඤාණ-ධාතු, සෝතවිඤ්ඤාණධාතු, ඝාණවිඤ්ඤාණධාතු, ජිව්හා-විඤ්ඤාණධාතු, මනෝධාතු, මනෝවිඤ්ඤාණධාතු යැ යි සත්වැදෑරුම්. එහි චක්ඛුවිඤ්ඤාණ දෙක චක්ඛුවිඤ්ඤාණ ධාතු නම. සෝතවිඤ්ඤාණ දෙක සෝතවිඤ්ඤාණධාතු නම. ඝාණවිඤ්ඤාණ දෙක ඝාණවිඤ්ඤාණධාතු නම. ජිව්හාවිඤ්ඤාණ දෙක ජිව්හාවිඤ්ඤාණ ධාතු නම. කාය-විඤ්ඤාණ දෙක කායවිඤ්ඤාණධාතු නම. පඤ්චද්වාරාවජ්ජ-නයත් සම්පටිච්ඡන දෙකත් මනෝධාතු නම. සෙසු සිත් එක්සියඅට මනෝවිඤ්ඤාණධාතු නම.

දෙපනස් චෛතසික ද රාශි වශයෙන් සිවුවැදෑරුම්. සබ්බචිත්තසාධාරණ සත ද, ප්‍රකීර්ණක සය ද, පාප (අකුශල) චෛතසික තුදුස ද, කල්‍යාණ (ශෝභන) චෛතසික පස්විස්ස ද යන මොහු ය.

ප්‍රත්‍යය සූවිස්සෙන් ද පසළොසෙක් සියලු චිත්තෝත්-පාදයනට සාධාරණ (පොදු) ය. ඔහු නම්: ආලම්බන, අනන්තර, සමනන්තර, සහජාත, අන්‍යෝන්‍ය, නිඃශ්‍රය, උපනිඃශ්‍රය, කර්ම, ආහාර, ඉන්ද්‍රිය, සම්ප්‍රයුක්ත, අස්ති, නාස්ති, විගත යන ප්‍රත්‍යයයෝ ය.

කිසි ම සිතෙක් හෝ චෛතසිකයෙක් අරමුණෙකින් වෙන් ව (අරමුණක්නැති ව) උපන්නෙක් නම් නැත. එසේ ම අනන්තරප්‍රත්‍යයාදි සෙසු ප්‍රත්‍යයයන් ගෙන් ද තොර ව උපන්නෝ ද නැත්හ. හෙතු, අධිපති, පුරෝජාත ආසේවන, විපාක, ධ්‍යාන, මාර්ග, විප්‍රයුක්ත යන අට ඇතැම් චිත්තෝත්පාදයනට සාධාරණ ප්‍රත්‍යය වෙති. එහි හේතු-ප්‍රත්‍යය සහේතුකචිත්තෝත්පාදයනට පමණක් සාධාරණ (පොදු) ය. අධිපතිප්‍රත්‍යයය සාධිපතිජවනයට පමණක් ප්‍රත්‍යය වේ. පුරෝජාතප්‍රත්‍යයය ඇතැම් සිත් කෙනෙක්නට ම පසය වේ. ආසේවනප්‍රත්‍යයය කුශලාකුශල ක්‍රියාජවනයනට පමණක් පසය වේ. විපාකප්‍රත්‍යයය විපාක සිත්වලට පමණක් පසය වේ.

එහි විස්තරය මෙසේ ය:

ස්පර්ශ, වේදනා, සංඥා, චේතනා, ඒකාග්‍රතා, ජීවිතේන්ද්‍රිය, මනසකාර යන මොහු සර්වචිත්තසාධාරණ චෛතසිකයෝ නම් හ. එහි සිත අධිපතිසවභාවය ඇත්තේ ද, ආහාර ප්‍රත්‍යය ද, ඉන්ද්‍රියප්‍රත්‍යය ද වේ. ස්පර්ශය ආහාරප්‍රත්‍යය වේ. වේදනාව ඉන්ද්‍රියප්‍රත්‍යය ද ධ්‍යානප්‍රත්‍යය ද වේ. ඒකාග්‍රතාව ඉන්ද්‍රියප්‍රත්‍යය ද ධ්‍යානප්‍රත්‍යය ද මාර්ගප්‍රත්‍යය ද වේ. නාම-ජීවිතේන්ද්‍රියය ඉන්ද්‍රියප්‍රත්‍යයය ම වේ. සෙසු සංඥා මනස්කාර දෙක විශේෂ ප්‍රත්‍යයයෝ නො වෙති.

චක්ෂුර්විඥානයෙහි සර්වචිත්තසාධාරණ චෛතසික සත ම ලැබේ. මෙසේ ඒ චක්ෂුර්විඥානයත් සමග එක් වැ යෙදෙන සියලු නාමධර්ම අට දෙනෙකි. ඒ සියලු දහම්හු මහා-සහජාත සතරෙනුත් විප්‍රයුක්තප්‍රත්‍යයය හැර මධ්‍යම සහජාතප්‍රත්‍යය තුනෙකිනුත් ඔවුනොවුනට ප්‍රත්‍යය වෙති. ඒ දහම් අට ම අතුරෙහි විඥාන තෙම සෙසු ධර්ම සතට ආහාරප්‍රත්‍යයයෙනුත් පසය වෙයි. ස්පර්ශය ආහාරප්‍රත්‍යය-යෙන් ද, වේදනාව ඉන්ද්‍රියප්‍රත්‍යයමාත්‍රයෙන් ද, චේතනාව කර්මප්‍රත්‍යය ආහාරප්‍රත්‍යය දෙකින් ද, ඒකාග්‍රතාව ඉන්ද්‍රියප්‍රත්‍යයමාත්‍රයෙන් ද, ජීවිතේන්ද්‍රියය ඉන්ද්‍රියප්‍රත්‍යය-භාවයෙන් ද සෙසු දහම්නට පසය වේ. චක්ෂුර්වස්තුරූපය වනාහි ඒ ධර්ම අටට වාස්තුපුරෝජාත සයින් ප්‍රත්‍යය වේ. ඒ චක්ෂුර්වස්තුයෙහි (චක්ෂුඃ ප්‍රසාදයෙහි) ආපාතාගත වූ ප්‍රත්‍යුත්පන්න (වර්තමාන) රූප අරමුණු ඔවුනට ආලම්බන-පුරෝජාත සතරින් ප්‍රත්‍යය වේ. අනතුරු ව නිරුඬ වූ පංචවාරාවර්ජන සිත ද අනන්තරප්‍රත්‍යය පසින් ඒ යට කී දහම් අටට තමා නිරුඬ වන ක්ෂණයෙහි (ඒ චක්ෂුර්-විඥානය පහළ වන්නට ඉතා ම ලං ව තිබියැ දී) ප්‍රත්‍යය වේ.

පෙර කළ කුශල වූ හෝ අකුශල වූ කර්මයෝ කුශල විපාකයනට හෝ අකුශලවිපාකයනට තමන් ගේ නානාක්ෂණික කර්මප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙත් කර්ම

කිරීමේ දී සහාය වූ පෙර භවයෙහි වූ අවිද්‍යා තෘෂ්ණා උපාදාන ද, මේ වර්තමානභවයෙහි ආවාස - පුද්ගල - සෘතු - භෝජන ආදිහු ද උඩ දක්වුණු ධර්ම අටට ප්‍රකෘති-උපනිඃශ්‍රයප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙත් මේ සිතෙහි හේතු ද අධිපති ද පශ්චාජ්ජාත ද ආසේවන ද ධ්‍යාන ද මාර්ග ද යි යන ප්‍රත්‍යය සදෙන නො ලැබෙත්. සට දක්වුණු ප්‍රත්‍යය අටොළොසපමණෙක් ලැබේ මේ චක්ෂුර්විඥාන සිතෙහි සේ ම ශ්‍රෝත්‍රවිඥානාදි ඉතිරි විඥාන සතරෙහි ද සටකී ප්‍රත්‍යය සදෙන නො ලැබේ. ප්‍රත්‍යය අටොළොස් දෙනෙක් ම ලැබෙත්.

**පංචවිඥානයන්හි ප්‍රත්‍යයඝටනා-නය යි**

---

## අහේතුක සිත්වල ප්‍රත්‍යයඝටනාව

විතර්ක විචාර අධිමෝක්ෂ වීර්ය ප්‍රීති ඡන්ද යන සදෙන ප්‍රකීර්ණක චෛතසික නම් හ ඔවුනතුරෙන් **විතර්කය** ධ්‍යානප්‍රත්‍යය ද මාර්ගප්‍රත්‍යයද වේ **විචාරය** ධ්‍යානප්‍රත්‍යය වේ. **වීර්යය** අධිපතිප්‍රත්‍යය ද ඉන්ද්‍රියප්‍රත්‍යය ද මාර්ගප්‍රත්‍යය ද වේ. **ප්‍රීතිය** ධ්‍යානප්‍රත්‍යය වේ **ඡන්දය** අධිපතිප්‍රත්‍යය වන සවභාවය ඇත්තෙකි. **අධිමෝක්ෂය** වනාහි විශෙෂ ප්‍රත්‍යයයෙක් නො වේ. පංචද්වාරාවර්ජන සිතත් සම්ප්‍රතිච්ඡන දෙකත් උපේක්ෂා සහගත සන්තීරණ දෙකත් යන සිත් පසෙහි සර්වචිත්තසාධාරණ සතත් ප්‍රකීර්ණක අතුරෙන් විතර්ක විචාර අධිමෝක්ෂ යන තුනත් යැ යි චෛතසික දශයෙක් ලැබේ. මෙසේ එහි විඥානයත් ඇතුළත් ව එකට යෙදුණු නාමධර්ම එකොළොසෙකි. මේ සිත්හි ධ්‍යානකෘත්‍යය ලැබේ. වේදනාව ද ඒකාග්‍රතාව ද විතර්කය ද විචාරය ද ධ්‍යානප්‍රත්‍යය සිදු කෙරෙත් පංචද්වාරාවර්ජන සිත වනාහි ක්‍රියාචිත්තයෙකි එයට විපාකප්‍රත්‍යයයෙක් නැත. නානා-ක්ෂණික කර්මය ද උපනිඃශ්‍රයස්ථානයෙහි සිටි විපාකප්‍රත්‍යය සමග ප්‍රත්‍යය සයෙක් නො ලැබේ. සටැ පංචවිඥානයනට නො ලැබෙන ප්‍රත්‍යය වශයෙන් දක්වන ලද්දවුන් ගෙන්

ඒ වෙනුවට විපාකප්‍රත්‍යය බහා යොදා ගත් කලැ පැනෙන ප්‍රත්‍යය සය මෙහි නො ලැබේ. ධ්‍යානප්‍රත්‍යය හා ප්‍රත්‍යය අටොළොසෙක් ම ලැබේ. සෙසු විපාක සිත් සතරෙහි ප්‍රත්‍යයයෝ පස් දෙනෙක් නො ලැබෙත්. විපාකප්‍රත්‍යයත් ධ්‍යානප්‍රත්‍යයත් සමඟ එකුන්විසි ප්‍රත්‍යය කෙනෙක් ලැබෙති

සෝමනස්සසහගත සන්තීරණයෙහි ප්‍රීතිය හා එකොළොස් චෛතසිකයෝ යෙදෙත්. මනෝද්වාරාවර්ජනයෙහි ද වීර්‍ය්‍යය හා එකොළොසෙක් දූ සි විඥානයත් සමඟ නාමධර්ම දොළොසෙක් වෙයි. හසිතෝත්පාද සිතෙහි ප්‍රීතියත් වීර්‍ය්‍යයත් සමඟ චෛතසික දොළොසෙක් යෙදේ. විඥානය සමඟ නාම ධර්ම තෙළෙසෙක් වේ. එහි සොමනස්ස සන්තීරණ-යෙහි ධ්‍යානාංග අතුරෙන් ප්‍රීතිය පමණක් අධික වෙයි. පෙර කී උපේක්ෂාසහගත සන්තීරණ දෙකෙහි මෙන් ප්‍රත්‍යයයෝ පස් දෙනෙක් නො ලැබෙත්. එකුන්විස්සෙක් ම ප්‍රත්‍යයයෝ ලැබෙත්. මනෝද්වාරාවර්ජන සිතෙහි ද වීර්‍ය්‍යය පමණෙක් අධික වෙයි. එය ද ඉන්ද්‍රියකෘත්‍ය-ධ්‍යානකෘත්‍යයන් සිදු කෙරෙයි අධිපතිකෘත්‍යය ද මාර්ගකෘත්‍යය ද සිදු නො කෙරෙයි මෙය ක්‍රියා සිතක් බැවින් මෙහි විපාකප්‍රත්‍යය-යෙක් ද නැත. යට කී පංචද්වාරාවර්ජන සිතෙහි මෙන් විපාකප්‍රත්‍යය හා ප්‍රත්‍යය සදෙනෙක් නො ලැබෙත්. ධ්‍යාන-ප්‍රත්‍යය සමඟ අටොළොස් ප්‍රත්‍යය කෙනෙක් ලැබෙත්. හසිතෝත්පාද සිතෙහි ද එය ක්‍රියා සිතක් බැවින්, විපාකප්‍රත්‍යයෙක් නැත. ජවන සිතක් බැවින් ආසේවන-ප්‍රත්‍යය ඇත. විපාකප්‍රත්‍යය සමඟ ප්‍රත්‍යය පසෙක් නො ලැබේ ආසේවනප්‍රත්‍යය සමඟ එකුන්විසි ප්‍රත්‍යය කෙනෙක් ලැබෙත්.

## අකුශලචිත්තයන් ගේ ප්‍රත්‍යයඝටනාව

අකුසල් සිත් දොළොසෙකි. ලෝභමූලක සිත් 8 ක, ද්වෙෂමූලක සිත් 2 ක. මෝමූහ සිත් 2 ක කියා ය. පාපචෛතසික තුදුසෙකි. එයින් මෝහ අහිරික අනොත්තප්ප

උද්ධච්ච යන සතර **මෝහචතුෂ්ක** නමි. ලෝභ දෘෂ්ටි මාන යන තුන ය **ලෝභත්‍රික** නමි. ද්වේෂ ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය කෞකෘත්‍ය යන සතර **ද්වේෂචතුෂ්ක** නමි. ස්ත්‍යානමිද්ධ විචිකිත්සා යන තුන **විසුත්‍රික** (විසුංනික) නමි.

එහි ලෝභ ද්වේෂ මෝහ යන මූලධර්ම තුන හේතු-ප්‍රත්‍යය ය හ. දෘෂ්ටිය මාර්ගප්‍රත්‍යය ය. සෙසු දසදෙන විශේෂ ප්‍රත්‍යයයෝ නො වෙත්.

මෝමූහ සිත් දෙකෙන් විචිකිත්සා සම්ප්‍රයුක්ත සිතෙහි සාබ්බචිත්තික සත ද, ප්‍රකීර්ණක අතුරෙන් විතර්ක විචාර වීර්‍ය යන තුන ද, පාප චෛතසිකයන් අතුරෙන් මෝහචතුෂ්කයත් විචිකිත්සාවත් ද යි චෛතසික 15 ක් උපදී සිතත් සමග එහි සියලු නාමධර්ම සොළොසෙකි. මේ සිතෙහි හේතුප්‍රත්‍යය ද මාර්ගප්‍රත්‍යය ද යන දෙදෙන ලැබෙත්. එහි මෝහය හේතුප්‍රත්‍යය ය. විතර්ක වීර්‍ය දෙදෙන මාර්ගප්‍රත්‍යයහ. ඒකාග්‍රතාව වනාහි විචිකිත්සායෙන් දුෂ්ට වූ බැවින් මෙ සිතෙහි ඉන්ද්‍රියකෘත්‍යයත් මාර්ගකෘත්‍යයත් නො කෙරෙයි, ධ්‍යානකෘත්‍යමාත්‍රයක් සිදු කෙරෙයි. අධිපති පශ්චාජ්ජාත විපාක යන ප්‍රත්‍යය තුන මෙහි නො ලැබේ. සෙසු එක්විසි ප්‍රත්‍යයයෝ ලැබෙත්.

ඖද්ධත්‍යසම්ප්‍රයුක්ත සිතෙහි ද, විචිකිත්සාව හැර, අධිමෝක්ෂය හා පසොළොස් චෛතසික කෙනෙක් ම වෙති. මෙසේ මෙ සිත ඇතුළු නාමධර්ම සොළොසෙකි. මේ සිතෙහි ඒකාග්‍රතාව ඉන්ද්‍රියකෘත්‍යය ද ධ්‍යානකෘත්‍යය ද මාර්ගකෘත්‍යය ද සිදු කෙරෙයි. තුන් ප්‍රත්‍යය කෙනෙක් නො ලැබෙත්. එක්විසි ප්‍රත්‍යය කෙනෙක් ලැබෙත්

ලෝභමූලක සිත් අටෙහි සාබ්බචිත්තික සත ද ප්‍රකීර්ණක සය ද, පාපචෛතසික අතුරෙන් මෝහචතුෂ්කය ද, ලෝභත්‍රිකය ද, ස්ත්‍යානමිද්ධ ද යන දෙවිසි චෛතසිකයෝ උපදිත්. ඔවුන් අතුරෙන් ලෝභ මෝහ දෙක මූලය හ, හේතුප්‍රත්‍යයහ. ඡන්ද චිත්ත වීර්‍ය යන තුන අධිපති ජාතික

වූවාහු කිසි විටෙක අධිපතිකෘත්‍යය සිදු කෙරෙත් ආලම්බනාධිපති ප්‍රත්‍යයය ද මෙහි ලැබේ. මෙහි චේතනාව කර්මප්‍රත්‍යය යි ආහාර තුන ආහාරප්‍රත්‍යයයෝ ය. සිත ද වේදනාව ද ඒකාග්‍රතාව ද ජීවිතේන්ද්‍රියය ද වීර්‍ය්‍යය ද යන පස් ඉන්ද්‍රියධර්මයෝ ඉන්ද්‍රියප්‍රත්‍යය හ විතර්ක විචාර ප්‍රීති වේදනා ඒකාග්‍රතා යන පස් ධ්‍යානාංග ධ්‍යානප්‍රත්‍යයයෝ යි. විතර්ක ඒකාග්‍රතා දෘෂ්ටි වීර්‍ය්‍ය යන සතර මාර්ගාංග මාර්ග-ප්‍රත්‍යය යි පශ්චාජ්ජාත විපාක යන ප්‍රත්‍යය දෙක මෙහි නො ලැබේ සෙසු දෙවිසි ප්‍රත්‍යයයෝ ලැබෙත්.

ද්වේෂමූලක සිත්හි ප්‍රීතියත් ලෝභත්‍රිකයත් හැර ද්වේෂචතුෂ්කය සමඟ දෙවිසි චෛතසික කෙනෙක් මෙහි වෙති මෙහි ද්වේෂ මෝහ යන අකුසල් මුල් දෙකෙකි. අධිපතිජාතිකයෝ තිදෙනෙකි. ආහාරයෝ තිදෙනෙකි. ඉන්ද්‍රිය පසෙකි. ධ්‍යානාංග සතරෙකි. මාර්ගාංග තුනෙකි. මෙහි ද උඩ කී ප්‍රත්‍යය දෙක නො ලැබේ. ප්‍රත්‍යයෝ දෙවිසි දෙනෙක් ම ලැබෙති.

## ශෝභන සිත්වල ප්‍රත්‍යයඝටනාව

කාමාවචර ශෝභන සිත් සූවිස්ස ය, පසොළොස් රූපාවචර සිත් ය, දෙළොස් අරූපාවචර සිත් ය, සතළිස් ලෝකෝත්තර සිත් ය යන එක්අනූ සිත්හු ශෝභනචිත්ත නම් වෙති.

අලෝභ අද්වේෂ අමෝහ ශ්‍රද්ධා සමෘති හ්‍රී අපත්‍රපා තත්‍රමධ්‍යස්ථතා කායප්‍රශ්‍රබ්ධි චිත්තප්‍රශ්‍රබ්ධි කායලඝුතා චිත්තලඝුතා කායමෘදුතා චිත්තමෘදුතා කායකර්මණ්‍යතා චිත්තකර්මණ්‍යතා කායප්‍රාගුණ්‍යතා චිත්තප්‍රාගුණ්‍යතා කායර්ජුකතා චිත්තර්ජුකතා සම්‍යග්වචන සම්‍යක්කර්මාන්ත සම්‍යගාජීව කරුණා මුදිතා යන සූවිස්ස **ශෝභන** හෙවත් **කල්‍යාණ චෛතසික** නම්හ.

ඔවුන් අතුරෙන් අලෝභ අද්වේෂ අමෝහ යන **කල්‍යාණමූලක** චෛතසික තුන හේතු ප්‍රත්‍යය හ අමෝහය අධිපතිප්‍රත්‍යයෙහි මීමාංසාධිපති (වීමංසාධිපති) නමින් බැවහර වේ. එය ම ඉන්ද්‍රියප්‍රත්‍යයෙහි ප්‍රඥෙන්ද්‍රිය නමින් ද, මාර්ගප්‍රත්‍යයෙහි සම්‍යදෘෂ්ටි නමින් ද සිටී ශ්‍රද්ධාව ඉන්ද්‍රියප්‍රත්‍යයෙහි ශ්‍රද්ධේන්ද්‍රිය නම් වේ ස්මෘතිය ඉන්ද්‍රියප්‍රත්‍යයෙහි ස්මෘතීන්ද්‍රිය නමින් ද මාර්ගප්‍රත්‍යයෙහි සම්‍යක්ස්මෘති නමින් ද සිටී. සම්‍යග්වචන සම්‍යක්කර්මාන්ත සම්‍යගාජීව යන විරති තුන මාර්ගප්‍රත්‍යය වේ. සෙසු චෛතසික සතොළොස විශේෂප්‍රත්‍යයෝ නො වෙති.

කාමාවචර කුසල් සිත් අටෙහි සාබ්බචිත්තික සත ද ප්‍රකීර්ණක සය ද කල්‍යාණ පස්විස්ස ද යන චෛතසික තිස්අට සංග්‍රහයට යේ. ඔවුන් අතුරෙන් ප්‍රීතිය සොම්නස් සහගත සිත් සතරෙහි ම යෙදේ. අමෝහය ඥානසම්ප්‍රයුක්ත සිත් සතරෙහි ම යෙදෙයි. තුන් විරතිහු සිකපදසිල් පුරන කල්හි ම යෙදෙයි. අප්‍රමාණ්‍ය දෙක (කරුණා මුදිතා දෙක) සතුන් කෙරෙහි කරුණාවත් සතුටත් ඇති කල්හි ම යෙදේ. මේ සිත් අටෙහි කල්‍යාණමූලක වූ ධර්ම තුනම හෝ දෙකක් හෝ හේතුප්‍රත්‍යය වේ. ඡන්ද චිත්ත වීර්ය මීමාංසා යන අධිපතිජාතික සතර දෙනා ගෙන් එකඑකෙක් ම කිසි කලෙක අධිපතිප්‍රත්‍යය වේ චේතනාව කර්මප්‍රත්‍යය වේ. ආහාර තුන ආහාර ප්‍රත්‍යය වේ. සිත ද වේදනාව ද ඒකාග්‍රතාව ද ජීවිතේන්ද්‍රියය ද ශ්‍රද්ධාව ද ස්මෘතිය ද වීර්යය ද ප්‍රඥාව ද යන ඉන්ද්‍රියයෝ අට දෙන ඉන්ද්‍රියප්‍රත්‍යය වෙති විතර්කය ද විචාරය ද ප්‍රීතිය ද වේදනාව ද ඒකාග්‍රතාව ද යන ධ්‍යානාංග පස ධ්‍යානප්‍රත්‍යය වේ. ප්‍රඥා විතර්ක දෙක ද තුන් විරති ද ස්මෘති වීර්ය ඒකාග්‍රතා ද යන මාර්ගාංග අට දෙන මාර්ගප්‍රත්‍යය වෙති. මේ අට සිත්හි පශ්චාජ්ජාත විපාක යන ප්‍රත්‍යය දෙදෙන නො ලැබෙත් සෙසු දෙවිසි ප්‍රත්‍යයෝ ම ලැබෙත්.

කාමශෝභන විපාක අටෙහි තුන් විරති ද අප්‍රමාණ්‍ය දෙක ද නො ලැබෙත්. අධිපති පශ්චාජ්ජාත ආසේවන යන තුන් ප්‍රත්‍යයයෝ නො ලැබෙත්. එක්විසි පසයෝ ම ලැබෙත්.

මත්තෙහි රූපාවචර අරූපාවචර ලෝකෝත්තර සිත්හි ද දෙවිසි ප්‍රත්‍යයයනට වැඩි කෙනෙක් නැත. එහෙයින් ඥානසම්ප්‍රයුක්ත කාමාවචර කුසල් සිත් සතරෙහි මෙන් මේ සිත්හි ද ප්‍රත්‍යයඝටනාව දත යුතු.

මෙසේ ඇති කල්හි කවර හෙයින් ඒ සිත්හු කාමාවචර සිත්වලට වඩා මහතුත් උතුමුත් වෙත් ද? යත්: ආසේවන-මහත්ත්වයෙන් එසේ වෙත්. ඒ සිත්හි වූ කලි විශේෂ භාවනාකර්මයෙන් සිඹයෝ වෙති. එහෙයින් ඔවුන් කෙරෙහි ආසේවනප්‍රත්‍යය මහත් වේ. ආසේවන මහත්ත්ව-යෙන් ඔවුන්ගේ ඉන්ද්‍රියප්‍රත්‍යයයත් ධ්‍යානප්‍රත්‍යයයත් මාර්ග-ප්‍රත්‍යයයත් අන් ප්‍රත්‍යයයෝත් මහත් වෙත්. මතුමත්තෙහි ප්‍රත්‍යයයන් ගේ මහත්බැවින් මතුමත්තෙහි වූ රූපාවචර චිත්තාදීහු කාමාවචර සිත්වලට වඩා මහත් ද වඩා උතුම් ද වෙති.

## රූපකලාපයන්හි ප්‍රත්‍යයඝටනාව

රූප අටවිස්සෙකි. එහි පෘථිවි අප් තේජස් වායු යන සතරදෙන මහාභූතරූප නම්හ. චක්ෂුස් ශ්‍රෝත්‍ර ඝ්‍රාණ ජිහ්වා කාය යන පස ප්‍රසාදරූප නම්හ. රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය යන පස ගෝචරරූප නම්හ එහි ස්ප්‍රෂ්ටව්‍යය ත්‍රිවිධ ය. පෘථිවිස්ප්‍රෂ්ටව්‍යය තෙජස්ස්ප්‍රෂ්ටව්‍යය වායුස්ප්‍රෂ්ටව්‍යය විසිනි. ස්ත්‍රීභාවරූප පුම්භාවරූප යන දෙදෙන භාවරූප නම්හ. ජීවිතේන්ද්‍රියරූප එකෙක. හෘදයරූප එකෙක. ආහාරරූප එකෙක. ආකාසධාතුරූප එකෙක. කායවිඥප්ති වාග්විඥප්ති විසින් විඥප්තිරූප දෙකෙක. ලඝුතා මෘදුතා කර්මණ්‍යතා යී විකාරරූප තුනෙක උපචය සන්තති ජරතා අනිත්‍යතා යී ලක්ෂණ රූප සතරෙක.

මොවුනතුරෙන් සතර මහාභූතත් ජීවිතේන්ද්‍රියයත් ආහාරරූපයත් යන රූප සය රූපධර්මයනට පසය වේ. උන් අතුරෙහි ද මහාභූත සතර දෙන සහජාත අන්‍යෝන්‍ය නිඃශ්‍රය අස්ති අවිගත යන ප්‍රත්‍යය පසින් ඔවුනොවුනට ප්‍රත්‍යය වෙත්. සහජාත-උපාදාන-රූපයනට අන්‍යෝන්‍ය ප්‍රත්‍යයය හැර ප්‍රත්‍යය සතරෙකින් ප්‍රත්‍යය වෙත් ජීවිත-රූපය සහජාත කර්මජරූපයනට ඉන්ද්‍රියප්‍රත්‍යයයෙන් ද ආහාරරූපය සහජාත අසහජාත සියලු අධ්‍යාත්මරූපයනට ආහාරප්‍රත්‍යයයෙන් ද ප්‍රත්‍යය වේ.

එහි ම ප්‍රසාදරූප පස ද ගෝචරරූප සත ද හෘදය-වාස්තුරූපය ද යන තෙළෙස් රූපධර්මයෝ නාමධර්මයනට විශේෂ ප්‍රත්‍යය වෙත්. ඔවුන් අතුරෙන් ප්‍රසාදරූප පස පඤ්චවිඥානධාතූන්හට, දරුවනට මවුන් මෙන්, වාස්තු-පුරෝජාතප්‍රත්‍යයයෙන් ද වාස්තුපුරෝජාත ඉන්ද්‍රියප්‍රත්‍යය-යෙන් ද වාස්තුපුරෝජාත විප්‍රයුක්තප්‍රත්‍යයයෙන් ද ප්‍රත්‍යය වෙත්. ගෝචරරූප සත විඥානධාතු පසට ද මනෝධාතු තුනට ද දරුවනට පියවරුන් මෙන්, ආලම්බනපුරෝජාත-ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙත්. හෘදයවාස්තුරූප තෙම රුක් දෙවියනට රුකක් මෙන් ප්‍රතිසන්ධික්ෂණයෙහි සහජාත නිඃශ්‍රයප්‍රත්‍යයයෙන් ද ප්‍රවෘත්තිකාලයෙහි වාස්තුපුරෝජාත-ප්‍රත්‍යයයෙන් හා වාස්තුපුරෝජාතවිප්‍රයුක්තප්‍රත්‍යයයෙන් ද මනෝධාතු මනෝවිඥානධාතු දෙකට ප්‍රත්‍යය වේ.

රූපකලාප තෙවිස්සෙකි. එහි රැහැනෙකින් බඳනා ලද කෙස්කලඹ මෙන් තෘණයන්ගේ තණකලඹ මෙන් එක් ජාතිරූපයෙන් බැඳුණු රූපධර්මයන්ගේ කලාපය (මිටිය) රූපකලාප නමි. ඔවුන් අතුරෙන් සතර මහාභූත ද වර්ණ ගන්ධ රස ඔජස් ද යන මේ අට දහම්හු "එක් **සවිමූලකලාපය**" නම් වේ. **සවිමූලාෂ්ටකය** යි ද මෙය කියනු ලැබේ.

ජීවිතනවකය, වාස්තුදශකය, කායදශකය, ස්ත්‍රීභාව-දශකය, පුම්භාවදශකය, චක්ෂුර්දශකය, ශ්‍රෝත්‍රදශකය,

ඝ්‍රාණදශකය, ජිහ්වාදශකය යන නව දෙන **කර්මජරූප-කලාපයෝ** යි. එහි සර්මූලාෂ්ටකය ම ජීවිතරූපය සමග **ජීවිතනවක** නම් වේ. මෙය ම කර්මජකලාපයන් අතුරෙහි **මූලනවකය** වෙයි. මූලනවකය ම පිළිවෙළින් හෘදයවාස්තු-රූපාදි රූප අට සමග වාස්තුදශකාදි අෂ්ට දශක කෙනෙක් වෙත්. එහි ජීවිතනවකයත් කායදශකයත් භාව-දශකයෝත් යන සතර කලාපයෝ මුළු සිරුරෙහි ම පවතිත්. ඔවුනතුරෙන් **ජීවිතනවක** යනු පාචකාග්නිය ද කායාග්නිය ද යන දෙක ය **පාචකාග්නි** නම් පාචක තේජෝධාතු කොටස ය. එය ආමාශයෙහි පැවැත කෑ බී රස විඳි අහර හැම පරිපාකයට පමුණුවයි. **කායාග්නි** නම් සියලු කයෑ පැතිර පවත්නා උෂ්ණ තෙජෝධාතු කොටස යි. එය සියලු කයෑ පැවැතෑ පිත් සෙම් ලේ විප්‍රසන්න කෙරෙයි. කුණු විය නොදී රැක ගනී. ඔවුන් දෙදෙනාගේ විෂම පැවැත්මක් ඇති කල්හි සත්‍වයෝ බොහෝ ආබාධ ඇත්තෝ වෙත්. ඔවුන්ගේ සම වූ පැවැත්මක් ඇති කල්හි අල්පාබාධ වෙත්. ඒ ජීවිත-නවක දෙක සත්‍වයන්ගේ ආයුෂ ද වර්ණ ද සපයයි. කායදශකය සියලු කයෙහි සුඛස්පර්ශ දුඃඛස්පර්ශ දෙක සපයයි. භාවදශකයෝ ස්ත්‍රීනට සියලු ස්ත්‍රීආකාරයන් ද පුරුෂයනට සියලු පුරුෂාකාරයන් ද සපයත්. සෙසු වාස්තුදශකාදි පංචදශකයෝ **ප්‍රදේශදශකයෝ** නම් වෙත්. ඔවුනතුරෙන් වාස්තුදශකය හෘදයකෝශය තුළෑ පැවැතෑ සත්‍වයනට නානාවිධ සුචින්තිත දුශ්චින්තිතයන් සපයයි. චක්ෂුර්දශකාදි දශක සතර ඇස්ගුළිය කන්බිල නාස්බිල දිව්තලය යන තන්හි පැවැතෑ දර්ශන ශ්‍රවණ ඝ්‍රාණ ස්වාදන කෘත්‍ය සපයයි.

සර්මූලාෂ්ටකය, ශබ්දනවකය, කායවිඥප්තිනවකය, ශබ්දවාග්විඥප්තිදශකය යන මූලකලාප සතර ද, ලහුතා මුදුතා කම්මඤ්ඤතා යන තුන් විකාරරූප සමග යෙදුණු උඩකී මූලකලාප ද යන සවිකාරකලාප සතර ද යන අට **චිත්තජරූප කලාපයෝ** ය.

එහි ශරීර ධාතූන් විෂම ව පවත්නා කල්හි ගිලනාට මූලකලාපයෝ ම පවතිත්. එකල්හි ඔහුගේ ශරීරරූපයෝ බර හෝ තද හෝ අකර්මණ්‍ය හෝ වෙත් රිසි පරිදි ඉරියවු පවත්වන්නට ද, අඟපසඟ සොලොවන්නට ද, වචන කියන්නට ද නොපහසු වෙයි. ශරීරධාතු සම ව පවත්නා කල්හි නොගිලනාහට බරබව් තදබව් ආදි සිරුරු දොස් නැති බැවින් සවිකාරකලාප සතර දෙන පවතිත්. ඔවුන් අතුරෙන් ද චිත්තාඞ්ග වශයෙන් කායාවයව-චලනයෙහි කායවිඥප්ති කලාපයෝ දෙදෙනෙක් පවතිත් චිත්ත වශයෙන් ම මුවින් වචන බණන කල්හි වාග්විඥප්ති කලාපයෝ දෙදෙනෙක් පවතිත් චිත්ත වශයෙන් ම අක්ෂර වර්ණ නැති සිනාසීම් ඇඹුම් ආදි අවචන ශබ්ද මුවින් පිට වන කල්හි ශබ්දකලාපයෝ දෙදෙනෙක් පවතිත් සෙසු කල්හි ආදි කලාපයෝ දෙදෙන (මූලාෂ්ටකයත් ශබ්ද නවකයත්) අවස්ථාවට යෝග්‍ය පරිදි පවතිත්:

**ඍතුජ රූපකලාප** සතරෙකි. සර්මූලාෂ්ටකය හා ශබ්දනවකය යන මූල කලාප දෙක ද සවිකාර කලාප දෙක දු යි ඍතුජ රූපකලාප සතරෙකි එහි මේ කය දිවි පවත්නා තාක් ඉරියවු පරම්පරාව අනුව යමින් යැපෙයි. එහෙයින් ඉරියව්වල නානාත්වහේතුයෙන්, ආහාර-නානාත්වහේතුයෙන්, වාතාතපස්පර්ශ-නානාත්ව-හේතුයෙන්, කායාවයවපරිහරණ-නානාත්වහේතුයෙන් තමන් ගේ අනුන් ගේ උපක්‍රමවල වෙනස්බව් හේතුයෙන් කයෙහි ධාතූන් ගේ සම විෂම පැවැතුම් පැනේ. එහි විෂම පැවැතුම් ඇති කල්හි මූලකලාප දෙක ම පවතී. සම ව පවත්නා කල්හි සවිකාර කලාපයෝ දෙදෙනෙක් වෙති. ඔවුන් අතුරෙනුත් ශබ්දකලාපයෝ දෙදෙන චිත්තජ ශබ්දයෙන් පරම්පරා ශබ්දයන් කෙරෙහි ද (= ඒ චිත්තජ ශබ්දය දිගින් දිගට ඇති වූ ශබ්දපරම්පරායෙහි ද) ලොවැ නොයෙක් බඳු අන් ශබ්දයන්හි ද පවතිත්.

සම්මූලාෂ්ටක කලාපය සවිකාර කලාපය යන දෙදෙන **ආහාරජ රූපකලාපයෝ** ය. මොහු දෙදෙන සැප වූ හෝ නොසැප වූ හෝ අහරින් උපන් සමරූප-විෂම-රූපයන් ගේ වශයෙන් දත යුතු.

ආකාශධාතුවත් ලක්ෂණරූපත් යන රූප පස **කලාපමුක්තකයෝ** වෙත්. එයින් ආකාශධාතුව කලාපයන් ගේ අතර පරිච්ඡේදමාත්‍ර ම බැවින් කලාපමුක්ත වෙයි. ලක්ෂණ රූපයෝ සංඛත වූ රූපකලාපයන්ගේ සංඛත බව දැන ගන්නා පිණිස ලක්ෂණමාත්‍ර ම වූ බැවින් කලාපමුක්තයහ.

මේ උඩ කී තෙවිසි කලාපයෝ අධ්‍යාත්ම සන්තානයෙහි ලැබෙත්. බාහිර සන්තානයෙහි වනාහි ඍතුජමූලකලාපයෝ දෙදෙනා ම ලැබෙත්. එහි අධ්‍යාත්ම සන්තානය බාහිර සන්තානයැ යි රූප පරම්පරා දෙකෙකි. සත්ත්වයන් පිළිබඳ සන්තානය **අධ්‍යාත්මසන්තාන** නමි. පෘථිවි පර්වත නදී සමුද්‍ර වෘක්ෂ තෘණාදීහු **බාහිරසන්තාන** නම්හ. එයින් අධ්‍යාත්මසන්තානයෙහි අටවිස්සක් රූපයෝ ද තෙවිස්සක් රූපකලාපයෝ ද ලැබෙත්.

එහි ප්‍රතිසන්ධි නාමධර්මයෝ ප්‍රතිසන්ධික්ෂණයෙහි කර්මජ රූපකලාපයනට සතර මහාසහජාතයන්ගෙන් ද විපාකයෙන් ද විප්‍රයුක්තයෙන් දැ යි සපරිද්දෙකින් ප්‍රත්‍යය වෙත්. ඔහු හෘදයවාස්තුරූපයට අන්‍යෝන්‍යප්‍රත්‍යයයෙන් ද දැන් මුලින් කී ප්‍රත්‍යය සයෙන් දැ යි සත් පරිද්දෙකින් ප්‍රත්‍යය වෙත්. ප්‍රතිසන්ධිනාමධර්මයන් අතුරෙහි හේතු ධර්මයෝ හේතුභාවයෙන් ද චේතනාව කර්මභාවයෙන් ද ආහාරධර්මයෝ ආහරභාවයෙන් ද ඉන්ද්‍රියධර්මයෝ ඉන්ද්‍රියභාවයෙන් ද ධ්‍යානධර්මයෝ ධ්‍යානභාවයෙන් ද මාර්ගධර්මයෝ මාර්ගභාවයෙන් දැ යි සුදුසු පරිදි ෂට්ප්‍රකාරයෙකින් ප්‍රත්‍යය වෙත්. අතීත කුශලාකුශල කර්මයෝ එක් පරිද්දෙකින් ම එක් කර්මප්‍රත්‍යයයෙන් ම ප්‍රත්‍යය වෙත්. පළමු භවාඞ්ගය ආදි කොටැති පසු ව උපදනා ප්‍රවෘත්තිනාමධර්මයෝ පුරෝජාත වූ කර්මජ රූපකලාපයනට එක ම පශ්චාජ්ජාත

ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙත්. මෙහි **පශ්චාජ්ජාත** යන වචනයෙන් පශ්චාජ්ජාතජාතික සතර ප්‍රත්‍යයයෝ ම ගන්නා ලද්දාහු වෙත්. අතීත කර්මයෝ ද එක් පරිද්දෙකින් ම ප්‍රත්‍යය වෙත්. මෙසේ නාම ධර්මයෝ කර්මජරූපකලාපයනට සුදුසු පරිද්දෙන් ප්‍රත්‍යය තුදුසෙකින් ප්‍රත්‍යය වෙත්. මෙහි ආලම්බන අධිපති අනන්තර සමනන්තර උපනිඃශ්‍රය පුරෝජාත ආසේවන සම්ප්‍රයුක්ත නාස්ති විගත යන දශ ප්‍රත්‍යයෝ නො ලැබෙත්.

ප්‍රවෘත්තිකාලයෙහි රූපජනක නාමධර්මයෝ තමන් හා එකට උපදනා චිත්තජ රූපකලාපයනට මහාසහජාත සතරින් ද විප්‍රයුක්තයෙන් ද යි පස් පරිද්දෙකින් ප්‍රත්‍යය වෙත්. ඒ නාමධර්ම අතුරෙන් ම හේතුධර්මයෝ හේතු භාවයෙන් ද, අධිපතිධර්මයෝ අධිපතිභාවයෙන් ද, චේතනාව කර්මභාවයෙන් ද, විපාකධර්මයෝ විපාකභාවයෙන් ද, ආහාරධර්මයෝ ආහාරභාවයෙන් ද, ඉන්ද්‍රියධර්මයෝ ඉන්ද්‍රිය-භාවයෙන් ද, ධ්‍යානධර්මයෝ ධ්‍යානභාවයෙන් ද, මාර්ගධර්මයෝ මාර්ගභාවයෙන් ද යි සුදුසු පරිදි අට අයුරෙකින් ප්‍රත්‍යය වෙත්. පසු ව උපදනා සියලු නාමධර්මයෝ පළමු උපන් චිත්තජරූප කලාපයනට එක ම පශ්චාජ්ජාතප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙත්. මෙසේ නාමධර්මයෝ චිත්තජරූප-කලාපයනට ප්‍රත්‍යය තුදුසෙකින් සුදුසු පරිදි ප්‍රත්‍යය වෙත්. මෙහිත් ආලම්බන අනන්තර සමනන්තර අන්‍යෝන්‍ය උපනිඃශ්‍රය පුරෝජාත ආසේවන සම්ප්‍රයුක්ත නාස්ති විගත යන දශ ප්‍රත්‍යයයෝ නො ලැබෙත්.

ප්‍රතිසන්ධි සිතේ ස්ථිතික්ෂණයේ පටන් ප්‍රවෘත්තිකාල-යෙහි සියලු ම නාමධර්මයෝ සියලු ඍතුජ රූප-කලාපයනට ද ආහාරජ රූපකලාපයනට ද පසු වැ ඉපැදීම් වශයෙන් (පශ්චාජ්ජාත වශයෙන්) එක් පරිද්දෙකින් ප්‍රත්‍යය වෙත්. මෙ තන්හි ද **පශ්චාජ්ජාත** යන වචනයෙන් **පශ්චාජ්ජාතජාතික** සතර දතගන්නා ලද්දාහු වෙත්. සෙසු ප්‍රත්‍යය විස්ස නො ලැබේ

සියලු තෙවිසි රූපකලාපයන්හි සතරමහාභූතයෝ මහාසහජාත සතරෙන් ද අන්‍යෝන්‍යප්‍රත්‍යයෙන් ද යි පස් පරිද්දෙකින් උනුනට ප්‍රත්‍යය වෙත් ඔහු සහජාත උපාදාරූපයනට සතර මහාසහජාත ප්‍රත්‍යයන් ගෙන් සතර පරිද්දෙකින් ප්‍රත්‍යය වෙත්. ආහාරරූපය සහජාත වූ ද සහජාත නො වූ ද සියලු අධ්‍යාත්මරූපකලාපයනට ආහාර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. කර්මජරූපකලාප නවය අතුරෙන් ජීවිතරූපය සහජාතරූපයනට ම ඉන්ද්‍රියප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙයි. මෙසේ අධ්‍යාත්මරූපධර්මයෝ අධ්‍යාත්ම රූපධර්මයනට සත් පරිද්දෙකින් ප්‍රත්‍යය වෙත් බාහිර වූ සෘතුජරූප කලාප දෙකට පස් පරිද්දෙකින් ප්‍රත්‍යය වෙත්.

**රූපකලාපයන්හි ප්‍රත්‍යයඝටනානුක්‍රමය නිමියේ ය.**

---

මෙහි ප්‍රස්ථාන (පට්ඨාන) ශබ්දයේ අර්ථ දත යුතු. **පධානං ඨානන්ති පට්ඨානං** යි ප්‍රධානස්ථාන **ප්‍රස්ථාන** (පඨාන) නම් එහි **ප්‍රධාන** යනු ප්‍රමුඛ යි **ස්ථාන** (ඨාන) යනු ප්‍රත්‍යය යි. ප්‍රමුඛ ප්‍රත්‍යය, මුඛ්‍ය ප්‍රත්‍යය, ඒකාන්තප්‍රත්‍යය යැ යි කියන ලද්දේ වෙයි. ඒ ඒකාන්තප්‍රත්‍යයය ද ප්‍රත්‍යයෝත්පන්න ධර්ම නිසා කිය යුතු.

මුඛ්‍යප්‍රත්‍යයෝත්පන්නය නිඃෂ්‍යන්දප්‍රත්‍යයෝත්පන්න යැ යි ප්‍රත්‍යයෝත්පන්නය විවිධ ය. එහි **මුඛ්‍යප්‍රත්‍යයෝත්පන්නය** නම් මූල ප්‍රත්‍යයෝත්පන්නය ය. නිඃෂ්‍යන්දප්‍රත්‍යයෝත්පන්නය (නිස්සන්දපච්චයුප්පන්න) නම් පරම්පර ප්‍රත්‍යයෝත්පන්නය ය. ඔවුන් අතුරෙන් මූලප්‍රත්‍යයෝත්පන්නය ම **ඒකාන්තප්‍රත්‍යයෝත්පන්න** නම් වේ එය වනාහි තමා ගේ ප්‍රත්‍යය ඇති කල්හි ඒකාන්තයෙන් උපදී ම ය. නො උපදනේ නො වේ. පරම්පරප්‍රත්‍යයෝත්පන්නය වනාහි **අනේකාන්ත ප්‍රත්‍යයෝත්පන්න** නම් වේ එය වූ කලී ඒ ප්‍රත්‍යයය ඇති කල්හි පවා උපදනේ ද වේ, නො උපදනේ හෝ වේ. ඔවුන් අතුරෙන් ඒකාන්තප්‍රත්‍යයෝත්පන්නය නිසා ඒ ප්‍රත්‍යය

**ප්‍රස්ථානප්‍රත්‍යය** යන නම ලබයි. එය ම මේ මහාප්‍රකරණයෙහි කියන ලද්දේ ය. එ හෙයින් ම මේ සුවිස්සක් වූ ප්‍රත්‍යයසමූහය ද මේ මහාප්‍රකරණය ද **ප්‍රස්ථාන** (පඨාන) නම් වේ යැ යි කියනු ලැබේ.

එක් පුරුෂයකු තුළ ධනධාන්‍ය පිණිස ලෝභයෙක් පහළ වෙයි. හේ ලෝභවශයෙන් නැඟී සිට කැලයට ගොස් එක් පෙදෙසක කෙත් සකස් කෙරෙයි. වතු කෙරෙයි. උයන් කෙරෙයි. ඒ ද සැපැයෙන කල්හි ඒ පුරුෂ තෙම බොහෝ ධනධාන්‍ය ලැබැ තෙමේත් පරිභෝග කෙරෙයි, අඹුදරුවන් ද පුෂ්ට කෙරෙයි, පින් ද කෙරෙයි, පින්පල ද මත්තෙහි විඳී.

එහි ලෝභසහජාත නාමරූපයෝ මුඛ්‍ය ප්‍රත්‍යයෝත්පන්නයෝ නම් වෙත්. එයින් පසු අනාගත භවයන්හි පින්පල විඳින තුරු උපන් පරම්පර ඵලයෝ ඒ ලෝභයා ගේ නිෂ්‍යන්දප්‍රත්‍යයෝත්පන්නයෝ නම් වෙත්. ඒ ප්‍රත්‍යයෝත්පන්නයන් දෙදෙනා අතුරෙන් මුඛ්‍ය ප්‍රත්‍යයෝත්පන්නය ම ප්‍රස්ථානප්‍රකරණයෙහි කියන ලදී නිෂ්‍යන්දප්‍රත්‍යයෝත්පන්නය වනාහි සූත්‍රාන්ත නයින් කියැ යුතු. එහි සූත්‍රාන්ත නය යනු ‘මෙය ඇති කල්හි මෙය වේ. මෙය ඉපැද්මෙන් මෙය උපදී’ යැ යි කියන ලද මෙබඳු වූ ප්‍රත්‍යයක්‍රමය යි. තව ද ලෝභයත් ද්වෙෂයත් මෝහයත් යන තුන් දහම්හු සියලු සත්වලෝකයා ගේත් සංස්කාරලෝකයා ගේත් අවකාශලෝකයා ගේත් විපතට මුල් වූ කරුණින් හේතුහු නම් වෙති. අලෝභ අද්වෙෂ අමෝහ යන තුන් දහම්හු සැපතට මුල් වන කරුණින් හේතුහු නම් වෙති යි කිය යුතු. මේ නයක්‍රමය සියලු ප්‍රස්ථානප්‍රත්‍යයයන්හි සුදුසු පරිදි හෙලා දත යුතු. මෙසේ ඇති කල්හි ලොවැ සියලු ලෝකප්‍රවෘත්තිහු මේ සුවිසි ප්‍රත්‍යයයන් ගේ මුඛ්‍ය ප්‍රත්‍යයෝත්පන්නය සහිත නිෂ්‍යන්දප්‍රත්‍යයෝත්පන්නයෝ ම වෙත් යී දත යුතු.

මෙ පම්ණෙකින් ප්‍රත්‍යයයන් ගේ අර්ථ දැක්වීම, ප්‍රත්‍යයයන් ගේ ස්වභාවසඞ්ග්‍රහය, ප්‍රත්‍යයයන් ගේ ස්ථානය, යන කාණ්ඩ තුනෙකින් බෙදුණු **ප්‍රස්ථානෝද්දේශදීපනිය** (පට්ඨානුද්දේසදීපනිය) නිමියේ වෙයි.

මේ **ප්‍රත්‍යයෝද්දේශ දීපනී** ග්‍රන්ථය බුරුම රටැ මුංය්වා නුවර ලේතීඅරණ්‍යවිහාරවාසි මහතෙරුන් විසින් කරන ලද්දේ ය.

[බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය ස්ථවිරයන් විසින් සිංහලයට පෙරළන ලද්දේ ය.]

# පට්ඨානප්පකරණං

(පච්චයුද්දෙසපච්චයනිද්දෙසා)

## ප්‍රස්ථානප්‍රකරණය

(ප්‍රත්‍යයෝද්දේශ ප්‍රත්‍යයනිදේශ දෙක)



# පට්ඨානප්පකරණං

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

## පච්චයුද්දෙසො

හෙතුපච්චයො, ආරම්මණපච්චයො, අධිපතිපච්චයො, අනන්තරපච්චයො, සමනන්තරපච්චයො, සහජාතපච්චයො, අඤ්ඤමඤ්ඤපච්චයො, නිස්සයපච්චයො, උපනිස්සයපච්චයො, පුරෙජාතපච්චයො, පච්ඡාජාතපච්චයො, ආසෙවනපච්චයො, කම්මපච්චයො, විපාකපච්චයො, ආහාරපච්චයො, ඉන්ද්‍රියපච්චයො, ඣානපච්චයො, මග්ගපච්චයො, සම්පයුත්තපච්චයො, විප්පයුත්තපච්චයො, අත්ථිපච්චයො, නත්ථිපච්චයො, විගතපච්චයො, අවිගතපච්චයො'ති.

## පච්චයනිද්දෙසො

1. **හෙතුපච්චයො**'ති හෙතු හෙතු සම්පයුත්තකානං ධම්මානං තංසමුට්ඨානානඤ්ච රූපානං හෙතුපච්චයෙන පච්චයො.

2. **ආරම්මණපච්චයො**'ති රූපායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො

සද්දායතනං සොතවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො.

ගන්ධායතනං ඝානවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො.

රසායතනං ජිව්හාවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො.

ඵොට්ඨබ්බායතනං කායවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො

රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං මනොධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො.

සබ්බෙ ධම්මා මනොවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො.

යං යං ධම්මං ආරබ්භ යෙ යෙ ධම්මා උප්පජ්ජන්ති චිත්තචෙතසිකා ධම්මා තෙ තෙ ධම්මා තෙසං තෙසං ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො.

**3. අධිපතිපච්චයො**'ති ඡන්දාධිපති ඡන්දසම්පයුත්තකානං ධම්මානං තංසමුට්ඨානානඤ්ච රූපානං අධිපතිපච්චයෙන පච්චයො.

විරියාධිපති විරියසම්පයුත්තකානං ධම්මානං තංසමුට්ඨානානඤ්ච රූපානං අධිපතිපච්චයෙන පච්චයො.

චිත්තාධිපති චිත්තසම්පයුත්තකානං ධම්මානං තංසමුට්ඨානානඤ්ච රූපානං අධිපතිපච්චයෙන පච්චයො.

වීමංසාධිපති වීමංසාසම්පයුත්තකානං ධම්මානං තංසමුට්ඨානානඤ්ච රූපානං අධිපතිපච්චයෙන පච්චයො.

යං යං ධම්මං ගරුං කත්වා යෙ යෙ ධම්මා උප්පජ්ජන්ති චිත්තචෙතසිකා ධම්මා තෙ තෙ ධම්මා තෙසං තෙසං ධම්මානං අධිපතිපච්චයෙන පච්චයො.

4. **අනන්තරපච්චයො**'ති චක්ඛුවිඤ්ඤාණධාතු තංසම්පයුත්තකා ච ධම්මා මනොධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො.

මනොධාතු තංසම්පයුත්තකා ච ධම්මා මනොවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො.

සොතවිඤ්ඤාණධාතු තංසම්පයුත්තකා ච ධම්මා මනොධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො.

මනොධාතු තංසම්පයුත්තකා ච ධම්මා මනොවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො.

ඝානවිඤ්ඤාණධාතු තංසම්පයුත්තකා ච ධම්මා මනොධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො.

මනොධාතු තංසම්පයුත්තකා ච ධම්මා —පෙ— අනන්තරපච්චයෙන පච්චයො.

ජිව්හාවිඤ්ඤාණධාතු තංසම්පයුත්තකා ච ධම්මා මනොධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො.

මනොධාතු—පෙ—අනන්තරපච්චයෙන පච්චයො.

කාය විඤ්ඤාණධාතු තංසම්පයුත්තකා ච ධම්මා මනොධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො.

මනොධාතු—පෙ—අනන්තරපච්චයෙන පච්චයො

පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො.

පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො.

පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො.

පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො.

පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො

පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො

යෙසං යෙසං ධම්මානං අනන්තරා යෙ යෙ ධම්මා උප්පජ්ජන්ති චිත්තචෙතසිකා ධම්මා තෙ තෙ ධම්මා තෙසං තෙසං ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො.

**5. සමනන්තරපච්චයො'**ති චක්ඛුවිඤ්ඤාණධාතු තංසම්පයුත්තකා ච ධම්මා මනොධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තරපච්චයෙන පච්චයො.

මනොධාතු තංසම්පයුත්තකා ච ධම්මා මනොවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තරපච්චයෙන පච්චයො

සොතවිඤ්ඤාණධාතු තංසම්පයුත්තකා ච ධම්මා මනොධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තරපච්චයෙන පච්චයො.

මනොධාතු තංසම්පයුත්තකා ච ධම්මා මනොවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තරපච්චයෙන පච්චයො.

ඝානවිඤ්ඤාණධාතු තංසම්පයුත්තකා ච ධම්මා මනොධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තරපච්චයෙන පච්චයො.

මනොධාතු—පෙ—සමනන්තරපච්චයෙන පච්චයො.

ජිව්හාවිඤ්ඤාණධාතු තංසම්පයුත්තකා ච ධම්මා මනො-ධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තර-පච්චයෙන පච්චයො.

මනොධාතු තංසම්පයුත්තකා ච ධම්මා මනොවිඤ්ඤාණ-ධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තර-පච්චයෙන පච්චයො.

කායවිඤ්ඤාණධාතු තංසම්පයුත්තකා ච ධම්මා මනො-ධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තර-පච්චයෙන පච්චයො.

මනොධාතු තංසම්පයුත්තකා ච ධම්මා -පෙ- සමනන්තර-පච්චයෙන පච්චයො

පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං සමනන්තරපච්චයෙන පච්චයො.

පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං සමනන්තරපච්චයෙන පච්චයො.

පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං සමනන්තරපච්චයෙන පච්චයො

පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං සමනන්තරපච්චයෙන පච්චයො.

පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං සමනන්තරපච්චයෙන පච්චයො.

පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං සමනන්තරපච්චයෙන පච්චයො.

යෙසං යෙසං ධම්මානං සමනන්තරා යෙ යෙ ධම්මා උප්පජ්ජන්ති චිත්තචෙතසිකා ධම්මා' තෙ තෙ ධම්මා තෙසං තෙසං ධම්මානං සමනන්තරපච්චයෙන පච්චයො.

**6. සහජාතපච්චයො'ති** චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං සහජාතපච්චයෙන පච්චයො.

චත්තාරො මහාභූතා අඤ්ඤමඤ්ඤං සහජාතපච්චයෙන පච්චයො.

ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤං සහජාත-පච්චයෙන පච්චයො.

චිත්තචෙතසිකා ධම්මා චිත්තසමුට්ඨානානං රූපානං සහජාතපච්චයෙන පච්චයො.

මහාභූතා උපාදාරූපානං සහජාතපච්චයෙන පච්චයො.

රූපිනො ධම්මා අරූපීනං ධම්මානං කිඤ්චිකාලෙ සහජාතපච්චයෙන පච්චයො, කිඤ්චිකාලෙ න සහජාත-පච්චයෙන පච්චයො.

**7. අඤ්ඤමඤ්ඤපච්චයො'ති** චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤපච්චයෙන පච්චයො. චත්තාරො මහාභූතා අඤ්ඤමඤ්ඤපච්චයෙන පච්චයො. ඔක්කන්ති-ක්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤපච්චයෙන පච්චයො.

**8. නිස්සයපච්චයො'ති** චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං නිස්සයපච්චයෙන පච්චයො. චත්තාරො මහාභූතා අඤ්ඤමඤ්ඤං නිස්සයපච්චයෙන පච්චයො. ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤං නිස්සයපච්ච-යෙන පච්චයො.

චිත්තචෙතසිකා ධම්මා චිත්තසමුට්ඨානානං රූපානං නිස්සයපච්චයෙන පච්චයො.

මහාභූතා උපාදාරූපානං නිස්සයපච්චයෙන පච්චයො.

චිත්තචෙතසිකා ධම්මා චිත්තසමුට්ඨානානං රූපානං නිස්සයපච්චයෙන පච්චයො.

මහාභූතා උපාදාරූපානං නිස්සයපච්චයෙන පච්චයො.

චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං නිස්සයපච්චයෙන පච්චයො.

සොතායතනං සොතවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං නිස්සයපච්චයෙන පච්චයො.

ඝානායතනං ඝානවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං නිස්සයපච්චයෙන පච්චයො

ජිව්හායතනං ජිව්හාවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං නිස්සයපච්චයෙන පච්චයො

කායායතනං කායවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං නිස්සයපච්චයෙන පච්චයො.

යං රූපං නිස්සාය මනොධාතු ච මනොවිඤ්ඤාණධාතු ච වත්තන්ති, තං රූපං මනොධාතුයා ච මනොවිඤ්ඤාණධාතුයා ච තංසම්පයුත්තකානඤ්ච ධම්මානං නිස්සයපච්චයෙන පච්චයො.

9. **උපනිස්සයපච්චයො'** ති පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං උපනිස්සයපච්චයෙන පච්චයො. පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං කෙසඤ්චි උපනිස්සයපච්චයෙන පච්චයො. පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං උපනිස්සයපච්චයෙන පච්චයො. පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං උපනිස්සයපච්චයෙන පච්චයො. පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං කෙසඤ්චි උපනිස්සයපච්චයෙන පච්චයො පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං උපනිස්සයපච්චයෙන පච්චයො. පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං උපනිස්සයපච්චයෙන පච්චයො. පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං

කුසලානං ධම්මානං උපනිස්සයපච්චෙන පච්චයො. පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං උපනිස්සයපච්චයෙන පච්චයො. උතුභොජනම්පි උපනිස්සයපච්චයෙන පච්චයො. පුග්ගලො'පි උපනිස්සය-පච්චයෙන පච්චයො. සෙනාසනම්පි උපනිස්සයපච්චයෙන පච්චයො

**10. පුරෙජාතපච්චයො'** ති චක්ඛායතනං චක්ඛු-විඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං පුරෙජාත-පච්චයෙන පච්චයො.

සොතායතනං සොතවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්ත-කානඤ්ච ධම්මානං පුරෙජාතපච්චයෙන පච්චයො.

ඝානායතනං ඝානවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්ත-කානඤ්ච ධම්මානං පුරෙජාතපච්චයෙන පච්චයො.

ජිව්හායතනං ජිව්හාවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්ත-කානඤ්ච ධම්මානං පුරෙජාතපච්චයෙන පච්චයො.

කායායතනං කායවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්ත-කානඤ්ච ධම්මානං පුරෙජාතපච්චයෙන පච්චයො.

රූපායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්ත-කානඤ්ච ධම්මානං පුරෙජාතපච්චයෙන පච්චයො.

සද්දායතනං සොතවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්ත-කානඤ්ච ධම්මානං පුරෙජාතපච්චයෙන පච්චයො.

ගන්ධායතනං ඝානවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්ත-කානඤ්ච ධම්මානං පුරෙජාතපච්චයෙන පච්චයො.

රසායතනං ජිව්හාවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්ත-කානඤ්ච ධම්මානං පුරෙජාතපච්චයෙන පච්චයො.

ඵොට්ඨබ්බායතනං කායවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්ත-කානඤ්ච ධම්මානං පුරෙජාතපච්චයෙන පච්චයො.

රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං මනොධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං පුරෙජාතපච්චයෙන පච්චයො.

යං රූපං නිස්සාය මනොධාතු ච මනොවිඤ්ඤාණධාතු ච වත්තන්ති, තං රූපං මනොධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං කිඤ්චිකාලෙ පුරෙජාතපච්චයෙන පච්චයො, කිඤ්චිකාලෙ න පුරෙජාතපච්චයෙන පච්චයො

**11. පච්ඡාජාතපච්චයො' ති** පච්ඡාජාතා චිත්තචෙතසිකා ධම්මා පුරෙජාතස්ස ඉමස්ස කායස්ස පච්ඡාජාතපච්චයෙන පච්චයො,

**12. ආසෙවනපච්චයො' ති** පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං ආසෙවනපච්චයෙන පච්චයො.

පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං ආසෙවනපච්චයෙන පච්චයො.

පුරිමා පුරිමා කිරියාඅබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කිරියාඅබ්‍යාකතානං ධම්මානං ආසෙවනපච්චයෙන පච්චයො.

**13. කම්මපච්චයො' ති** කුසලාකුසලං කම්මං විපාකානං ඛන්ධානං කටත්තා ච රූපානං කම්මපච්චයෙන පච්චයො.

චෙතනා සම්පයුත්තකානං ධම්මානං තංසමුට්ඨානානඤ්ච රූපානං කම්මපච්චයෙන පච්චයො.

**14. විපාකපච්චයො' ති** විපාකා චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං විපාකපච්චයෙන පච්චයො.

**15. ආහාරපච්චයො' ති** කබළීකාරො ආහාරො ඉමස්ස කායස්ස ආහාරපච්චයෙන පච්චයො.

ආරූපිනො ආහාරා සම්පයුත්තකානං ධම්මානං තංසමුට්ඨානානඤ්ච රූපානං ආහාරපච්චයෙන පච්චයො.

**16. ඉන්ද්‍රියපච්චයො' ති** චක්ඛු'න්ද්‍රියං චක්ඛුවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං ඉන්ද්‍රියපච්චයෙන පච්චයො.

සොතින්ද්‍රියං සොතවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං ඉන්ද්‍රියපච්චයෙන පච්චයො.

ඝානින්ද්‍රියං ඝානවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං ඉන්ද්‍රියපච්චයෙන පච්චයො.

ජිව්හින්ද්‍රියං ජිව්හාවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං ඉන්ද්‍රියපච්චයෙන පච්චයො.

කායින්ද්‍රියං කායවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං ඉන්ද්‍රියපච්චයෙන පච්චයො.

රූපජීවිතින්ද්‍රියං කටත්තාරූපානං ඉන්ද්‍රියපච්චයෙන පච්චයො.

අරූපිනො ඉන්ද්‍රියා සම්පයුත්තකානං ධම්මානං තංසමුට්ඨානානඤ්ච රූපානං ඉන්ද්‍රියපච්චයෙන පච්චයො.

**17. ඣානපච්චයො' ති** ඣානඞ්ගානි ඣානසම්පයුත්තකානං ධම්මානං තංසමුට්ඨානානඤ්ච රූපානං ඣානපච්චයෙන පච්චයො.

**18. මග්ගපච්චයො' ති** මග්ගඞ්ගානි මග්ගසම්පයුත්තකානං ධම්මානං තංසමුට්ඨානානඤ්ච රූපානං මග්ගපච්චයෙන පච්චයො.

**19. සම්පයුත්තපච්චයො' ති** චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං සම්පයුත්තපච්චයෙන පච්චයො.

**20. විප්පයුත්තපච්චයො' ති** රූපිනො ධම්මා අරූපීනං ධම්මානං විප්පයුත්තපච්චයෙන පච්චයො.

අරූපිනො ධම්මා රූපීනං ධම්මානං විප්පයුත්තපච්චයෙන පච්චයො.

**21. අත්ථිපච්චයො' ති** චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං අත්ථිපච්චයෙන පච්චයො.

චත්තාරො මහාභූතා අඤ්ඤමඤ්ඤං අත්ථිපච්චයෙන පච්චයො.

ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤං අත්ථිපච්චයෙන පච්චයො.

චිත්තචෙතසිකා ධම්මා චිත්තසමුට්ඨානානං රූපානං අත්ථිපච්චයෙන පච්චයො.

මහාභූතා උපාදාරූපානං අත්ථිපච්චයෙන පච්චයො.

චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො.

සොතායතනං සොතවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො.

ඝානායතනං ඝානවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො.

ජිව්හායතනං ජිව්හාවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො.

කායායතනං කායවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො.

රූපායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො.

සද්දායතනං සොතවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො.

ගන්ධායතනං ඝානවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො.

රසායතනං ජිව්හාවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො.

ඵොට්ඨබ්බායතනං කායවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්ත-කානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො.

රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං මනොධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයෙන පච්චයො.

යං රූපං නිස්සාය මනොධාතු ච මනොවිඤ්ඤාණ-ධාතු ච වත්තන්ති, තං රූපං මනොවිඤ්ඤාණධාතුයා ච තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො.

**22. නත්ථිපච්චයො' ති** සමනන්තරනිරුද්ධා චිත්ත-චෙතසිකා ධම්මා පටුප්පන්නානං චිත්තචෙතසිකානං ධම්මානං නත්ථිපච්චයෙන පච්චයො.

**23. විගතපච්චයො' ති** සමනන්තරවිගතා චිත්ත-චෙතසිකා ධම්මා පටුප්පන්නානං චිත්තචෙතසිකානං ධම්මානං විගතපච්චයෙන පච්චයො

**24. අවිගතපච්චයො' ති** චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං අවිගතපච්චයෙන පච්චයො.

ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤං අවිගත-පච්චයෙන පච්චයො.

චිත්තචෙතසිකා ධම්මා චිත්තසමුට්ඨානානං අවිගත-පච්චයෙන පච්චයො.

මහාභූතා උපාදාරූපානං අවිගතපච්චයෙන පච්චයො.

චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්ත-කානඤ්ච ධම්මානං අවිගතපච්චයෙන පච්චයො.

සොතායතනං සොතවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්ත-කානඤ්ච ධම්මානං අවිගතපච්චයෙන පච්චයො.

ඝානායතනං ඝානවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්ත-කානඤ්ච ධම්මානං අවිගතපච්චයෙන පච්චයො.

ජිව්හායතනං ජිව්හාවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්ත-කානඤ්ච ධම්මානං අවිගතපච්චයෙන පච්චයො.

කායායතනං කායවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්ත-කානඤ්ච ධම්මානං අවිගතපච්චයෙන පච්චයො.

රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං මනොධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයෙන පච්චයො.

යං රූපං නිස්සාය මනොධාතු ච මනොවිඤ්ඤාණධාතු ච වත්තන්ති, තං රූපං මනොධාතුයා ච මනොවිඤ්ඤාණ-ධාතුයා ච තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්ච-යෙන පච්චයො.

**පච්චයනිද්දෙසො.**

---

# ප්‍රස්ථානප්‍රකරණය

(භාවය)

# ප්‍රස්ථානප්‍රකරණය.

## භාවය.

## ප්‍රත්‍යයෝද්දෙශය.

හේතුප්‍රත්‍යය, ආලම්බනප්‍රත්‍යය, අධිපතිප්‍රත්‍යය, අනන්තරප්‍රත්‍යය, සමනන්තරප්‍රත්‍යය, සහජාතප්‍රත්‍යය, නිඃශ්‍රයප්‍රත්‍යය, උපනිඃශ්‍රයප්‍රත්‍යය, පුරෝජාතප්‍රත්‍යය, පශ්චාජ්ජාතප්‍රත්‍යය, ආසෙවනප්‍රත්‍යය, කර්‍මප්‍රත්‍යය විපාක-ප්‍රත්‍යය, ආහාරප්‍රත්‍යය, ඉන්‍ද්‍රියප්‍රත්‍යය, ධ්‍යානප්‍රත්‍යය, මාර්‍ගප්‍රත්‍යය, සම්ප්‍රයුක්තප්‍රත්‍යය, විප්‍රයුක්තප්‍රත්‍යය, අස්ති-ප්‍රත්‍යය, නාස්තිප්‍රත්‍යය, විගතප්‍රත්‍යය, අවිගතප්‍රත්‍යය යැ යි ප්‍රත්‍යය සූවිසි දෙනෙක් වෙති.

## ප්‍රත්‍යයනිර්දේශය.

1. **හේතුප්‍රත්‍යය** යන්නෙහි නිර්දේශය – ලෝභාදි වශයෙන් සැවැදෑරුම් වූ හේතුව එය හා එක් වැ සෙදුණු චිත්තචෛතසිකයනටත්, ඔවුන් නිසා පහළ වන (ඒ හේතුනුත් හේතුසම්ප්‍රයුක්තයනුත් නිසා උපදනා) රූපය-නටත් (චිත්තජරූපයනටත් ප්‍රතිසන්ධිකර්මජරූපයනටත්) හේතුප්‍රත්‍යයභාවයෙන් ප්‍රත්‍යය වේ.

2. **ආලම්බනප්‍රත්‍යය** යන්නෙහි නිර්දේශය – ප්‍රත්‍යුත්-පන්නරූප අරමුණ චක්‍ෂුර්විඥානධාතුවට ද තත්සම්ප්‍රයුක්ත චෛතසිකධර්‍මයනට ද (=සර්‍වචිත්තසාධාරණ චෛතසික සතට ද) අරමුණු වීමෙන් උපකාර වේ.

ප්‍රත්‍යුත්පන්න ශබ්ද, ගන්ධ, රස, ස්ප්‍රෂ්ටව්‍ය යන අරමුණු ද පිළිවෙළින් ශ්‍රෝත්‍රවිඥනධාතු ඝ්‍රාණවිඥානධාතු ජිහ්වාවිඥනධාතු කායවිඥනධාතු යන සතරට ද තත්සම්ප්‍ර-යුක්ත චෛතසිකයනට ද අරමුණු වීමෙන් ප්‍රත්‍යය වේ.

ප්‍රත්‍යුත්පන්න වූ රූපායතන (රූප අරමුණු) ශබ්දායතන ගන්ධායතන රසායතන ස්ප්‍රෂ්ටව්‍යායතන යන පස මනෝධාතුත්‍රිකයටත් එය හා යෙදුණු චෛතසිකයනටත් අරමුණුවීමෙන් උපකාර වේ.

සියලු සාරමුණු ම මනෝවිඥනධාතුවටත් තත්සම්ප්‍ර-යුක්ත චෛතසිකයනටත් අරමුණු වීමෙන් උපකාර වේ.

යම් යම් රූපාදි ප්‍රත්‍යයයක් අරමුණු කොට (රූපාදියෙක එල්බැ) යම් යම් චිත්තචෛතසික ධර්ම කෙනෙක් උපදින්නාහු ද, ඒ ඒ ආලම්බනධර්මයෝ (අරමුණු) ඒ ඒ චිත්තචෛතසික ධර්මයනට ආලම්බනප්‍රත්‍යයභාවයෙන් ප්‍රත්‍යය වෙත්.

**3. අධිපතිප්‍රත්‍යය** යන්නෙහි නිර්දේශය - ඡන්ද නැමැති අධිපති ධර්මය ඒ ඡන්දය හා එක් වැ යෙදුණු චිත්තචෛතසික ධර්මයනට ද, ඔවුන් නිසා උපදනා (චිත්තජ) රූපයනට ද අධිපතිභාවයෙන් ප්‍රත්‍යය වේ. අධිපති වූ සිත තත් චිත්තසම්ප්‍රයුක්ත චෛතසිකයනට ද ඔවුන් නිසා උපදනා (චිත්තජ) රූපයනට ද අධිපතිභාවයෙන් ප්‍රත්‍යය වේ.

අධිපති වූ වීර්‍ය්‍යය වීර්‍ය්‍යසම්ප්‍රයුක්ත චිත්තචෛතසික ධර්මයනට ද ඔවුන් නිසා උපදනා (චිත්තජ) රූපයනට ද අධිපතිභාවයෙන් ප්‍රත්‍යය වේ.

අධිපති වූ වීමංසාව තමා හා එක් වැ යෙදුණු චිත්ත-චෛතසිකයනට ද ඔවුන් නිසා උපදනා (චිත්තජ) රූපයනට ද අධිපතිභාවයෙන් ප්‍රත්‍යය වේ.

යම් යම් අරමුණක් ගරු කොට ගෙන යම් යම් චිත්තචෛතසික කෙනෙක් උපදිත් ද, ඒ ඒ අරමුණ ආලම්බනප්‍රත්‍යය ධර්මයි. ඒ ඒ චිත්තචෛතසිකධර්මයනට ආලම්බනාධිපති භාවයෙන් ප්‍රත්‍යය වේ.

**4. අනන්තරප්‍රත්‍යය** යන්නෙහි නිර්දේශය - චක්ඛුර්-විඤ්ඤාණධාතුව ද එය හා එක් වැ යෙදුණු චෛතසිකයෝ ද මනෝධාතුවට ද (සම්පටිච්ඡන දෙකට ද) තත්සම්ප්‍රයුක්ත-යනට ද අනන්තරප්‍රත්‍යයභාවයෙන් ප්‍රත්‍යය වේ. මනෝ-ධාතුව ද (සම්පටිච්ඡන දෙක ද), එය හා එක්වැ යෙදුණු චෛතසික ද, මනෝවිඤ්ඤාණධාතුවටත් (සන්තීරණ සිත් තුනටත්), තත්සම්ප්‍රයුක්ත චෛතසිකයනටත්, අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

ශ්‍රෝත්‍රවිඤ්ඤාණධාතුව ද, ඝ්‍රාණවිඤ්ඤාණධාතුව ද, ජිව්හාවිඤ්ඤාණ-ධාතුව ද, කායවිඤ්ඤාණධාතුව ද එය හා එක් වැ යෙදුණු චෛතසිකයෝ ද මනෝධාතුවටත් තත්සම්ප්‍රයුක්ත චෛත-සිකයනටත් අනන්තරප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. මනෝ-ධාතුව ද තත්සම්ප්‍රයුක්ත චෛතසික ද මනෝවිඤ්ඤාණ ධාතුවටත් තත්සම්ප්‍රයුක්ත චෛතසිකයනටත් අනන්තර-ප්‍රත්‍යය භාවයෙන් ප්‍රත්‍යය වෙත්.

පළමු පළමු (ලෞකික) කුසල්දහම්හු (කුශල නාමස්කන්ධයෝ) පැසිම් පැසිම් ලෞකික ලොවුතුරු කුසල් දහමුනට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

පළමු පළමු කුසල්දහම්හු (ලෞකික වූ අන්තිම කුශලජවන ද මාර්ගජවන ද යන මොහු) පැසිම් පැසිම් අව්‍යාකෘත ධර්මයනට (විපාකනාමස්කන්ධයනට) අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

පළමු පළමු අකුසල්දහම්හු පැසිම් පැසිම් අකුසල් දහම්නට අනන්තරප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

පළමු පළමු අකුසල් දහම්හු පැසිම් පැසිම් අව්‍යාකෘත නාමධර්මයනට අනන්තරප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

පළමු පළමු අව්‍යාකෘත ධර්මයෝ පැසිම් පැසිම් අව්‍යාකෘත නාමස්කන්ධධර්මයනට අනන්තරප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

පළමු පළමු අව්‍යාකෘත ධර්මයෝ පැසිම් පැසිම් කුසල් දහම්නට අනන්තරප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

පළමු පළමු අව්‍යාකෘත ධර්මයෝ පැසිම් පැසිම් අකුසල් දහම්නට අනන්තරප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

යම් යම් නාමධර්මකෙනකුන්හට අනතුරු යම් යම් නාමධර්ම කෙනෙක්, චිත්තචෛතසික ධර්ම කෙනෙක්, උපදින්නාහු නම්, ඒ ඒ පළමු පළමු නාමධර්මයෝ ඒ පැසිම් පැසිම් නාමධර්මයනට අනන්තරප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

5. **සමනන්තරප්‍රත්‍යය** යන්නෙහි නිර්දේශය - අනන්තරප්‍රත්‍යය බඳු ම ය.

6. **සහජාතප්‍රත්‍යය** යන්නෙහි නිර්දේශය - සතර නාමස්කන්ධයෝ උනුනට සහජාතප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

සතර මහාභූතයෝ උනුනට සහජාතප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

පිළිසිඳගන්නා කෙණෙහි නාමරූප දෙක උනුනට සහජාතප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

චිත්තචෛතසිකධර්මයෝ සිත නිසා උපදනා රූපයනට සහජාතප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

සතර මහාභූතයෝ උපාදාරූපයනට සහජාතප්‍රත්‍යය-යෙන් ප්‍රත්‍යය වෙත්

රූපි වූ ධර්මයෝ අරූපි ධර්මයනට කිසි විටෙක (=පිළිසඳ ගැනුම්හි) සහජාතප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්. කිසිවිටෙක (ප්‍රවෘත්තිකාලයෙහි) සහජාතප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය නො වෙත්.

7. **අන්‍යෝන්‍යප්‍රත්‍යය** යන්නෙහි නිර්දේශය - සතර නාමස්කන්ධයෝ උනුනට අන්‍යෝන්‍යප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්. මහාභූතයෝ උනුනට අන්‍යෝන්‍යප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි නාමරූප දෙක උනුනට අන්‍යෝන්‍යප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

8. **නිඃශ්‍රයප්‍රත්‍යය** යන්නෙහි නිර්දේශය – සතර අරූපක්ඛන්ධයෝ උනුනට නිඃශ්‍රයප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්. සතර මහාභූතයෝ උනුනට ද, ප්‍රතිසන්ධික්ෂණයෙහි නාමරූපයෝ උනුනට ද, චිත්තචෛතසික ධර්මයෝ චිත්තසමුඨාන රූපයනට ද, මහාභූතයෝ උපාදාරූපයනට ද, චක්ෂුරායතනය චක්ෂුර්විඥානධාතුවට ද තත්සම්ප්‍රයුක්තයනට ද, ශෝත්‍රායතනය ශ්‍රෝත්‍රවිඥානධාතුවට ද තත්සම්ප්‍රයුක්තයනට ද, ඝ්‍රාණායතනය ඝ්‍රාණවිඥානධාතුවට ද තත්සම්ප්‍රයුක්තයනට ද, ජිහ්වායතනය ජිහ්වාවිඥානධාතුවට ද, තත්සම්ප්‍රයුක්තයනට ද, කායායතනය කායවිඥානධාතුවට ද තත්සම්ප්‍රයුක්තයනට ද, නිඃශ්‍රයප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

යම් (හෘදයවාස්තු) රූපයක් නිසා මනෝධාතුවත් මනෝවිඥානධාතුවත් පවතිත් නම්, ඒ රූපය මනෝධාතුවටත් මනෝවිඥානධාතුවටත් තත්සම්ප්‍රයුක්ත ධර්මයනටත් නිඃශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

**උපනිඃශ්‍රයප්‍රත්‍යය** යන්නෙහි තේරුම - පළමු පළමු කුසල්දහම්හු පැසිම් පැසිම් කුසල්දහම්නට උපනිඃශ්‍රයප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

පළමු පළමු කුසල් දහම්හු පැසිම් පැසිම් කිසි අකුසල් දහම්නට උපනිඃශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

පළමු පළමු කුසල් දහම්හු පැසිම් පැසිම් අව්‍යාකෘත ධර්මයනට උපනිඃශ්‍රයප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

පළමු පළමු අකුසල් දහම්හු පැසිම් පැසිම් අකුසල් දහම්නට උපනිඃශ්‍රයප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

පළමු පළමු අකුසල් දහම්හු පැසිම් පැසිම් ඇතැම් කුසල්දහම්නට උපනිඃශ්‍රයප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

පළමු පළමු අකුසල් දහම්හු පැසිම් පැසිම් අව්‍යාකෘත ධර්මයනට උපනිඃශ්‍රයප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

පළමු පළමු අව්‍යාකෘතධර්මයෝ පැසිම් පැසිම් අව්‍යාකෘත ධර්මයනට උපනිඃශ්‍රයප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

පළමු පළමු අව්‍යාකෘතධර්මයෝ පැසිම් පැසිම් අකුසල් දහම්නට උපනිඃශ්‍රයප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

සෘතුභෝජනය ද උපනිඃශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. පුද්ගලයා ද උපනිඃශ්‍රයප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. සෙනස්න ද උපනිාශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

**10. පුරෝජාතප්‍රත්‍යය** යන්නෙහි නිර්දේශය – චක්ෂුරායතනය චක්ෂුර්විඥනධාතුවට ද තත්සම්ප්‍රයුක්ත ධර්මයනට ද පුරෝජාතප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

ශ්‍රෝත්‍රායතනය ශ්‍රෝත්‍රවිඥනධාතුවට ද තත්සම්ප්‍රයුක්ත ධර්මයනට ද, ඝ්‍රාණායතනය ඝ්‍රාණවිඥාන ධාතුවට ද තත්සම්ප්‍රයුක්ත ධර්මයනට ද, ජිහ්වායතනය ජිහ්වාවිඥානධාතුවට ද තත්සම්ප්‍රයුක්ත ධර්මයනට ද, කායායතනය කායවිඥානධාතුවට ද තත්සම්ප්‍රයුක්ත ධර්මයනට ද, රූපායතනය චක්ෂුර්විඥානධාතුවට ද තත්සම්ප්‍රයුක්ත ධර්මයනට ද, ශබ්දායතනය ශ්‍රෝත්‍රවිඥාන ධාතුවට ද තත්සම්ප්‍රයුක්ත ධර්මයනට ද, රසායතනය ජිහ්වාවිඥාන ධාතුවට ද තත්සම්ප්‍රයුක්ත ධර්මයනට ද, ඵොට්ඨබ්බායතනය කායවිඥානධාතුවට ද තත්සම්ප්‍රයුක්ත ධර්මයනට ද, රූපායතන ශබ්දායතන ගන්ධායතන රසායතන ස්ප්‍රෂ්ටව්‍යායතන යන මොහු මනෝධාතුවට ද තත්සම්ප්‍රයුක්ත ධර්මයනට ද පුරෝජාතප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

යම් රූපයක් නිසා මනෝධාතුවත් මනෝවිඥානධාතුවත් පවතිත් නම්, ඒ රූපය මනෝධාතුවටත් තත්සම්ප්‍රයුක්ත ධර්මයනටත් පුරෝජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. ඒ රූපය මනෝවිඥානධාතුවටත් තත්සම්ප්‍රයුක්ත ධර්මයනටත් ඇතැම් විට පුරෝජාතප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ, ඇතැම් විට එසේ ප්‍රත්‍යය නො වේ.

**11. පශ්චාජ්ජාත ප්‍රත්‍යය** යන්නෙහි නිර්දේශය – පසු වැ පහළ වූ චිත්තචෛතසික ධර්මයෝ පළමුවෙන් උපන් මේ කයට පශ්චාජ්ජාතප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

**12. ආසේවන ප්‍රත්‍යය** යන්නෙහි නිර්දේශය – පළමු පළමු කුසල් දහම්හු පැසිම් පැසිම් කුසල් දහම්නට ආසේවන ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙත්. පළමු පළමු අකුසල් දහම්හු පැසිම් පැසිම් අකුසල් දහම්නට ආසේවනප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙත්. පළමු පළමු ක්‍රියාඅව්‍යාකෘත ජවන නාම ධර්මයෝ පැසිම් පැසිම් ක්‍රියා අව්‍යාකෘත ජවනනාමස්කන්ධයනට ආසේවනප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙත්.

**13. කර්මප්‍රත්‍යය** යන්නෙහි නිර්දේශය – කුශලාකුශල කර්ම විපාකස්කන්ධයනටත් කෘතත්වාද්‍රූපයනටත් කර්මප්‍රත්‍යය-යෙන් ප්‍රත්‍යය වේ

චේතනාව සම්ප්‍රයුක්තනාමධර්මයනට ද එයින් උපදනා රූපයනට ද කර්මප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.

**14. විපාකප්‍රත්‍යය** යන්නෙහි නිර්දේශය – විපාක වූ සතර අරූපිස්කන්ධයෝ උනුනට විපාකප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙත්.

**15. ආහාරප්‍රත්‍යය** යන්නෙහි නිර්දේශය – කබලීකාරාහාරය මේ රූප කයට ආහාරප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.

අරූපි ආහාරයෝ සම්ප්‍රයුක්තධර්මයනට ද එයින් උපදනා රූපයනට ද ආහාරප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙත්.

**16. ඉන්‍ද්‍රියප්‍රත්‍යය** යන්නෙහි නිර්දේශය -- චක්ෂුරින්‍ද්‍රියය චක්ෂුර්විඥාන ධාතුවට ද තත්සම්ප්‍රයුක්ත ධර්මයනට ද ඉන්‍ද්‍රියප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.

ශ්‍රෝත්‍රෙන්‍ද්‍රියය ශ්‍රෝත්‍රවිඥානධාතුවට ද තත්සම්ප්‍රයුක්ත ධර්මයනට ද ඉන්‍ද්‍රියප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.

ඝ්‍රාණේන්‍ද්‍රියය ඝ්‍රාණවිඥානධාතුවට ද තත්සම්ප්‍රයුක්ත ධර්මයනට ද ඉන්‍ද්‍රියප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.

ජිහ්වේන්‍ද්‍රියය ජිව්හාවිඥානධාතුවට ද තත්සම්ප්‍රයුක්ත ධර්මයනට ද ඉන්‍ද්‍රියප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.

කායේන්ද්‍රියය කායවිඥානධාතුවට ද තත්සම්ප්‍රයුක්ත ධර්මයනට ද ඉන්ද්‍රියප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

රූපජීවිතේන්ද්‍රියය කෘතත්වාදූපයනට ඉන්ද්‍රියප්‍රත්‍යය-යෙන් ප්‍රත්‍යය වේ.

අරූපි ඉන්ද්‍රියයෝ සම්ප්‍රයුක්තධර්මයනට ද එයින් උපදනා රූපයනට ද ඉන්ද්‍රියප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

**17. ධ්‍යානප්‍රත්‍යය** යන්නෙහි නිර්දේශය- ධ්‍යානාංගයෝ ධ්‍යානසම්ප්‍රයුක්තක ධර්මයනට ද එයින් උපදනා රූපයනට ද ධ්‍යානප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

**18. මාර්ගප්‍රත්‍යය** යන්නෙහි නිර්දේශය – මාර්ගාඞ්ගයෝ මාර්ගසම්ප්‍රයුක්තක ධර්මයනට ද එයින් උපදනා රූපයනට ද මාර්ගප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

**19. සම්ප්‍රයුක්තප්‍රත්‍යය** යන්නෙහි නිර්දේශය – සතර නාමස්කන්ධයෝ උනුනට සම්ප්‍රයුක්තප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

**20. විප්‍රයුක්තප්‍රත්‍යය** යන්නෙහි නිර්දේශය – රූපී ධර්මයෝ අරූපී ධර්මයනට විප්‍රයුක්තප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්. අරූපී ධර්මයෝ රූපීධර්මයනට විප්‍රයුක්තප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

**21. අස්තිප්‍රත්‍යය** යන්නෙහි නිර්දේශය – සතර නාමස්කන්ධයෝ උනුනට අස්තිප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

සතර මහා භූතයෝ උනුනට අස්ති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

පිළිසඳ ගන්නා කෙනෙහි නාමරූප දෙක එකක් අනෙකට අස්ති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙයි.

චිත්ත චෛතසික ධර්මයෝ චිත්තසමුත්ථාන රූපයනට අස්තිප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

මහාභූතයෝ උපාදාන රූපයනට අස්තිප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.

චක්ෂුරායතනය චක්ෂුර්විඥානධාතුවට ද තත්සම්ප්‍රයුක්ත නාමධර්මයනට ද අස්තිප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙත්.

ශ්‍රෝත්‍රායතනය ශ්‍රෝත්‍රවිඥානධාතුවට ද, තත්සම්ප්‍රයුක්ත නාමධර්මයනට ද, ඝ්‍රාණායතනය ඝ්‍රාණවිඥානධාතුවට ද, තත්සම්ප්‍රයුක්ත නාමධර්මයනට ද, ජිහ්වායතනය ජිහ්වාවිඥාන ධාතුවට ද තත්සම්ප්‍රයුක්ත නාමධර්මයනට ද, කායායතනය කායවිඥාන ධාතුවට ද, තත්සම්ප්‍රයුක්ත නාමධර්මයනට ද, රූපායතනය චක්ෂුර්විඥානධාතුවට ද තත්සම්ප්‍රයුක්ත නාමධර්මයනට ද, ශබ්දායතනය ශ්‍රෝත්‍රවිඥානධාතුවට ද තත්සම්ප්‍රයුක්ත නාමධර්මයනට ද, ගන්ධායතනය ඝ්‍රාණවිඥාන ධාතුවට ද තත්සම්ප්‍රයුක්ත නාම ධර්මයනට ද, රසායතනය ජිහ්වාවිඥානධාතුවට ද, තත්සම්ප්‍රයුක්ත නාම ධර්මයනට ද, ස්ප්‍රෂ්ටව්‍යායතනය කායවිඥානධාතුවට ද, තත්සම්ප්‍රයුක්ත නාමධර්මයනට ද, රූපායතන, ශබ්දායතන, ගන්ධායතන, රසායතන, ස්ප්‍රෂ්ටව්‍යායතන යන මේ හැම මනෝධාතුවට ද තත්සම්ප්‍රයුක්ත ධර්මයනට ද අස්තිප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙත්.

යම් රූපයක් නිසා මනෝධාතුවත් මනෝවිඥාන ධාතුවත් පවතිත් ද, ඒ රූපය මනෝධාතුවටත් මනෝ-විඥානධාතුවටත් තත්සම්ප්‍රයුක්ත ධර්මයනටත් අස්ති-ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.

**22. නාස්තිප්‍රත්‍යය** යන්නෙහි නිර්දේශය – අනන්තර වැ නිරුද්ධ වූ චිත්තචෛතසික ධර්මයෝ ප්‍රත්‍යුත්පන්න චිත්ත-චෛතසික ධර්මයනට නාස්තිප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙත්.

**23. විගතප්‍රත්‍යය** යන්නෙහි නිර්දේශය – අනන්තර වැ පහ වූ චිත්තචෛතසික ධර්මයෝ ප්‍රත්‍යුත්පන්න චිත්ත-චෛතසික ධර්මයනට විගතප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙත්.

**24. අවිගතප්‍රත්‍යය** යන්නෙහි නිර්දේශය – සතර අරූස්කන්ධයෝ උනුනට අවිගතප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙත්. සතර මහාභූතයෝ උනුනට අවිගත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙත්

අවක්‍රාන්තික්ෂණයෙහි නාමරූප දෙක උනුනට අවිගත-ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.

චිත්ත චෛතසික ධර්මයෝ චිත්තසමුත්ථාන රූපයනට අවිගතප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙත්.

මහාභූතයෝ උපාදරූපයනට අවිගතප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙත්.

චක්ෂුරායතනය චක්ෂුර් විඥාන ධාතුවට ද තත්සම්ප්‍රයුක්ත ධර්මයනට ද, ශ්‍රෝත්‍රායතනය ශ්‍රෝත්‍ර විඥාන ධාතුවට ද තත්සම්ප්‍රයුක්ත ධර්මයනට ද, ඝ්‍රාණායතනය ඝ්‍රාණවිඥාන-ධාතුවට ද තත්සම්ප්‍රයුක්ත ධර්මයනට ද, ජිහ්වායතනය ජිහ්වාවිඥානධාතුවට ද තත්සම්ප්‍රයුක්ත ධර්මයනට ද, කායායතනය කායවිඥානධාතුවට ද තත්සම්ප්‍රයුක්ත ධර්මයනට ද, රූපායතනය චක්ෂුර්විඥාන ධාතුවට ද තත්-සම්ප්‍රයුක්ත ධර්මයනට ද, ශබ්දායතනය ශ්‍රෝත්‍රවිඥානධාතු-වට ද තත්සම්ප්‍රයුක්ත ධර්මයනට ද, ගන්ධායතනය ඝ්‍රාණ-විඥානධාතුවට ද තත්සම්ප්‍රයුක්ත ධර්මයනට ද, රසායතනය ජිහ්වාවිඥානධාතුවට ද තත්සම්ප්‍රයුක්ත ධර්මයනට ද, ස්ප්‍රෂ්ටව්‍යායතනය කායවිඥානධාතුවට ද තත්සම්ප්‍රයුක්ත ධර්මයනට ද, රූපායතන ශබ්දායතන ගන්ධායතන රසායතන ස්ප්‍රෂ්ටව්‍යායතන යන මේ හැම මනෝධාතුවට ද තත්-සම්ප්‍රයුක්ත ධර්මයනට ද අවිගතප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

යම් රූපයක් නිසා මනෝධාතුවත් මනෝවිඥාන-ධාතුවත් පවතිත් නම්, ඒ රූපය මනෝධාතුවටත් මනෝවිඥානධාතුවටත් තත්සම්ප්‍රයුක්ත ධර්මයනටත් අවිගතප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.

**ප්‍රත්‍යයනිර්දේශය යි.**

# පදානුක්‍රමණිකා

## අ


අඤ්ඤමඤ්ඤපච්චයො 24, 80
අතිඉෂ්ටාලම්බන 12
අත්ථිපච්චයො 85
අධිපතිපච්චයො 76
අධිපතිප්‍රත්‍යයය 17
අධිපතිප්‍රත්‍යය නිර්දේශය 92
අධිමෝක්ෂය 59
අධ්‍යාත්මසන්තාන 68
අනන්තර 19
අනන්තරකර්ම 54
අනන්තරපච්චයො 77
අනන්තරප්‍රත්‍යයය 17, 93
අනන්තරෝපනිඃශ්‍රය 27
අනේකාන්තප්‍රත්‍යයෝත්-
පන්න 70
අන්‍යෝන්‍යප්‍රත්‍යය 24, 94
අප්පච්චය 55
අභිභවනාර්ථ 14
අයසකාන්ත 11
අරමුණුසහිතබව 19
අරූපාවචර සිත්හි
චෛතසික 64
අරූපාහාරප්‍රත්‍යයය 41
අජීර්ණාප්‍රාප්ත 48
අවිගතපච්චයො 86
අවිගතප්‍රත්‍යයය 51, 98
අසංඛත 55
අස්තිප්‍රත්‍යයය 50, 98


## ආ


ආධිපත්‍යාර්ථය 13
ආධ්‍යාත්මාහාර 41
ආධ්‍යාත්මික ප්‍රකෘතූප-
නිඃශ්‍රය 29
ආරම්මණපච්චයො 75
ආරම්මණපුරේජාතයෝ 54
ආලම්බන 10
ආලම්බනපුරෝජාත 33
ආලම්බනප්‍රත්‍යයය 10
ආලම්බනප්‍රත්‍යයනිර්දේශය 91
ආලම්බනෝපනිඃශ්‍රය 27
ආසෙවනපච්චයො 75
ආසේවනප්‍රත්‍යයය 35, 97
ආහාර 42
ආහාරජරූපකලාප 68
ආහාරපච්චයො 83
ආහාරප්‍රත්‍යයය 41, 97


## ඉ


ඉත්ථින්ද්‍රිය 44
ඉන්ද්‍රිය 44
ඉන්ද්‍රියකෘත්‍යය 45
ඉන්ද්‍රියපච්චයො 84
ඉන්ද්‍රියප්‍රත්‍යයය 43, 97


## උ


උද්ධච්චසම්ප්‍රයුක්ත සිතේ
චෛතසික 61
උපනිධ්‍යායන 46

උපනිස්සයපච්චයො 81
උපනිඃශ්‍රයප්‍රත්‍යය 27, 31, 95
උපස්තම්භක කෘත්‍යය 44

ඍ

ඍතුජරූපකලාප 67

එ

එල්බීම 11
ඒකාග්‍රතා 47
ඒකාන්තප්‍රත්‍යය 71
ඒකාන්තප්‍රත්‍යයෝත්පන්න 70
ඒකීභාවයට පැමිණියේ 49

ක

කම්මපච්චයො 83
කර්ම 39
කර්මජරූපකලාප 66
කර්මපථප්‍රාප්ත 48
කර්මප්‍රත්‍යය 37, 97
කලාපමුක්තයෝ 68
කල්‍යාණචෛතසික 62
කල්‍යාණමූලකචෛතසික 63
කාමශෝභනවිපාක අටෙහි චෛතසික 64
කාමාවචර කුසල් සිත්හි චෛතසික 63
කායකර්ම 46
කායවිඤ්ඤාණධාතු 57
කායාග්නි 66
කුඩා සහජාත 53

ඝ

ඝාණවිඤ්ඤාණධාතු 57

ච

චක්ඛුවිඤ්ඤාණධාතු 57
චිත්තජරූපකලාප 66
චිත්තාචාරරසය 7
චෛතසික රාශි 57

ඡ

ඡන්ද - ලෝභ 15
ඡන්දය 59

ජ

ජිව්හාවිඤ්ඤාණධාතු 57
ජීවනකෘත්‍යය 44
ජීවිතනවක 66

ඣ

ඣානපච්චය 84

ද

ද්වේෂචතුෂ්ක 61
ද්වේෂමූලක සිත්හි චෛතසික 62

ධ

ධ්‍යාන 46
ධ්‍යානප්‍රත්‍යයය 46, 98
ධ්‍යානාඞ්ග සත 46

න

නත්ථිපච්චයො 86
නාමජීවිතේන්ද්‍රියය 44
නානාක්ෂණික 38
නානාක්ෂණිකකර්මප්‍රත්‍යය 37
නාස්තිප්‍රත්‍යයය 51, 98

නිමිත්තාවස්ථා (කර්මයේ) 40
නිර්වාණ 55
නිස්සන්දපච්චයුප්පන්න 70
නිස්සයපච්චයො 80
නිඃශ්‍රයප්‍රත්‍යය 25, 95

**ප**

පකතූපනිස්සය 27
පච්ඡාජාතජාතික 54
පච්ඡාජාතපච්චයො 83, 34
පට්ඨාන 70
පරිවාස 35
පශ්චාජ්ජාතප්‍රත්‍යය 34, 96
පශ්චිමචිත්ත 21
පාවකාග්නි 66
පුරිමචිත්ත 21
පුරිසින්ද්‍රිය 44
පුරේජාතපච්චය 33
පුරේජාතපච්චයො 82
පුරෝජාත 34, 25
පුරෝජාතජාතික 53
පුරෝජාතප්‍රත්‍යය 33, 96
පුරෝජාතේන්ද්‍රිය 43
පෝරිසාද 13
ප්‍රගුණභාවය 35
ප්‍රකීර්ණක චෛතසික 59
ප්‍රකෘත්‍යුපනිඃශ්‍රය 27
ප්‍රතිසන්ධික්ෂණය 6
ප්‍රතීත්‍යසමුත්පන්න 56
ප්‍රත්‍යය 6, 10
ප්‍රත්‍යයකෘත්‍යය (ත්‍රිවිධ) 44
ප්‍රත්‍යයඝටනාව 56
ප්‍රත්‍යයසභාගසංග්‍රහ 53
ප්‍රත්‍යුත්පන්නප්‍රකෘත්‍යුප
නිඃශ්‍රය 29
ප්‍රදේශදශක 66
ප්‍රවෘත්තිකාලය 6
ප්‍රීතිය 47, 59

**බ**

බාහිරසන්තාන 68
බාහිරාහාර 41

**භ**

භුම්මන්තරප්පත්ත 48

**ම**

මග්ගපච්චයො 84
මධ්‍යසහජාත 53
මනඉන්ද්‍රියය 44
මනඃකර්ම 46
මනෝධාතු 57
මනෝපුබ්බඞ්ගම 24
මනෝවිඤ්ඤාණධාතු 57
මහාසහජාත 53
මාර්ග 47
මාර්ගප්‍රත්‍යය 47, 98
මාර්ගාඞ්ග 47
මිථ්‍යාආජීව 47
මිථ්‍යාකර්මාන්ත 47
මිථ්‍යාවචන 47
මුඛ්‍ය ප්‍රත්‍යයෝත්පන්න 70
මෛත්‍රෙය 28
මෝහචතුෂ්ක 61
මෝහවිවේකසුඛ රසය 9

**ර**

රූප 64
රූපකලාප 65
රූපජීවිතින්ද්‍රිය 53
රූපජීවිතේන්ද්‍රියප්‍රත්‍යය
43, 44
රූපාවචර සිත්හි
චෛතසික 65
රූපාහාර 53
රූපාහාරප්‍රත්‍යය 41

## ල

ලෝකුත්තර සිත්හි චෛතසික 64
ලෝභත්‍රික 61
ලෝභමූලක සිත්හි චෛතසික 61
ලෝභවිවේකසුඛරසය 9

## ව

වත්ථාරම්මණපුරේජාත 54
වත්ථුපුරේජාතයෝ 53
වාක්කර්ම 46
වාසතුපුරෝජාත 33
වාසතුපුරෝජාතනිඃශ්‍රය 25
වාස්තවාලම්බනපුරෝජාත 33
විගතපච්චයෝ 86
විගතප්‍රත්‍යයය 51, 98
විචාරය 47, 54
විචිකිච්ඡාසම්පයුත්ත සිතෙහි චෛතසික 6
විතර්කය 47, 59
විපාකපච්චයෝ 84
විපාකප්‍රත්‍යයය 39, 97
විපාකාවස්ථා 40
විප්පයුත්තපච්චයෝ 84
විප්‍රයුක්තප්‍රත්‍යයය 50, 98
විවේක 9
විසූංතික 61
වීර්ය 59
වෙසෙසින් පැසීම 39
වේදනා 47

## ශ

ශෝභන චෛතසික 62
ශෝභන සිත් 62

## ස

සඞ්ඛත 56
සප්‍රත්‍යය 55, 56
සමනන්තරපච්චයෝ 78
සමනන්තරප්‍රත්‍යයය 20, 94
සම්පයුත්තපච්චයෝ 48, 84
සම්ප්‍රයුක්ත 49
සම්ප්‍රයුක්තප්‍රත්‍යයය 48, 98
සර්වචිත්තසාධාරණ චෛතසික 58
සර්වචිත්තසාධාරණ ප්‍රත්‍යයයෝ 57
සර්මූලකලාප 65
සර්මූලාෂ්ටක 65
සහජාතකර්මප්‍රත්‍යයය 37
සහජාතප්‍රත්‍යය 22, 94
සහජාතජාතිකයෝ 53
සහජාතනිස්සය 25
සහජාතපච්චයෝ 80
සහජාතප්‍රත්‍යයය 22
සහජාතරූපකලාප 6
සහජාතාධිපතිප්‍රත්‍යය 13
සහජාතේන්ද්‍රිය 43
සහෝත්පාදනාවී 14
සංස්කෘත 56
සාධාරණප්‍රත්‍යය 57
සුතසෝමජාතක 13
සෝතවිඤ්ඤාණධාතු 57

## හ

හේතු 5
හේතුපච්චයෝ 75
හේතුප්‍රත්‍යයය 5
හේතුප්‍රත්‍යයනිර්දේශය 91

